
සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම


ශ්‍රී බු. ව. 2557ක් වූ බිනර මස (ව්‍යවහාරික වර්ෂ 2013 සැප්තැම්බර්)

23 වෙනි කලාපය

## පස් පොළක් නීව කළ හෙළයේ මහා වංශ කතාව...



සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය



# එදා අපි...

වැවයි දාගැබයි පන්සල එකතු කළ
ගමයි එදා තිබුණේ දිවියකට හෙළ
මවයි දහම් සිතිවිලි මුළු දවස තුළ
සුවයි ගත සිතට එදවස නැගුණු එල

සරලව ගෙතුණු රෙදි කඩ විය ඇඟ ඇඳුම
හර ඇති සළු පිළිද කය නොම කළ රිදුම
ඉර නැග එන විටදි තෙරුවන් කර පිදුම
උරනුර ගැටී උන් වැඩ කළ හැටි පුදුම

කොස් දෙල් පොළොස් රතු හාලේ බතට ගෙනා
කුස් පිරවුමෙන් දවසෙම ගත සවිය වුණා
වැස්සුව අහස් දිය ගෙන වැව් පොකුණු තනා
ගස් වැල් වවා සුව දුනි පෙර ගිටපු දනා

සීමා වැට කඩොළු බැඳගෙන නොමැති බිමේ
බෝමා හොඳින් කල් ගෙවූ පෙර පිරිස ගමේ
තේමා ගෙනා සාමය සහ සමගි කමේ
කෝමා කියන්නද ගුණ අද නොමැත ඉමේ

සතුනට කන්න කෙලවර පොල් කටු බැයේ
නෑතුවට රස බොජුන් බත් එළවළු වූයේ
මතුවට කන්න සෑහෙන වී මළු යායේ
පැතුමට අනුව අස්වනු විය එක හීයේ

රන් මෙන් දිලුණු වී අටු කොටු තිබූ නිවසේ
පැන්තාලියේ දිය අඩු නොම විය දවසේ
ගෙන් ගෙට දනට බර බත බුලතද ගැවසේ
තුන් සරණයයි ආවේ මුවගට සුවසේ

ජන කවි ගීතයෙන් රැව් දුන් පැල් හේනේ
බණ දම් හඬයි ඇසුණේ පදයක් ගානේ
එන විට සඟුන් පෙළ බැතියෙන් දුන් දානේ
පින ගෙන දෙයි නිවන් පෙනෙනා තෙක් මානේ

පැරකුම් දුටුගැමුණු මහසෙන් පෙර කාලේ
ගුරුකම් දැනන් කළ ගොවිතැනටම ආලේ
සුරුකුම් කරන් මතු එන නියගෙට තාලේ
විරුකම් කළා කෝ ඒ රජවරු රාලේ

පබැඳුම - හිහිඳු චන්දන සිරිවර්ධන

# බුදු දහම නිර්මල වන්නේ කෙසේද?



බුදු දහම ගැන කතා කරන කොට පොදුවේ ඊට කලින් නිර්මල කියල වචනයක් යොදනවා. වෙන කිසිම ආගමකට, දර්ශනයකට සාමාන්‍යයෙන් මෙහෙම වචනයක් යොදන්නෙ නෑ. කොටින්ම නිර්මල කිතුනු දහම, නිර්මල ඉස්ලාම් දහම, එහෙම නැත්නම් නිර්මල හින්දු දහම කියල දෙයක් අහන්නවත් නෑ. බුදු දහමට විතරයි මෙහෙම විශේෂණ පදයක් භාවිතා කරන්නෙ. ඇයි මේ බුදු දහමට විතරක් මේ වගේ විශේෂණයක් යොදන්නෙ? බෞද්ධයෙක් කියන්නෙ ආවට ගියාට වැඩ කරන කෙනෙක් නෙවෙයි. දෙයක් කරනව නම්, කියනව නම්, ඇයි එහෙම කරන්නෙ කියල හේතු කියන්න පුළුවන් කෙනෙක්. මේ හේතුවෙන් තමයි මම ඒක කළේ, එහෙම නැත්නම් මේ ඵලයට මුල මෙන්න මේ හේතුවයි කියල පැහැදිලි කරල දෙන්න පුළුවන් කෙනෙක්. ඉතින් කවුරු හරි අපෙන් ඇහුවොත්, ඇයි නුඹලා බුදු දහමට විතරක් නිර්මල කියල වචනයක් භාවිතා කරන්නෙ, අපිට ඒක තෝරල දෙන්න පුළුවන්ද කියල, මොකක්ද අපි දෙන උත්තරය?

මුලින්ම වචනය තෝර ගෙන ඉන්න ඕන. මළ කියන වචනයෙන් එන මැරුණු කියන තේරුම එක පැත්තක්. එතකොට නිර්මල කියන්නෙ නොමළ හෙවත් අමරණීය කියන එක. මැරෙන්න නම් ජරාවට පත්වෙන්න ඕන. ජරාවට පත් නොවෙන දෙයකට විනාශය, මරණය එන්නෙ නෑ. එතකොට ජරාවක් නෑ. ජරාවකුත් නැති, මරණයකුත් නැති, එහෙම නැත්නම් අජරාමර කියන අර්ථයෙන් නිර්මල කියන්න පුළුවන්. එතකොට අජරාමර දෙයක් තියෙනවා. ඒ තමයි නිවන. ඒ නිවන නිර්මලයි. ඒක කියල දෙන දහමක් තියෙනව නම් ඒ නිර්මල දහමක්. එහෙම කියල දෙන එකම දහම තමයි බුදු දහම. ඉතින් ඒ හේතුවෙන් නිර්මල බුදු දහම කියල කියනවා. මේ එක පැත්තක්.

ඊළඟට මළ කියල තවත් එකකට භාවිතා කරනවා. උදාහරණයක් විදිහට යකඩයක් දිරාපත් වෙන්න ඉස්සෙල්ල ඒක උඩ බැඳෙන ද්‍රව්‍යයටත් මළ කියල කියනවා. තැඹිලි රත්රන් පාටට හුරු දෙයක් බැඳෙන කොට, දැන්නම් යකඩෙ විනාශයට ළං වෙලා කියල දැන ගන්නවා. ඒ යකඩය බාහිර ජල වාෂ්ප වගේ දේවල් එක්ක එකතු වෙලා, ඒ තුලින්ම නිෂ්පාදනය කරගන්න දේ නිසා එහිම විනාශය කරා යනවා. ඒක සුද්ධ කළේ නැත්නම් ඒ යකඩය ඉවරයි. සුද්ධ කළාට පස්සෙ ඒ යකඩෙ මළ නෑ, එතකොට නිර්මල යකඩෙ විනාශය තාවකාලිකව හරි නවතිනවා.

ඒ වගේ තමයි ලෝක සත්වයා බාහිර රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ නිසා තමන් තුලින් නිෂ්පාදනය කරන මළක් තියෙනවා. ඒකෙන් තමන්ම නොදැනී විනාශ වෙනවා. කෙනෙක් බාහිර දේකට ඇලෙනවා. ඒක එක මළක්. ඒකට කියන්නෙ **රාග මළ** කියල. ඒ ඇලීමට විරුද්ධව එන දේට ගැටෙනවා. ඒකත් මළක්. ඒ **ද්වේශ මළ. කෙනෙකුට තරහ ගියාම මළ පනිනව කියල අදත් සමාජයේ කතා වෙනවා.** මේ මළ කියන්නෙ ද්වේශය. මේ ඇලීම හා ගැටීම දැකල, ඒක වැටහෙන්නෙ නැතුව තව තවත් ඇලෙන්න ගැටෙන්න යන මානසික ස්වභාවයක් තියෙනවා. ඒක තුන්වෙනි මළ. ඒ තමයි **මෝහ මළ.** ඒ නිසා ආර්ය විනයේ ඇලීම හෙවත් රාගය මළක්, ගැටීම හෙවත් ද්වේශය මළක්, මේ දෙකට යොමු කරන මෝහය මළක් කියල හඳුන්වනවා. මේ රාග, ද්වේශ මෝහ නැති කරන ක්‍රමයක්, ඒ කියන්නෙ වීතරාග, වීතදෝශ, වීතමෝහ වෙන්න අනුගමනය කළ යුතු වැඩ පිළිවෙලක්, මාර්ගයක් තියෙනවා. ඒ මාර්ගය තමයි බුදු දහම. ඒ නිසාත් නිර්මල බුදු දහම කියල  කියනවා. ඒ කියන්නෙ අර රාග, ද්වේශ, මෝහ ක්ෂය කරන අර්ථයෙන්.

රාග, ද්වේශ, මෝහවලට මළ කියන්නෙ ඇයි? කොහොමද අර යකඩය විනාශ වුනා වගේ තමන් විනාශ වෙන්නෙ? දැන් කෙනෙකුට මෙහෙම ප්‍රශ්නයක් එන්න පුළුවන්. ඒ වගේම බුදු දහමෙ එහෙම මාර්ගයක් තියෙනව කියල කියන්නෙ කොහොමද කියන ප්‍රශ්නයත් එන්න පුළුවන්. මේ ගැන ත්‍රිපිටක මූලාශ්‍රයක් අරගෙන බැලුවොත්,

විමලො භූරි මෙධසො ''විමලො'' යනුः රාගය මලයෙක ද්වේෂය මලයෙක මෝහය මලයෙක, හැම අකුශලාභි- සංස්කාරයෝ මලයෝ යි. ඒ මලයෝ භාග්‍යවත් බුදුන් විසින් ප්‍රහීණයහ මුලසුන් කරන ලදහ මුල් උදුළ තල්වත්තක් සෙයින් කරන ලදහ අනුඅභාවය කරන ලදහ. (එහෙයින්) ආයතිභවයෙහි නූපදනා පියවි ඇතියහ. එයින් බුදුහු අමලය, විමලය, නිර්මලය, කස වු මල ඇතියහ, වෙසෙසින් ප්‍රහීණ වූ මළ ඇතියහ, මළයෙන් විප්‍රමුක්තයහ, මළයන් ඉක්මවූහ.....

චුල්ලනිද්දේස පාලි (91 පාරයණානුගීති නිර්දේශය) 427 පිටුව

දැන් කොහොමද කියන්නෙ බුදු දහමින් පමණක් මේ මළ අයින් කරන්න පුළුවන්, එහෙම නැත්නම් අපිටත් නිර්මල වෙන්න පුළුවන් කියල? ඒ වගේම මේ රාග, ද්වේශ, මෝහ නිසා තමන් විනාශ වෙනව කියන්නෙ කොහොමද? ''මම හරි සතුටින්නෙ ඉන්නෙ, මට ඕන ඕන විදිහට මම ආස්වාද ලබනවා. මම රාගයෙන් ඇලෙනවා. ඉතින් මම ඒකෙන් විනාශ වෙන්නෙ කොහොමද? ඒකෙන් අයින් වීම සුවදායක වෙන්නෙ කොහොමද?'' මේ විදියට කෙනෙක් ආදරයෙන් තමන්ගෙ ඔළුව අතගාන කොට ඒක කොච්චර සනීපද, ඒකෙන් දුකක් එන්නෙ නැනෙ, සැපක්නෙ එන්නෙ, ඒකට ඇලෙන එකේ වැරැද්දක් තියෙනවද කියල හිතෙන්න පුළුවන්. මේ කාරණය උදාහරණයකින් පැහැදිලි කර ගනිමු.

කෙනෙක් කැමතිම ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් ඉන්නවා. මුලින්ම බලන්න ඕන ඇයි ඒ ස්ත්‍රියට හෝ පුරුෂයාට කැමති කියල. අන්න ඒ හේතුව මුලින්ම හොයා ගන්න ඕන. ඇයි ඔබ ඒ පුද්ගලයට කැමති, මොකක්ද එයාගෙ විශේෂත්වය කියල ඇහුවොත්, කොහොම උත්තරයක් දෙයිද? ''බලන්නකො එයාගෙ ලස්සන! අහවල් නිළිය වගේ, එහෙම නැත්නම් අහවල් නළුව වගේ හරිම ලස්සනයි. මේ වගේ තමන්ට පිටින් පේන ඔපය ගැන විස්තර කරනවා. නමුත් විරූපී ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් පෙන්නල ඇහුවොත්, ඇයි එයා හොඳ නැද්ද කියල, අපෝ එයාගෙ හැටි බලන්නකෝ! මට පුළුවන්ද එයත් එක්ක ඉන්න... මේ ආදී දේවල් කියනවා. අවංකවම තමන් තුලින් හිතල බැලුවොත් කාරණය ඇත්ත. අපි ප්‍රිය මනාප දේට තමයි ඇලිල ඉන්නෙ. අප්‍රිය අමනාප දේවල් දිහා බලන්නවත් කැමති නෑ. දැන් ඒ ප්‍රිය මනාප කෙනා නිකන්ම අපිට ලැබෙයිද? උත්සාහයක්, වීරියක් කරන්න ඕන නැත්ද ? ''අපෝ නෑ, මම මේ උදෙන්ම නැගිටල ඉක්මනට ඉක්මනට යන්නෙ එයා යන වෙලාව බලල නැත්නම් මග හැරෙන්න පුළුවන්'' දැන් ඉතින් ඒ පුද්ගලයට ඇලිල මග හැරෙන නිසා වේලපහින් යන්න ඕන. ඒකට වේලපහින් නැගිටින්න ඕන. වැඩ ටික ඉක්මනට කරන්න ඕන. කරන කියන වැඩ සේරම අර ස්ත්‍රිය හෝ පුරුෂයා බලන්නයි කරන්නෙ. පොඩි අතපසු වීමක් ආවොත් එතන පිච්චෙනවා, බස් එක පරක්කු වුනොත් දැන් පපුව ඇතුලෙ පිච්චෙනවා. අනේ එයා යයිද, මග හැරෙයිද වගේ දේවල් හිත ඇතුලෙ වද දෙනවා. ඉතින් මේ ටික දුකක් ද, සතුටක් ද කියල ඇහුවොත් මොකක්ද දෙන උත්තරේ? ''දුක තමයි මොනව කරන්නද? එයා මග හැරුනොත් ඒ වගේද?'' දැන් මේ දුක් දාහයන් සේරම විඳගෙන බස් එකේ පොර කාල, රණ්ඩු වෙලා ආව කියල හිතමු. දැන් අර හිත ගිය කෙනා, ඇලුන කෙනා, රාගයෙන් බැඳුන කෙනා ඉන්නවා. දැන් සතුටක් එනවා, අර වින්ද දුක මතක නැතුව යනවා. විනාඩියක් දෙකක් යන කොට ඒ ස්ත්‍රිය හෝ පුරුෂයා යන බස් එක ඇවිත් යන්න යනවා. දැන් බලන්න ගිය කෙනා තනියම. දැන් මොකක්ද වෙන්නෙ? නැවතත් හෙටත් බලන්න ඕන කියන සිතිවිල්ල උඩ පිච්චි පිච්චි ඉන්නවා. ඒ ස්ත්‍රිය හෝ පුරුෂයා ගැන කිසිම විස්තරයක් දන්නෙත් නෑ. දැකපු රූපයට වශී වෙලා, කැමැත්තෙන් බැඳිල සිහින මාලිග මවනවා. මනස තුල ඒකම බලවත් වෙලා, වෙනත් කරන කියන දේ ගැන නිච්චියක් නැතුව යනවා. හැම වැඩක්ම කරන්නෙ, හෙට කොහොම හරි කතා කරනවා, නැත්නම් ඊට කලින් වේලාසනින් යනව කියන හැඟීමෙන්. අර විනාඩි දෙක තුනක ආස්වාදයට මුළු දවස පුරාම රෑ නින්ද නැතුවත් එක එක දේවල් කල්පනා කරනවා. මේක දුකක්, තමන් තුල පිච්චීමක් ඇති වෙනව කියල වැටහෙන්නෙ නෑ. ඒ තරම්ම ඒකට ඇලිල.

දැන් නැවතත් ඊට පහුවදා අර විදිහටම බලන්න යනවා. අර ඇලුන කෙනාව දකිනවා. නමුත් ඒ කෙනා දැන් ඉන්නෙ තනියම නෙවෙයි, තවත් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් එක්ක. ඒ දෙන්න හිනා වෙවී කතා කර කර හරි සතුටින් ඉන්නවා. දැන් අර බලන්න ආපු කෙනාට මොනව හිතෙයිද? කවුද අර කතා කර කර ඉන්නෙ? දැන් නැවතත් හිත ඇතුලෙ දැවෙනවා, තැවෙනවා. ''මට ඕකිව මරන්න හිතයි, අරුව මරන්න හිතයි.'' මනස දැන් කලින් ඇසුරු කළ රාගය වෙනුවට දෙවෙනි ඇසුරකට ඇවිත්. කොටින්ම කියනව නම් තරහක්, ද්වේශයක් ඇවිත්. මේ ද්වේශය කලින් තිබ්බ්ච එකක්ද? නෑ. ඊයෙ තිබුනෙ නෑ. එතකොට එක පාරටම අද ආවෙ කොහොමද? තමන් බැඳුන දේට, එහෙම නැත්නම් කැමති දේට විරුද්ධ යමක් විද්‍යමාන වෙලා. තමන්ට තරඟයක් වෙන කෙනෙක් ඇවිත්. ඒ නිසා අලුතින් සිතිවිලි නැගෙන්න පටන් අරගෙන. තරඟකාරී ස්වභාවයක් හිතට ඇවිත්. ඕක බලවත් වේගෙන එනකොට මොන අසාධාරණයක් කරල හරි ඒ තැන ගන්න තරමට මානසිකත්වය දරුණු වෙනවා. ''මට හිතෙනවා පිහියක් අරගෙන ගිහින් අනින්න. හිනාවෙන හැටි විතරක්.!'' මේ වගේ දහසක් දේවල් හිතට එනවා.

මේ විදිහට ලෝබයෙන් බැඳීම, ඒ වගේම ඒ බැඳුන දේට විරුද්ධව එන දේට ගැටීම කියන මේ සේරම ගැනෙන්නෙ අකුසල මූලයන්ට. සරලව කියනව නම් පවු කරන පැත්තට මුල් වෙන දේවල්. දැන් ඕනම අසාධාරණයක් කරන තත්වෙට වැටෙනවා. තමන් ඒ ඇලුන බැඳුන දේ ලබා ගන්න කරන උත්සාහය නිසා, ඊළඟට කරන කියන දේ වැටහෙන්නෙ නෑ. අනේ මං වගේ පවුකාරයෙක්, පවුකාරියක් කියල පැත්තකට වෙන අයත් ඉන්නවා. ඒ අයත් ඉතින් කරන කියන දේවල් අතපසු කරගෙන හූල්ල හූල්ල ඉන්නවා. ඒ අයත් වෙන පැත්තකින් විනාශය කරා යනවා. දැන් ටිකක් නාහෙට අහන්නෙ නැති කෙනෙක් නම් මොකද කරන්නෙ? මොකක් හරි ආයුධයක් ගත්ත, ඇනල හරි අර විරුද්ධව ආපු දේ අයින් කරන්න පෙළඹෙනවා. දැන් එහෙම අයින් කළා කියල ගැලවීමක් තියෙනවද? නීතියට අහුවුනාම මොකද වෙන්නෙ? ඒ ජීවිතයම ඉවරයි. ඊළඟට පරලොව ජීවිතයත් ඉවරයි. මේ තමයි තමන් තුලින් ආපු සිතිවිලි විනාශය කරා ගෙනියන හැටි. ඒ ඇලීම තමන්ට ඕන විදිහට පවත්වන්න පුළුවන් තාක් එහෙම ආස්වාද විඳගෙන ඉන්නවා. බැරිවුන ගමන් සේරම අනෙක් පැත්ත ගහනවා.

ඒ නිසා තමයි බුදුපියාණන් වහන්සේ, **මේ මන වඩන දේවල්වල තියෙන භයානකකම** පෙන්නුවෙ. ඇයි භයානකයි කිව්වෙ කියල දැන් වැටහෙන්න ඕන. අප්‍රිය අමනාප දෙයක් නම් අපි පැත්තවත් බලන්නෙ නෑ, කිසි ප්‍රශ්නෙකුත් නෑ. මේ ප්‍රිය මනාප දේටමයි බැඳෙන්නෙ. දැන් තව ප්‍රශ්නයක් එන්න පුළුවන්, ඇයි අපි ප්‍රිය මනාප දේට බැඳෙන්නෙ, නිකන් ඉන්න පුළුවන්නෙ කියල. අවංකවම කෙනෙකුට එහෙම ඉන්න පුළුවන්ද? ඒකට ක්‍රමයක් තියෙනවද? එහෙම ක්‍රමයක් අපේ අත්දැකීම් තුලම තියෙනවා. සසර පුරා මනස මොට කරගෙන, ඒවම ඇසුරු කර කර, ඒවම පත පතා ආපු නිසා පේන්නෙ නෑ. ''කමක් නෑ, දැන් බැරි වුනාට පස්සෙ බලමු, එයා නැතත් වෙන කෙනෙක් ඉදියිනෙ.'' දැන් මෙහෙම මතු මතුත් බලාපොරොත්තු ඇති කරගන්නවා. තව තව ඒවට සිතින්, කයෙන්, වචනයෙන් සංඛාර ගොඩ නගනවා. ඒත් ඉතින් මෙච්චර දුක් විඳගෙනත් ඇයි ඒව පස්සෙම යන්නෙ? තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන්. එහෙම යන්නෙ ආස්වාදයක් තියෙන නිසා. එහෙම නැතුව, මේ ඇසුරු කරන හැම දේකින්ම එන්නෙ දුකක් විතරක් නම්, අපි මතු ගොඩනගන්න ප්‍රාර්ථනා කරයිද? ඒවා පස්සෙ දුවයිද?

උදාහරණයක් විදිහට මෙහෙම හිතුවොත් ; පොඩි ළමයෙක් ඉන්නවා. ඒ ළමය ගෙදර එන එන සැරේට වේවැලකින් ගහනවා. ඉතින් මේ පොඩි එකා හොඳටම රිදිල අඬනවා. ඊට පස්සෙ ඔලුව අතගාල ඇපල් ගෙඩියක් දෙනව කාපන් ☞

කියල. දූන් රස කර කර කනවා. දැන් මේ ළමය නැවතත් ඊළඟ දවසෙත් ගෙදර එනවා. නැවතත් අර විදිහටම ගහල අඬනකොට ඇපල් ගෙඩියක් දෙනවා. දැන් මේ ළමය ගෙදර එන එක දිගටම කරයිද, නවත්වයිද? ඒ ළමයට ගන්න තීරණ දෙකක් තියෙනවා. එක්කො ඇපල් ගෙඩිය එපා කියල ගෙදර එන්නෙ නැතුව ඉන්න පුළුවන්. එතකොට අර වේවැලෙන් ගුටි කාල වින්ද දුකත් නෑ. එහෙම නැත්නම් වේවැලෙන් ගැහුවට මොකද, ඇපල් ගෙඩියක් ලැබෙනවනෙ, ඒක කොච්චර රසද කියල නැවත එන්නත් පුළුවන්. අර රසයට ගිජු වෙලා කොච්චර ගුටි කෑවත් කමක් නෑ කියල හැමදාම එන්න පුළුවන්. ඉතින් අපේ සසර ගමනත් අර පොඩි ළමය දෙවනියට ගත්ත තීරණය වගේ. ආස්වාදයට ගිජු වෙලා, කොච්චර දුක් වින්දත් කමක් නෑ කියල නැවත නැවතත් එනවා. ''දැන් දුක් වින්දට කමක් නෑ, පස්සෙ සැප විඳින්න පුළුවන්නෙ.'' මේ තමයි පොදු මානසිකත්වය.

දැන් මේ සිද්ධිය තේරුම් ගත්ත කෙනෙක් ඉන්නව කියල හිතුවොත්, ඒ පුද්ගලය අර පොඩි එකාට කතා කරල කාරණය මේ විදියට තේරුම් කරල දෙනවා. ''මේ ළමයො බලපන් උඹේ ඇඟ දිහා කොච්චර පලු දාලද? අල්ලනකොටත් රිදෙනව නේද? ඔහොම දුකක් විඳගෙන අර ඇපල් ගෙඩිය කාල වැඩක් තියෙනවද? ඒක උඹ කෑව කියල කියමුකෝ... කනකොට රස තමයි. දැන් කෝ ඒ ඇපල් ගෙඩිය? කාල ඉවරයි නේද? ඒත් උඹ වේවැලෙන් ගුටි කාපු පාරවල් තාම පුපුරු ගහනව නේද? ඉතින් මෙච්චර දුකක් විඳල පොඩි වෙලාවක රසයක් ගන්න එකේ තේරුමක් තියෙනවද?'' දූන් මෙහෙම ඇහුවොත් මොන වගේ උත්තරයක් ඒ ළමය දෙයිද? තේරුම් ගන්න පුළුවන් මොළයක් තියෙන කෙනෙක් නම් මොකක් කියයිද? ''ඇත්ත නේන්නම් ඇපල් ගෙඩිය කන්න මට විනාඩි කීයද ගියේ! ඒත් මේ ගුටි කාපුවා තාම පුපුරු ගහනවනෙ! මම ඒ පොඩි මොහොත හරි වටිනවා, හොඳයි කියල ගත්ත නිසානෙ ඒක ඉවර වෙලත් දුක් විඳින්නෙ!'' දූන් මෙහෙම හිතුනොත්, අවංකව අවබෝධ වුනොත් නැවතත් ඒ ගෙදර පැත්ත පලාතෙ යයිද? පුපුරු ගහන තුවාල ටික සනීප වුනාම නැවතත් වේවැල් පාර නැති නිසා අර විඳපු අප්‍රමාණ දුක ඉවරයි.

අපිත් සසර ගමන එන්නෙ මෙන්න මේ වගේ. අර කාපු වේවැල් පාරවල් වගේ **අනන්ත සංසාරෙ පංච කාම භුක්තිය විඳින්න ගිහින් කාපු පාරවල් තාම පුපුරු ගහනවා. ඒත් ආස්වාද පස්සෙ දුවනවා. ගුටි කකා නොයෙක් ආකාරයේ අප්‍රමාණ දුක් විඳගෙන, රාගය නිසා ඇලිල ඊට විරුද්ධව එන දේට ගැටෙනවා.** ඒ දෙකම හොඳයි කියල මෝහයෙන් ගන්නවා. තමන්ගෙ විනාශය කරා දන්නෙම නැතිව ගමන් කරනවා. මේ තමයි තමන්ව විනාශ කරන මළ. ඉතින් අර ළමයට ඇත්ත පෙන්නල දුන්න වගේ, ලෝක සත්වයාටත් මේ කාරණය පෙන්වා දුන්න මහ උත්තමයෙක් ලෝකෙට පහළ වුනා. ඒ තමයි සම්මා සම්බුදුපියාණන් වහන්සේ. උන්වහන්සේ අප්‍රමාණ සංසාරයේ, අප්‍රමාණ කාලයක් පාරමිතා ධර්මයන් පූර්ණ කරගෙන ලබාගත් මහා ඥානයෙන්, මේ කියන ආස්වාදය අස්සෙ හැංගුණ ආදීනවය පෙන්වා දුන්නා. ඒ සඳහා දහමක් කියා දුන්නා. ඒ දහම තුල මේ සැඟවිච්ච ආදීනවය, දුක පෙන්වන න්‍යාය ධර්මයක් දේශනා කළා. ඒ න්‍යාය ධර්මයට අනුව, තමන් මේ දේ කළොත් අවසානයේ තමන්ට මේ ජාතියේ ප්‍රතිඵලයක් තමයි උදාවෙන්නෙ. නමුත් ඒක නොකර පැත්තකට වුනොත් ඒ ප්‍රතිඵලය නෑ. පෙර හොඳයි කියල අල්ලගෙන පත පතා ආස්වාද පස්සෙම දිව්ව නිසා තමයි දැන් ලෙඩවෙන, කැඩෙන බිඳෙන කයක් තියෙන ජාතියක් ප්‍රතිඵල විදිහට ලැබුනෙ. ඔය ආස්වාදයට වටිනාකමක් දුන්න නිසයි තමන්ට මෙච්චර දුකක් විඳලත් ඒක නොපෙනුනේ. එහෙම දුකක් ගෙන දෙන එකක වටිනාකමක්, හරයක් තියෙනවද කියල තමන්ම තේරුම් අරන්, ඒ වටිනාකම සහමුලින්ම අයින් කළොත්, තමන්ට මතු දුක් විඳින ජාතියක් ගොඩනගන එක නතර කරන්න පුළුවන්. එතකොට ඒ න්‍යාය ධර්මය හරියට දැක්ක නම්, මළ නැති කරන ක්‍රමය, එහෙම නැත්නම් නිර්මල වෙන ක්‍රමය දකිනවා. ඒක තමන් තුලින්ම අත්දකිනවා. ඉතින් මේ හේතුව නිසා, මේ මහා උත්තමයා ලෝකයට කියා දුන් දහමට නිර්මල බුදු දහම කියල කියනවා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# හතිය, ඇදුම සහ පීනස හැදෙන හැටි





**හා හා කරල දෙන්නම් තියලා යන්න**
**කියලා බාර ගෙන එය නොකරම ඉන්න**
**අය හට සිදු වෙනව මිනිසුනි දැන ගන්න**
**හතිය නමැති අසනීපෙන් පසු වෙන්න**

**අම්මට ඇද කරපු පව් එල දී ඔන්න**
**වෙන්නට සිදු වුණා නොව ඇද ඇද ඉන්න**
**එන්නට මෙවැනි විපතක් හේතුව මෙන්න**
**ඇද උම ඇදුම වූ හැටි අද දැන ගන්න**

**පියා කියන දේ නෑසූ එවුන් හට**
**එදා කරපු හේතුවෙ ඵලයක් ලෙසට**
**හැදෙනව රෝගයක් පසු කලකදි කයට**
**පීනස කියන නම පටබැඳුනා එයට**

**සත හට මෙවැනි දුක් පීඩා නොම වෙන්න**
**හේතුව සොයා හේතුව නැති කරගන්න**
**දරුවන් හැම දෙනට මෙය තෝරා දෙන්න**
**ගුරුවරු දෙමාපිය හැම දැනුවත් වෙන්න**

පබැඳුම: **මුරුතමුරේ ධම්මින්ද හිමි**

# නිවන් මාර්ගයේ මුල පටන් ගැන්ම අපදාන පාළිය තුලින්...

3 වන කොටස

දැන් මේ කියන්න යන්නෙ අනෝමදස්සී බුදුපියාණන් වහන්සේ වැඩ හිටපු කාලයේ වෙච්ච සිදුවීමක් ගැන. ඒ කාලයේ නමින් වරුණ කියල හඳුන්වපු එක්තරා නාග රාජයෙක් හිටියා. මේ නාග රාජයගෙ භවන පිහිටල තිබුනෙ නාග ලෝකයේ. භවන කියල කිව්වෙ ඒ නාග රාජයා වාසය කරපු ස්ථානය. මේ නාග රාජයාට නොයෙක් ආකාරයේ වෙස් මවාගන්න පුළුවන් පුණ්‍ය සෘද්ධියක් තිබුණා. ඉතින් මනුස්ස වේසයක් මවාගෙන මනුස්ස ලෝකයට එන එක මහ ලොකු දෙයක් නෙවෙයි.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, මේ සතර අපාගත සත්වයෙකුට මෙච්චර දෙයක් කරන්න පුළුවන්ද කියල. මෙතනදී අණ්ඩජ, ජලාබුජ, සංසේදජ, ඕපපාතික ... ආදී වශයෙන් මේ නාග වර්ග හට ගන්නා විවිධ ක්‍රම රටාවන් ධර්මයේ (නාග සංයුක්තයේ) සඳහන් වෙනවා. අපිට සුලබව දකින්න ලැබෙන විසකුරු නාගයින් කියන්නෙ මේ අණ්ඩජ ක්‍රමයට උපදින සත්තු. මේ ක්‍රමවලින් **බලවත්ම කොට්ඨාශය තමයි ඕපපාතිකව උපදින්නෙ. ඒ අයට කර්ම විපාකජ සෘද්ධි පිහිටනවා.** නමුත් මේ කතා කරන්නෙ සතර අපාගතව ඉන්න, ඒ කියන්නෙ මනුස්සයෙක් වෙලා ඉඳෙද්දි නායකකම හිතට අරගෙන මාන්නෙන් අනෙක් අයට පිඹ පිඹ නපුරු දුස්සීල වැඩ කරල, ඒකම උපාදාන කරගෙන හටගන්න අණ්ඩජ ක්‍රමයට ඇති වෙන, අපිට මේ දකින්න ඉන්න සතර අපා නාග ජාතිය ගැන නෙවෙයි.

තිරිසන් කොටසට අයිති වුනත් පුණ්‍ය සෘද්ධි ඇතිව ඕපපාතිකව උපදින තව කොටසක් ඉන්නවා. ඒ අය නායකකම ගන්නවා, දන් දෙනවා, පින් පමුණුවනවා. හැබැයි ටිකක් සැඩ පරුෂ ගති තියෙනවා. ''ඇයි උඹල පන්සල් යන්නෙ නැත්තෙ, පිනක් දහමක් කරගන්නෙ නැත්තෙ?'' මේ වගේ හොඳ වැඩවලට යොමු කරන්නෙත් ටිකක් සැරෙන් කතා කරල බැනල තමයි. එහෙම උදව්ය, අර විදියට දුන්න යහපත් දේ නිසා මහ බල ඇති නාග කියන කොටසට යනවා. හැබැයි ගතිය අර නයා වගේමයි, සැඩ පරුෂයි, ඒ ජාතියේ ශරීරයකට උරුමකම් කියනවා. කරපු පින් නිසා තමන්ට කැමති වෙසක් මවා ගන්න පුළුවන් පුණ්‍ය සෘද්ධියක් ලැබෙනවා. හේතුව අර පැරණි ගති නිසා පින් දහම්වලට කැමතියි. ඉතින් බුදු කෙනෙක් වගේ උත්තමයෙක් පහළ වුනාම පින් දහම් කරගන්න මනුස්ස ලෝකයට එනවා. එතකොට අර නාග වේශයෙන් එන්න බෑ. ඊට ගැලපෙන ශරීරයක් මවා ගන්න වෙනවා. මේ නාග රාජයත් කළේ ඒ ජාතියේ වැඩක්. බුදු කෙනෙක් කියන්නෙ ඉතාම දුර්ලභව ලෝකයේ පහල වෙන උත්තමයෙක්. අප්‍රමාණ පින් රැස් කරගන්න පුළුවන් අනුත්තර පින් කෙතක්. හරියට



සරුසාරව වැඩුන කුඹුරකින් තමන්ට හිතු හිතු ආකාරයට අස්වැන්න නෙලන්න පුළුවන් වගේ.

ඉතින් අනෝමදස්සි බුදුපියාණන් වහන්සේ හිමාලයේ දිව්‍ය සමූහයා පිරිවරාගෙන වැඩ හිටපු මොහොතක තමයි මේ නාග රාජයා උන්වහන්සේව දැක්කෙ. ඉතාමත් පැහැදිලා, අද හේවිසි බෙර වගේ භාණ්ඩ වාදනය කරල බුදුන් සිහි කරන්න ධාතූන් වහන්සේලා වඩම්මනව වගේ, මේ නාග රාජයත් තූර්ය වාදනය කරන්න පටන් ගත්තා. ඒත් එක්කම මනුස්සයොත් ඒකට එකතු වුනා. මේක ඇහුන චාතුර් මහාරාජික දේව සමූහයත් ඒකට එකතු වුණා. අනෝමදස්සී බුදුන් වහන්සේට මේ ශබ්ද පූජාව වැටහුණා. ඊට පස්සෙ මේ නාග රාජයා ඉතාම ගෞරවයෙන් බුදුන් වහන්සේට දනකට ආරාධනා කළා. උන්වහන්සේ ඒ ආරාධනාව පිළිඅරගෙන වරුණ නාග රාජයාගේ භවනට දහසක් රහතන් වහන්සේලා සමග වැඩියා. එතනදි බුදුන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නයට මහ ඉහලින් දානයක් දුන්නා. **බුදුපියාණන් වහන්සේ නමකගේ සිරිතක් තමයි විශේෂ කෙනෙක්, එහෙම නැත්නම් ශ්‍රාවක පාරමිතාවක් හෝ මතු බුදු වෙන්න ඉන්න උත්තමයෙක් මේ ජාතියේ මහා පූජාවක් කළොත්, අනෙක් අයටත් ඒ ගැන දැනගන්න පුණ්‍යානුමෝදනාවක් කරනවා. ඒ කරපු පින්කමේ වටිනකම අනෙක් අයටත් කියල දෙනවා. ඒ වගේම ශ්‍රාවක පාරමිතා පුරන කෙනෙක් නම් ඒ අවස්ථාවේදී ශ්‍රාවක විවරණයක් දෙනවා.**

ඇයි උන්වහන්සේලා එහෙම කරන්නෙ කියල කෙනෙකුට හිතෙන්න පුළුවන්. බුද්ධ ශාසනයක් ලෝකයේ පවතින්නෙ ඉතාම සීමිත කුඩා කාලයකට විතරයි. අපි අවිද්‍යා අන්ධකාරයෙන් මුලා වෙලා, සසර සැරි සරපු කාලය මෙච්චරයි කියල කියන්න බෑ. ඒක බුදු කෙනෙකුට හැර මහා දිවැස් ලාභියෙකුට පවා මනසට ගෝචර නොවන අප්‍රමාණ කාලයක්. ඉතින් අර සීමිත කුඩා කාලය, අපි අනාථ වෙලා හිටපු කාලය එක්ක බැලුවම හරියට නිකන් ඇහිපිය ගහන මොහොතක් වගේ ඉතාම කුඩා ක්ෂණයක්. ඒ කාරණය බුදුපියාණන් වහන්සේ නමක් සියයට සීයක්ම දැකල ප්‍රත්‍යක්ෂ කරල ඉන්න නිසා, ඒ දුකින් ලෝක සත්වයා මුදවන්න චතුරාර්ය සත්‍යය දේශනා කරනවා. ඒ වගේම මේ මහා උත්තමය දන්නවා, චතුරාර්ය සත්‍යය හැමෝටම අවබෝධ වෙන්නෙත් නෑ කියල. ඒක කරගන්න පුළුවන් වෙන්නෙ ප්‍රඥාව මුහුකුරා ගියපු හේතු වාසනා තියෙන අයට පමණක් බවත් උන්වහන්සේලා දන්නවා. නමුත් අනෙක් අය අංශුමාත්‍රයක් හෝ තුනුරුවන් කෙරෙහි පැහැදීමක් ඇතිවුනොත්, අනේ කොච්චර දෙයක්ද මේ කරගත්තෙ කියල එක සිතිවිල්ලක්වත් ආවොත්, ඒ ටිකම ඇති ඒ අයට කවදා හරි සසරින් මිදීම ආරම්භ කරන්න. ඉතින් ඒ හේතුවෙන් තමයි කෙනෙක් පෙන්වල, බලන්න මේ පුද්ගලයා අද කරගත්ත පිනෙන් ඇතිවන ප්‍රතිඵලය කියල ලොකු විස්තරයක් කරන්නෙ.

දැන් මේ නාග රාජයත් කරගත්ත පුණ්‍ය මහිමයේ බලයෙන් ලැබෙන විපාක ගැන විස්තරයක් කරනවා. ඒ ගැන උන්වහන්සේ මෙහෙම අනුමෝදනාවක් කරනවා. කෙනෙක් බුදුන් කෙරෙහි, උන්වහන්සේගේ ශ්‍රාවක සංඝයා කෙරෙහි සිත පැහැදීමෙන් පිදුවනම්, දන් දුන්න නම්, ඒ හේතුවම ඇති ඒ කෙනා දෙව්ලොව උපදින්න. මෙතනදී අද පොදුවේ තියෙන ප්‍රශ්නයක් තමයි, දැන් බුදුන් වහන්සේ නැනෙ, සංඝයා කියලත් ඉන්නෙ සිවුර දාගෙන එක එක වැඩ කරන උදවියනෙ, අපි කොහොමද සිත පහද ගන්නෙ කියල සමහරු හිතන කාරණය. ඒ වගේම සමහරු කියනවා, මැටි පිළිම බත් කනවද, ඒවට දුන්න කියල ඇති වැඩක් නෑ, අනේ අපි කොහොමද එහෙම දෙයක් කරන්නෙ, මෛත්‍රී බුදු හාමුදුරුවො පහල වුනාමවත් කර ගන්නව කියල. මේ ආදී කතා කියල සමහරු පසුබට වෙනවා. දැන් මෛත්‍රී බුදු හාමුදුරුවො පහළ වෙනකල් පින් දහම් කරන්න කල් දාන අය මේ කාරණයත් දැනගන්න ඕන.

ගෞතම බුදුන් වහන්සේ පහල වෙන්න කලින් ලෝකයේ පහළ වෙච්ච බුදුන් වහන්සේ තමයි කාශ්‍යප බුදුපියාණන් වහන්සේ. එතකොට අපේ ගෞතම බුදුන් වහන්සේ ජෝතිපාල කියන නමින් මනුස්සයෙක් වෙලා හිටියා. ඒ ජෝතිපාල මානවකයගෙ යාළුවෙක් ඇවිත් මෙහෙම කියනවා. ''එන්න යන්න, ලෝකයට බුදුපියාණන් වහන්සේ නමක් පහළ වෙලා, අපි ගිහින් බණ ටිකක් අහමු.'' ඉතින් මේ ජෝතිපාල මානවකය ගත් කටටම කිව්වෙ මොකද්ද? ''අර හිස මුඩු කරල ඉන්න මහණට මොන බුදු බවද? බුද්ධත්වය කියන්නෙ එහෙම ලේසියෙන් ගන්න පුළුවන් දෙයක් නෙවෙයි. එයාට මොන බුදු බවද?'' හැබැයි ඒ වෙනකොටත් මේ ජෝතිපාල මානවකය කියන්නෙ, අනිවාර්යෙන්ම බුදුවෙනව කියල නියත විවරණ විසිතුනක් අරගෙන අන්තිම විවරණයත් ගන්න හිටපු උත්තමයෙක්. දැන් ඉතින් ඒ වගේ **බෝසත් අත්බැවක හිටපු කෙනෙකුටත් බුදුපියාණන් වහන්සේ නමක් හඳුන ගන්න බැරි වුනා නම්, අපි කොහොමද මේ පහළ වෙලා ඉන්නෙ මෛත්‍රී බුදුහාමුදුරුවො කියල හඳුන ගන්නෙ?** ඒ වගේම මෛත්‍රී බුදුන් වහන්සේ පහළ වෙන කොට මේ කියන අය කොහේ ඉඳියිද කියල කවුද දන්නෙ? මේ නිසා මේ සාසනය පවතින කාලයේ අප්‍රමාදී වුනොත් මිසක්, කල් දාන එක නම් නුවණට හුරු නෑ. එතකල් දෙවියෙක් වෙන්න නෙවෙයි, සසර කෙටි කරගන්නයි උත්සාහ කරන්න ඕන. (පසුගිය කලාපයේ නොපෙනෙන ලෝකය දහම් ලිපිය යටතේ විග්‍රහ කළ ''දෙව් ලොව දෙවියන් විඳින දුක'' ලිපිය බලන්න)

බුදුන් වහන්සේ දැන් ජීවමානව නෑ, ඉන්න සංඝයා වහන්සේත් පිළිවෙත් පුරන්නෙ නෑ කියන කාරණා අපේ හිතට එන්නෙ පුද්ගලත්වයක් ගන්න ගියාම තමයි. එහෙම නැතිව ගුණයක් දකින්න පුරුදු වෙන්න ඕන. බුදු ගුණ, සඟ ගුණ අප්‍රමාණයි කිව්වට වැඩක් නෑ, ඒ ගුණ දැක්කෙ නැත්නම්. ඉතින් අප්‍රමාණයක් අපි දකින්නෙ කොහොමද? ඒකට තමයි අපි තුල අනුමාන කිරීමේ හැකියාව තියෙන්නෙ. ලුණු කැටයක් මෙච්චර ලුණු රස නම්, මුළු මුහුදෙම ලුණු රස මේ වගෙයි කියල අපේ හැකියාව අනුව අපිට අනුමාන කරන්න පුළුවන්. ඒ විදිහට තමයි ගුණ දකින්නෙත්. ඒකත් විවිධාකාරයට දකින්න පුළුවන්. ''බුදුන් වහන්සේට, රහතන් වහන්සේලාට දස අකුසලයෙන් වෙන්වෙලා ඉන්න ගුණයක් තියෙනවා. ඒ ගුණය මට තේරෙනවා, මම ඒ ගැන පැහැදෙනවා, ඒ ගුණයට ගරු කරනවා.'' මෙහෙම පටන් ගන්න පුළුවන් නම්, කෙනෙකුගේ හිත ටිකෙන් ටික අර ගුණය කෙරෙහි පැහැදෙනවා. මේ විදියට සුළුවෙන් හෝ ඇතිවන පැහැදීම එසේ මෙසේ පැහැදීමක් නෙවෙයි. නොදැන හෝ පැහැදුන අප්‍රමාණ ගුණයකට ලැබීමත් අප්‍රමාණයි. ඒ අනුව තමයි දෙව් ලොව හෝ ඊට උඩ කාලාන්තරයක සම්පත්තියක් ලැබෙන්නෙ. අර නාග රාජයාට කරපු අනුමෝදනාවෙන්ම ඒක පැහැදිලි වෙනවා.

දැන් අනෝමදස්සී බුදුන් වහන්සේ මේ විදියට පැහැදිලි කරනවා. මේ පිනෙන් හැත්තෑ හත් වරක් දිව්‍ය රාජ්‍ය කරනවා. ඒ කිව්වෙ සක් දෙවිඳුගේ පදවිය හැත්ත හත් වතාවක් ලැබෙනවා. නිකන් දෙවියෙක් නෙවෙයි, හැත්ත හත් වතාවක් දෙවියන්ගෙත් රජතුමා වෙනවා. වාර අටසීයක් මේ මහ පොළවෙ රජකම් කරනවා. පනස් පස් වරක් සක්විති රජ වෙනවා. ඒ විතරක් නෙවෙයි, තව එකා සංඛ්‍ය කල්ප ලක්ෂයකින් පසුව ගෞතම කියල බුදුන් වහන්සේ නමක් පහළ වෙනවා. ඒ කාලයේ, පෙර කරපු පාප විපාකයකින් ගිය නිරයෙන් චුත වෙලා නැවතත් මනුස්සයෙක් වෙලා උපදිනවා. ඊට පස්සෙ ගෞතම බුදුන් වහන්සේගේ වමත් අගසවු වෙනවා. කලින් සඳහන් කරපු ආකාරයටම කවදා හෝ සසරින් එතෙර වෙන්න වාසනාව ලැබෙනවා. ඒකෙ සැකයක් නෑ. නමුත් ඒ අනුමෝදනාවේ අනෝමදස්සී බුදුපියාණන් වහන්සේ විශේෂ යමක් ප්‍රකාශ කරනවා. ඒක තමයි ''නිරයෙන් චුතව'' කියන කොටස.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, ශ්‍රාවක පාරමිතාවක් පුරන කෙනෙක්, අර අප්‍රමාණ පින් කඳක් ලබපු කෙනෙක් කොහොමද නිරයට යන්නෙ කියල. ශ්‍රාවක පාරමිතා පුරන කෙනෙක් වුනත් චතුරාර්ය සත්‍යය අවබෝධ කරල නැති නිසා එහෙම වෙන්න පුළුවන්. මෙතනදී ඒ අනුමෝදනාවෙන් කාරණා දෙකක් තේරුම් ගන්න පුළුවන්. එකක් තමයි සසර ගමන මොන තරම් භයානකද කියන කාරණය. **හැත්ත හත් වතාවක් සක් දෙවිඳු වෙලා, අටසිය වතාවක් ලෝකය පාලනය කරල, පනස් පස් වතාවක් සක්විති රජ වුණ කෙනෙකුත් නිරයට වැටෙන්න පුළුවන් කියන කාරණය** මේකෙන් ගම්‍ය වෙනවා. ඒ තරම්ම සසර ගමන විශ්වාසයක් නෑ, හරි භයානකයි. අනෙක් කාරණය **ශ්‍රාවක පාරමිතා පුරන කෙනෙකුත් නිරයට වැටෙන්න පුළුවන් නම්, අර කලින් සඳහන් කළා වගේ මෛත්‍රී බුදු හාමුදුරුවන්ගෙ කාලෙට කල් දාන සාමාන්‍ය අය ගැන කවර කතාද?**

කොහොමද උන්වහන්සේ පාරමිතා පුරණ කාලෙ නිරයට වැටුනෙ කියල දැන් තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන්. මුගලන් මහරහතන් වහන්සේගේ ථේරාපදානයට අනුව, උන්වහන්සේට එහෙම වුණේ පාප මිත්‍රයන් සේවනය කිරීම නිසා. පැහැදිලිවම ඒක සඳහන් වෙනවා.

පාප මිත්‍රයන් ඇසුරෙන් කාම රාගයෙහි වසඟයට ගියේ දුෂ්ට සිත් ඇත්තේ මව ද පියා ද නැසීමි. මහා මොග්ගල්ලාන ථේරාපදානය (අපදාන පාලිය 1 59 පිටුව).

අවිද්‍යාව කොච්චර බලවත්ද කියනව නම්, උන්වහන්සේ දූසී නමින් වසවර්ති මාරය වෙලා ඒ තනතුර දරපු කාලයේ, කාශ්‍යප බුදුපියාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවකයන් වහන්සේ නමකට කරපු හිංසාවක් නිසා අපාගත වුණා. ඒක වෙනම අවස්ථාවක්. නමුත් මෙතන කියන්නෙ අසත් පුරුෂ ඇසුර නිසා නිරයට වැටුන තවත් අවස්ථාවක් ගැන. අසත් පුරුෂ ඇසුර නිසා අවිද්‍යාවට මුල පිරෙනවා. ඒ නිසා කරන කියන දේ වැටහෙන්නෙ නැතිව යනවා. ඉතින් අම්ම තාත්ත වුණත් මරන්න පුළුවන්. ඒ තරම් අසත් පුරුෂ ඇසුර භයානකයි. අද සමාජයෙත් අසත් පුරුෂ ඇසුර නිසා විනාශ වෙච්ච ජීවිතවලට ඕන තරම් උදාහරණ තියෙනවා. ගමෙන් පිට වෙන්නෙ කොහොම හරි රස්සාවක් කරල ගේ දොර හදාගෙන, අම්ම තාත්තට හොඳට සලකල රැක බලාගන්නවා කියන අවංක අරමුණෙන්. එහෙම කියල අම්ම තාත්තට වැඳල පිටත් වෙන පුතා, අසත් පුරුෂ ඇසුර නිසා අම්ම තාත්ත බලන්න එන්නත් ලැජ්ජා වෙන තත්ත්වයට පත්වෙනවා. මත්පැන්, මත්ද්‍රව්‍ය අහලකටවත් ගත්තෙ නැති කෙනාට දැන් ඒවා නැතුව බැරි තත්වයකට පත්වෙනවා. ඒවා

08 වෙනි පිටුවට...

# වරදවා තේරුම් ගෙන කරන පැරණි සිරිත්...

ලෝක සත්වයා අනන්ත සංසාරයේ පටන් මේ දක්වා හිතන, කියන, කරන යහපත් සහ අයහපත් දේවල් තුළින් නිමක් හොයා ගන්න බැරිව, මේ අනන්ත සංසාරයේ මහා දිගු ගමනක් යනවා. මේ අතර වාරයේ සතර අපාගත අත්බැව් ලබපු වාරත් අනන්තයි. ඒ නිසා මනුස්ස අත් භවයක් ලබපු මේ අවස්ථාව තුළ පිනක් කර ගන්න පුළුවන් පරිසරයක් ඕනෑම මනුස්සයෙකුට නිර්මාණය වෙලා තියෙනවා. තිරිසන්, ප්‍රේත.... ආදී අත්භවක් ලැබුණොත් පිනක් කර ගන්න අවස්ථාවක් තියෙනවද කියල හිතල බලන්න. සමහර තිරිසන් සතුන්ට, විශේෂයෙන් දළඳා කරඬුව ගෙන යන ඇතා වගේ සතෙක් ගත්තොත් ඌට පිනක් කර ගන්න අවස්ථාවක් ලැබිල තියෙනවා. නමුත් බොහෝ තිරිසන් සතුන්ට එහෙම පිනක් කර ගන්න තරම් අවස්ථාවක් පිහිටන්නෙ නෑ. ප්‍රේත ලෝකයේ සත්ව කොට්ඨාසවලටත් පිනක් දහමක් කර ගන්න අවස්ථාවක් නෑ. කරපු පවුකම්, කර්ම ශක්තිය තුළින් එනකොට පිනක් කර ගන්නවත් හැකියාවක් නැති තරමටම අසරණ වෙනවා.

බුදුන් වහන්සේ එක් අවස්ථාවක සුමනා සිටු දේවියට ප්‍රකාශ කර සිටියෙත්, සුමනාවනි, දන් දිය යුතුමය, පිං කළ යුතුමය, දෙව් වූ අයටත් මිනිස් වූ අයටත් ශ්‍රමණ වූ අයටත් නිවන් අවබෝධ කරන තුරුම පින උපකාරී වේ කියල. (අං. නි. (3) 50 පිටුව, සුමනා සූත්‍රය) පුණ්‍ය කටයුතු කිරීම තුළින් ලෞකික ජීවිතයේ ආයුෂ, වර්ණ, සැප, බල, නුවණ ලබල දෙනව පමණක් නෙවෙයි, ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන්නත් පසුතලය සකසල දෙනවා.

"යථාපි පුප්ඵරාසිම්හා,
කයිරා මාලා ගුණේ බහූ
ඒවං ජාතේන මච්චේන,
කත්තබ්බං කුසලං බහුං"
(ඛුද්දක නිකාය, ධම්ම පද පාළි, පුප්ඵ වග්ගය)

මල් ගොඩකින් බොහෝ මල් දම් ගොතන මල් කරුවෙක් වගේ, උපන්නා වූ මිනිසා බොහෝ පින් කළ යුතු බව මේ ගාථාවෙන් පෙන්වා දෙනවා. ඒ නිසා සුළු හෝ යහපත් වැඩක් කරන්න ගියත්, ඒ වැඩේට පළමුවෙන් පිනක් කර ගන්න නිතරම පුරුදු පුහුණු වෙනව නම්, අපේ සංසාර ගමනේ තියෙන පිං කැටයට තවත් පිනක් එකතු වුනා වෙනවා. පන්සලේ පිං කැටයට රුපියලක් දැම්ම කියල යන්තමින් හරි පිං කැටය නොපිරී තියෙන්නෙ නෑ. කැටය රුපියලකින් හරි පිරෙනවා. ඒ වගේ තමයි සංසාර ගමනේ යනකොට අපිට තියෙන පිං කැටය සුළු හෝ පිනකින් පිරෙනවා. හැබැයි කරන සුළු පිනේ හෝ ආනිසංස ලැබෙන්නෙ ඒක චිත්ත ප්‍රසාදයකින්, පහන් සිතකින් සිදු කළොත් විතරයි.

1. මනෝ පුබ්බංගමා ධම්මා
මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චේ පදුට්ඨේන,
භාසතිවා කරෝතිවා
තතෝනං දුක්ඛ මන්වේති,
චක්කංව වහතෝ පදං

2. මනෝ පුබ්බංගමා ධම්මා
මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චේ පසන්නේන
භාසතිවා කරෝතිවා
තතෝනං සුඛ මන්වේති
ඡායාව අනපායිනී

මේ සසර ගමන යන අතර තුරේ කිසියම් වූ ආකාරයකින්, පතන අයහපත් පැතුමක්/සිතිවිල්ලක් වේද, කියන අයහපත් වදනක් වේද, කරන අයහපත් කටයුත්තක් වේද, ගොනා පසු පස බැඳි කරත්තය වගේ සංසාර ගමනෙදි මේ හිතපු, කියපු, කරපු බොහෝ පාප කර්ම ලෝක සත්වයාට දුක් කරදර ලෙස මුහුණ පාන්න සිද්ධ වෙනවා. ඒ වගේම තමයි කිසියම් වූ ආකාරයක පතන යහපත් පැතුමක්/සිතිවිල්ලක් වේද, කියන යහපත් වදනක් වේද, කරන යහපත් කටයුත්තක් වේද, තමා අතහැර නොයන සෙවනැල්ල වගේ ඒ බොහෝ පුණ්‍ය කර්ම තුළින් සැපය තමා පසු පස එනවා. ඉහත දැක්වෙන ධම්ම පදයේ සඳහන් වෙන පළමු හා දෙවන ගාථාවන් තුළින් මේ බව ප්‍රකාශ වෙනවා. ඒ නිසා මේ සසර ගමනේ භයානකකම දැන ගෙන හිටිය අපේ පැරැන්නන් යහපත් විදියට සිතිවිලි, ක්‍රියා, වදන් හැසිරවිය යුතු බවත් දැන ගෙන හිටියා. සිත, කය, වචන සංවර කරගෙන වැඩ කටයුත්තක නියැලෙන්න පුරුදු පුහුණු වුණා. **කවුරුහරි**



**සංකර වැඩක් කරන කොට, අවිද්‍යා පච්චයා සංඛාරා ... ආදී වශයෙන් කියන පටිච්ච සමුප්පාදයේ වචනයක් අරගෙන, එහෙම සංකර වැඩ කරන්න එපා කියල ඒකට දොස් කියන සිරිතක් අපේ පැරැන්නන් ළඟ තිබුණා.** (සංස්කාර - සංස්කෘත, සංඛාර - පාලි, සංකර - සිංහල)

බුදු පියාණන් වහන්සේ මංගල ප්‍රශ්නය විසඳීම සඳහා මහා මංගල සූත්‍රය දේශනා කළා. ලෞකික ජීවිතයට අදාල කරුණු 32 කුත්, ලෝකෝත්තර ජීවිතයට අදාල කරුණු 6 කුත් වශයෙන් උභය ලෝක සංසිද්ධි කාරණා 38 ක් ඇතුලත් මහා මංගල සූත්‍රය දේශනා කරමින් උන්වහන්සේ මංගල ප්‍රශ්නය විසඳුවා. මේ මංගල කාරණා අතරින් පස්වන මංගල කාරණය ලෙස ''පුබ්බේ ච කත පුඤ්ඤතා'' කියල හැඳින්වෙන මංගල කාරණයේ අරුත විදියට අටුවාවල සඳහන් වෙන්නෙ ''පෙර කරන ලද පිං ඇති බව'' කියල. පෙර කරන ලද පිං වගේම, පෙර කරන ලද පවුත් කරගහගෙන සියලු සත්වයෝ අනන්ත සංසාර ගමනක යනවා. ''පෙර කරන ලද පිං ඇති බව'' කියන කාරණය මංගල කාරණයක් කියල කිව්වම, ඒක ඵල දෙන අවස්ථා වගේම ඵල නොදෙන අවස්ථාත් තියෙනවා. පුබ්බේ ච කත පුඤ්ඤතා කියන ගුණය තුළ, පුද්ගලයෙක්ගෙ චරිතය හදා ගන්න ක්‍රමයක් තියෙනවා. **පෙර** ☞

**කරන ලද කත පුඤ්ඤතාවය කියල කියන්නෙ, යම් යහපත් වැඩක් කරන්න කලින් පිනක් කරන්න කියන එක.** යහපත් වැඩක් කරන්න කලින් මොකටද පිනක් කරන්නෙ, ඇයි එහෙම කරන්නෙ කියල කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්. යහපත් වැඩක් කරන්න කලින් මනස පිරිසිදු වෙන්න ඕන. පිරිසිදු මනසකින් කරන, කියන දෙයත් අනිවාර්යෙන්ම පිරිසිදුයි. ඉතින් යම් වැඩක් පටන් ගන්න කලින් මනස පිරිසිදු වුනාම තමන් කරන වැඩෙත් සාර්ථක වෙනවා. ඒකයි යමක් කරන්න කලින් පිනක් කරන්න කිව්වෙ. ''මනසාචේ පසන්නේන භාසතිවා කරෝතිවා තතෝනං සුඛ මන්වේති ඡායාව අනපායිනී" ඒ කිව්වෙ, ප්‍රසන්න මනසකින් කරන කියන දෙයක් තුළින් සැප තමාගේ පසු පස එනවා, හරියට ඡායාව තමාගේ පසු පස එනව වගේ.

මේ පිළිවෙත් අපේ පැරණි බෞද්ධයින් තුළ තිබුණා. ඒ අය හේනට කුඹුරට ගිහින් වැඩ පටන් ගන්න කලින්, උදැල්ල අල්ලන්නත් කලින් ''නමෝ බුද්ධාය" කියල වැඳල ඉන්නවා. බුදු රජාණන් වහන්සේ සිහි කරල තමයි එහෙම නමස්කාර කරන්නෙ. ඊට පස්සෙ තමයි වැඩ පටන් ගන්නෙ. **නමුත් අද මේක පටලවාගෙන. ගහක් කපන්න ගියත් කැත්තටයි ගහටයි දෙකටම වඳිනවා. මෝටර් රථයක් පදවන්න පටන් ගන්න කොටත් තුන් වරක් කරකවල සුක්කානමට වඳිනවා. හාල් ළිපේ තියන කොට බත් මුට්ටියටත් වඳිනවා. හාල් ගෝනියෙන් හාල් ගන්න කොට හාල් ගෝනියටත් වඳිනවා. හේනට කුඹුරට ගියාම මහ පොළොවත් අල්ලල නමස්කාර කරනවා.** නමුත් බුදුන්, දහම්, සඟුන් සරණ යන බෞද්ධයෝ විදියට යමක් නුවණින් විමසල බලල, හරිද වැරදිද කියල තේරුම් ගැනීමේ හැකියාවක් තියෙන්න ඕන. යමෙක් කළ කී පමණින් හරිය කියල නිගමනය කරනවට වඩා, තමන්ම සිහි බුද්ධියෙන් බැලුවම මේ ක්‍රමය වැරදියි කියල බෞද්ධයින්ට වැටහෙන්න ඕන. පැරැන්නන් කරපු දේවල් බලාගෙන, කරන්නන් වාලෙ කරන්න ගිහින් තමයි මෙහෙම වැරදි ක්‍රමයක් ඇති වුනේ. මේ සම්බන්ධයෙන් එන පැරණි කතාවකුත් තියෙනවා.

එක් ආරණ්‍යයක වැඩ හිටපු ලොකු හාමුදුරුවන් වහන්සේගෙ පාත්තරේ පුංචි සිදුරක් තිබුණා. ඒ නිසා පිණ්ඩපාතෙ වඩින්න පටන් ගන්න කොටම පාත්තරේ අහසට දිගු කරල සිදුර තියෙන තැන හොයාගෙන, එතනට ඇඟිල්ලක් තියාගෙන පිණ්ඩපාතෙ වඩින සිරිතක් උන් වහන්සේ ළඟ තිබුණා. මේ සිරිත පිණ්ඩපාතෙ වඩින පොඩි හාමුදුරුවොත් දැක්කා. ඉතින් උන් වහන්සෙත් ඒක බලාගෙන ඉඳල, පිණ්ඩපාතෙ වඩින්න පෙර පාත්තරේ උඩට අල්ලල පිණ්ඩපාතෙ වඩින්න පටන් ගත්තා. ලොකු හාමුදුරුවො එහෙම කරන්නෙ මොන හේතුවකටද කියල විමසන්නෙ නැතුව, පොඩි හාමුදුරුවොත් මේ සිරිත අනුගමනය කළා. මේ සිද්ධිය එක්තරා උපාසක මහත්තයෙක් දැකල, මේ අලුත් ප්‍රතිපත්තිය ගැන පොඩි හාමුදුරුවන්ගෙන් ඇහුවම, පොඩි හාමුදුරුවො කිව්වලු ලොකු හාමුදුරුවො කරපු නිසා මමත් එහෙම කළා කියල. ඊට පස්සෙ අර උපාසක මහත්තය මේ සිද්ධිය ගැන ලොකු හාමුදුරුවන්ගෙන් විමසුවා. තමන්ගෙ පාත්තරේ සිදුරක් තියෙන නිසා උඩට අල්ලල සිදුර තියෙන තැන හොයා ගෙන, එතනට ඇඟිල්ලක් තියාගෙන



පිණ්ඩපාතෙ වඩින බව උන්වහන්සේ පැහැදිලි කළා. ඉතින් පොඩි හාමුදුරුවො තේරුමක් නැතුව පාත්තරේ උඩට අල්ලල පිණ්ඩපාතෙ ගියා වගේ, අපේ මිනිස්සුත් කාර් එකට වඳිනවා, බයිසිකල් එකට වඳිනවා, කැත්තට උදැල්ලට වඳිනවා. කවුරු හරි කරනව දැකල, ඔහේ කරන්නන් වාලෙ කරනවා. නමුත් පැරැන්නන් එහෙම කළේ නෑ. ඔවුන් යමක් පටන් ගන්න කලින් පිනක් කර ගත්තා. පැරැන්නන් ඒ දේ හරියට කළා. ඔවුන් වැඩක් පටන් ගන්න කලින් බුදුන් සිහි කරල තමයි ඒ විදියට වැන්දෙ. නමුත් අද වඳින්නෙ භෞතික දේවල්වලට. අපේ ආදී පැරැන්නන් පුබ්බේච කත පුඤ්ඤතා කියන ගුණය නියමාකාරයෙන් ක්‍රියාවට නැංවුවා. යමක් කරන්න කලින් ''නමෝ බුද්ධාය'' කියල ඒ කටයුත්ත සාර්ථක වෙන්න තවත් පිනක් කර ගත්තා. සිත පහදව ගත්තා.

යෝච බුද්ධංච ධම්මංච
සංඝංච සරණං ගතෝ
චත්තාරි අරිය සච්චානි
සම්ම පඤ්ඤාය පස්සති
(බුද්ධ වග්ගය 12 ගාථාව - ධම්ම පදය)

තෙරුවන් සරණ යාමෙන්, චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීමෙන්, නිර්වාණාවබෝධය සාක්ෂාත් කර ගන්න පුළුවන් බව මේ ගාථාවේ සඳහන් වෙනවා. තෙරුවන් ගුණ අවබෝධ කරගෙන, තම දිවි පෙවෙත තුළ ඒ ගුණ පුරුදු පුහුණු කිරීම මගින් ශ්‍රද්ධාව, ප්‍රඥාව දියුණු වෙනවා. ඒ නිසා බුද්ධං සරණං ගච්ඡාමි කියන්නෙ බුදු ගුණ ආදර්ශයට අරගෙන කටයුතු කරනවා කියන එක. ධම්මං සරණං ගච්ඡාමි කියන්නෙ ධර්මය අනුගමනය කරමින් දම් ගුණ පුරුදු පුහුණු කරනවා කියන එක. සංඝං සරණං ගච්ඡාමි කියන්නෙ මහ සඟ රුවනේ ගුණ, ආදර්ශ අනුගමනය කරනවා කියන එක. ඉතින් බුදුන්, දහම්, සඟුන් ගුණ සිහි කරල වැඩක් පටන් ගත්තම වරදින්න විදියක් නෑ. වැරදුනත් පෙර සසර වැරැද්දකට විපාකයක් විදියට දාහකට එකයි වරදින්නෙ. මෝටර් රථයක් පදවන්න පටන් ගන්න කොටත්, ඊට කලින් සුක්කානම වටේ අත් යවල බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි කියල තුන් වරක් වැඳල පටන් ගත්ත ගමනකට කවදාවත් මග බාධක ඇති වෙන්නෙ නෑ. අනතුරකින් බේරෙන්න තියෙනව නම් බේරෙනවා. බේරෙන්නම බැරි දෙයක් තියෙනව නම් කරන්න දෙයක් නෑ. **කර්ම ශක්තිය අනුව බේරෙන්නම බැරි දෙයක් නම්, බුදු පියාණන් වහන්සේටවත් බේරන්න විදියක් නෑ.** නමුත් දාහකට නවසිය අනූ නවයක්ම බේරෙන්න අවස්ථා තියෙනවා. හැබැයි අර දාහකට එක බේරෙන්න බැරි වෙන්න පුළුවන්. ඒ කියන්නෙ **කෙනෙකුට වළක්වන්න බැරි, ඒකාන්තයෙන්ම සිද්ධ වෙන දෙයක් තියෙනව නම්, එහෙම තියෙන්නෙ දාහකට එකයි.** දාහකට නවසිය අනූ නවයක්ම මාර්ග බාධක වළක්වන්න හැකියාව තියෙනවා. නමුත් අද ඒ ක්‍රමය ඒ විදියට නොකරන නිසා ඔක්කොම මාර්ග බාධක බවට පත් වෙලා.

ඒ වගේම යම් සත් කටයුත්තක් කරන්න නැකතක් එනකල්ම සමහරු බලන් ඉන්නවා. බුදුන් වහන්සේ එක් අවස්ථාවක, මෝඩයෝ නැකත් ☞

එනකල් බලා ගෙන ඉන්නවා කියල දේශනා කරල තියෙනවා. එහෙම දේශනා කිරීමෙන් අදහස් කළේ, නැකත් ශාස්ත්‍රය බොරුවක් කියල නෙවෙයි. බෞද්ධයින්ට නැකතක් එනකල් වැඩක් කරන්න බලන් ඉන්න අවශ්‍ය නෑ. බුදු ගුණ, දම් ගුණ, සඟ ගුණ සිහි කරල වැඩේ පටන් ගත්තම හේතු තියේ නම් ඒක සාර්ථක වෙනවා. නමුත් නැකතක් හදල වැඩක් පටන් ගන්න එක සම්මතය නිසා ඒ විදියට වැඩේ පටන් ගන්නවා. නැකතක් හදල වැඩේ පටන් ගන්න කොටත් සෙත් කරපු සුවඳ දුම් අල්ලල, සෙත් කරපු පහනක් පත්තු කරල මේ ආදී දේවල් කරල, අන්තිමට තෙරුවන් සිහි කරල වැඩේ පටන් ගන්න කියනවා. ඉතින් එහෙම කළාම වැඩේ හරි යනවා. නමුත් මෙතනදි නොදන්න කෙනෙක් හිටිය නම්, ඒ පුද්ගලය හිතන්නෙ ඒ වැඩේට අත ගහපු නැකතෙ තිබ්බ්ච හොඳකම නිසා වැඩේ හරි ගියා කියල. නමුත් ඒක නෙවෙයි මුල් වෙච්ච කාරණය. **චිත්ත ප්‍රසාදයෙන් යුතුව තුනුරුවන් කෙරෙහි හිත පහදවා ගෙන, ඒ වැඩේට අත ගැහුවම රාහු කාලයෙදි කළත් සාර්ථක ප්‍රතිඵල ලැබෙනවා. සෑම කළු වළාකුලකම රිදී රේඛාවක් තියෙනව කියල පැරණි කියමනකුත් තියෙනවා. මේ විදියට රාහු කාලය වගේ වෙලාවකත් හොඳ දීප්තිමත්, සරුයි කියන අවස්ථාවක් තියෙනවා.** මෝඩයෝ නැකත් එනකල් බලන් ඉන්නව කියල බුදුන් වහන්සේ කිව්වෙ, මෙහෙම වැඩක් සාර්ථක කර ගන්න ක්‍රමවේදයක් තියෙන නිසා.

පෙර හිටපු ඍෂිවරු මේ නැකත් ශාස්ත්‍ර ඔවුන්ගේ දැනීමේ හැටියට ලෝකයට දායාද කළා. ලෝකයට බුදු පියාණන් වහන්සේ නමක් පහළ වෙලා නියම ක්‍රමවේදය දෙනකල්, ඍෂිවරු ඔවුන්ගෙ නුවණෙ හැටියට විවිධ ක්‍රම ලෝකයට දායාද කරනවා. එහෙම ශාස්ත්‍ර ලබා දෙන්නෙ බුදුවරයන් වහන්සේ නමක් පහළ වෙනකල් විතරයි. මොකද බුදුවරයන් වහන්සේ නමක් පහළ වුණාට පස්සෙ ඒ ශාස්ත්‍ර ඉක්මවා ගිය ක්‍රමවේදයක් ලැබෙනවා. බුදුවරයන් වහන්සේ නමක් ලබා දෙන ශාස්ත්‍රය ඒ තරම් බලගතුයි.

ගෞතම බුදු පියාණන් වහන්සේ වැඩ වාසය කරන සමයේ බමුණන්ගේ වේද ශාස්ත්‍රය ඉගෙන ගත් එක් ගෝලයෙක් ජේතවනාරාමයට යන පාරෙ එක් ස්ථානයක නැකත්, යන්ත්‍ර මන්ත්‍ර ආදී ශාස්ත්‍ර කටයුතු කරමින් හිටියා. ඉස්සර ඔහු ළඟට ඇවිත් යන්ත්‍ර මන්ත්‍ර නැකත් වැඩ කරව ගත්ත උදවිය, දැන් ඔහු සිටින ස්ථානය පසු කරගෙන ඒ පැත්තවත් බලන්නෙ නැතුව කෙළින්ම බුදුන් වහන්සේ වැඩ වාසය කරන ජේතවනාරාමයට යන්න පටන් ගත්තා. බුදුන් වහන්සේ මන්ත්‍ර ජප නොකර, නැකත් වැඩ නොකර මිනිස්සුන්ට පිහිට වීම ගැන ප්‍රශ්නයක් ඇති වෙච්ච ඒ පුද්ගලයා, තමන්ගෙ බමුණු ගුරුවරයා ළඟට ගිහින් මේ පිළිබඳව විමසනවා. ''ස්වාමීනි, මම යන්ත්‍ර මන්ත්‍රකරල මිනිස්සුන්ට උදව් උපකාර කළා. නමුත් මිනිස්සු මා දිහා නොබලා දැන් බුදුන් වැඩ සිටින ජේතවනාරාමයට යනවා. ඒත් බුදුන් වහන්සේ යන්ත්‍ර මන්ත්‍ර නැකත් වැඩ කරන්නෙ නෑ. මොකද මේ මිනිස්සු එහෙම බුදුන් වහන්සේ ළඟට යන්නෙ?" මේ විදියට ප්‍රශ්න කළා. එතකොට ගුරුවරයා මෙහෙම කියනවා. ''ඔබ එසේ පවසන්න එපා. බුදුන්ට චෝදනා කරල සාප කර ගන්න එපා. අපි සියලු දේ බලල, නැකතත් හරියට බලල, එකසිය අට වරක් පිහිටවන බල පිහිටීම, උන් වහන්සේගේ එක වචනයක තියෙනවා. ඉතින් මිනිස්සු නොයා ඉන්න එක පුදුමයක්ද?" මෙහෙම කියල තමන්ගෙ ගෝලයට කරුණු කාරණා පැහැදිලි කරල දුන්නා. ඉතින් බුද්ධ බලයේ තියෙන බලගතු බව ඒකෙන්ම පැහැදිලි වෙනවා.

පුබ්බේ ච කත පුඤ්ඤතා කියල අද අර්ථ දක්වන්නෙ, පෙර කරන ලද පින් ඇති කියන එක. අද ''පෙර'' කියලත් අර්ථ දක්වන්නෙ පෙර අත් භවය ගැන. නමුත් මෙතනදි පෙර කිව්වෙ, යමක් කරන්න පෙර කියන එකයි. එහෙම නැතිව පසුගිය අත්බැවේ කියන අර්ථයෙන් නෙවෙයි. ඒක තමයි පුබ්බේ ච කත කිව්වෙ. ඒ නිසා යමක් කරන්න පෙර, පිනක් කරන්න අපිත් අපේ පැරැන්නන් වගේ පුරුදු පුහුණු වෙන්න ඕන. ඒකට ත්‍රිවිධ රත්නය කෙරෙහි හිත පිහිටවා ගෙන චිත්ත ප්‍රසාදය ඇතුව ඒ සත් කටයුත්ත ආරම්භ කරන්න පුරුදු වෙන්න ඕන. ඒ වගේම පින් රැස් කිරීම ලෞකික ජීවිතයට වගේම ලෝකෝත්තර ජීවිතයටත් බෙහෙවින් උපකාරී වන නිසා, අප්‍රමාදීව සෑම කටයුත්තකදීම පිං රැස් කර ගන්නත් හුරු පුරුදු වෙන්න ඕන. ඒක නිවන් මගටත් ඒකාන්තයෙන්ම උපනිශ්‍රය වෙනවා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ප්‍රසාද් ද සිල්වා**
**පරිපාලන නිලධාරී**
**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය**

*05 වෙනි පිටුවෙන්...*

# නිවන් මාර්ගයේ මුල පටන් ගැන්ම ....

නොකර සමාජයේ ඉන්න බෑ කියන මානසිකත්වය ඔළුවට එනවා. ඒවා නොකර හොඳට සමාජයේ හිටපු කෙනාගෙ ඔළුවට, අර අසත් පුරුෂයො විස බීජ දානවා. ඉතින් ඒකම බලවත් වෙලා, අර අසත් පුරුෂයන්ගෙ ගොඩටම වැටෙනවා. එහෙම වැටුනොත් මොනවද කරන්න බැරි? අසත් පුරුෂ ඇසුර ඒ තරමටම භයානකයි. ''විතින්න පරලෝකස්ස නත්ථි පාපං අකාරියං'' - **පරලොවක් ගැන නොතකන කෙනාට කරන්න බැරි පාපයක් නෑ** කියල තමයි මේකෙන් පෙන්වන්නෙ. ශ්‍රාවක පාරමිතා පුරන කෙනෙකුට පවා මේ අසත් පුරුෂ ඇසුර නිසා ගැලවීමක් නෑ. ඒ අයගෙ හිත වුනත් ඕනම මොහොතක වෙනස් වෙන්න පුළුවන්. කොහොම හරි මෙතනදි ශ්‍රාවක පාරමිතාවේ බලවත්කම නිසා, නිරයෙන් කෙළින්ම චුත වෙලා මනුස්සයෙක් වුණා. ඒක අති දුර්ලභ අවස්ථාවක්. අනෙක් අයට ලේසියෙන් එහෙම අවස්ථාවක් ලැබෙන්නෙ නෑ. මේ ගැන ලොකු විස්තරයක් 20 වන කලාපයේ ''මැරෙන බහුතරය සතර අපායට යන හැටි'' කියන ලිපියේ සඳහන් වෙනවා.

ඉතින් අවසානයේ උන්වහන්සේ මහා මොග්ගල්ලාන නමින් අරිහත් ඵලයට පත්වෙනවා. ගෞතම බුදුන් වහන්සේට පමණක් දෙවැනි, මහා ඍද්ධි ප්‍රාතිහාර්ය පාන්න පුළුවන් හැකියාවක් ලැබෙනවා. මහ මෙර වුනත් මහපට ඇඟිල්ලෙන් හොලවන්න, කම්පා කරන්න පුළුවන් ශක්තියක් ලැබෙනවා. අවසානයේ, අර තමන්ගෙ මවුපියන් තලා පෙලා මරා දමපු පාපයේ ශේෂයන් ඵල දීල, ඇටකටු ටික වී ඇට ප්‍රමාණයට කැඩෙනකල් හොරු රැලකගෙන් ගුටි කාල, ඒ හේතුවෙන්ම පිරිනිවන් පෑවා. දැන් මේ කාරණා තුළින් නිවන් මාර්ගයේ පටන් ගැන්මත්, ඒ තුළින් නිවන කරා යන අති දීර්ඝ සංසාර ගමනෙදි මුහුණ දෙන්න සිද්ධ වෙන භයානකත්වයත් තේරුම් ගන්න ඕන.

*අපදාන පාලිය 1 මහාමොග්ගල්ලාන ථේරාපදානය ඇසුරින් සකස් කළේ:*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# සීමා නොකළ යුතු අනන්ත බුදු ගුණ...

කිසියම් දෙයක හෝ කිසියම් කෙනෙකුගේ ගුණයක් කියන්නෙ ඒ දෙයට හෝ ඒ කෙනාට අයිති ගති ලක්ෂණයක් අනුව. වීදුරුවක ''බිඳෙන බව'' කියන්නෙ වීදුරුවලට අයිති ගති ලක්ෂණයක්, ගුණයක්. ලීයක තද බව කියන්නෙ ඒකට අයිති ගති ලක්ෂණයක්. ලීයට අයිති සියලු ගති ලක්ෂණ නෙවෙයි ''තද බව'' කියන්නෙ. ගින්නෙන් දැවිය හැකි බව, කපන්න, ඉරන්න පුළුවන් බව තවත් ලක්ෂණ 2 ක්.

මවු ගුණ ගත්තොත්, අම්මා කරුණාවන්තයි, උපේක්ෂාවෙන් ප්‍රශ්නවලට මුහුණ දෙන්න දන්නවා .... (බොහෝ මවුවරු ළඟ තියෙන ගුණ දෙකක්) ආදී වශයෙන් කියන ගුණවලින් එක ගුණයක් විස්තර කරන්න ගියොත්, කරුණා ගුණය ගොඩනැගිල තියෙන්නෙ එක මොහොතකින්ද? එක දවසකින්ද? එක මාසයකින්ද? අපේ කෙටි ජීවිත කාලය තුළ දැක්ක ඒ කරුණා ගුණය, අම්මා පෙර සසර පටන් පුරුදු පුහුණු කරගෙන ආපු දෙයක්. අපි ඒක දකින්නෙ කිසියම් අවස්ථාවකදී අම්මා කරුණාව මතු කරන ආකාරය තුළින්. ඒ දැකීම මූලික කරගෙන තමයි අපි ඒ කරුණා ගුණය විස්තර කරන්නෙ. මේ වගේ අවස්ථා කීපයක් අනුසාරයෙන් අම්මගෙ කරුණා ගුණය හරියාකාරව විස්තර කරන්න පුළුවන්ද? එහෙම කරන විස්තරය අසම්පූර්ණයි.



මෙන්න මේ වගේ බුදු ගුණ මෙනෙහි කරන ආකාරය පිළිබඳවත් යම් වැටහීමක් ඇති කර ගන්න එක හොඳයි. බුදු ගුණ අනන්තයි. ඒ අනන්ත බුදු ගුණ, ගුණ 9 කට කැටි කරල ඉතිපි සෝ භගවා අරහං... ආදී වශයෙන් බුදුන් වහන්සේලා දේශනා කරල තියෙනවා. **මේ එක බුදු ගුණයක් නිවැරදිව විස්තර කරන්න පුළුවන් වෙන්නෙ තවත් බුදු කෙනෙකුට විතරයි. වෙනත් දේශනා කිසිවක් නොකර ඒ එක බුදු ගුණයක්ම විස්තර කළත්, ඒ බුදුන් වහන්සේගේ ආයු කාලය ඉවර වෙනව මිසක් බුදු ගුණය දේශනා කරල ඉවර කරන්න බෑ කියල බුද්ධ දේශනාවෙම** තියෙනවා. අනන්තයි කියන කාරණය පිළිබඳව මේ අනුව වටහා ගන්න ඕන.

බුදු ගුණයක් අනන්ත වෙන්නෙ කොහොමද? මේ එක එක ගුණයක් ගොඩනගන්න, පූර්ණ කරන්න සාරාසංඛ්‍ය, අටාසංඛ්‍ය, සොළොසාසංඛ්‍ය ආදී වශයෙන් කල්ප ලක්ෂ ගණන් අති දීර්ඝ කාලයක් පාරමිතා පුරල තියෙනවා. අසංඛ්‍ය කියන්නෙ සංඛ්‍යාවකින් ප්‍රමාණ කරන්න බැරි බව. එහෙනම් අනන්තයි. අසංඛ්‍ය කාලයක් තුළ ගොඩනගන ගුණය ඒ විදියට ගොඩ නගන්න මොන තරම් අවස්ථාවන්වලට මුහුණ දෙන්න ඇත්ද? රහසින්වත් පවු නොකළ සේක කියල කිව්වොත්, රහසින්වත් පවු කරන්න එළඹුන අවස්ථා කොපමණක් නම් මග හැරල පවු නොකර ඒ ගුණය පුරන්න ඇත්ද? ඒ ඒ අවස්ථාවලදී දරන ලද අප්‍රමාණ වෙහෙස, වින්ද වේදනා, පවු නොකිරීමට කරන ලද වීර්යය, අධිෂ්ඨානය කොහොම විස්තර කරන්නද? ඒ සියල්ලම ඒ ගුණයට අයිතියි. ඒ පුණ්‍ය සංභාර තුළින් ගොඩනැගුණ ශක්තිය මොන ඒකකයකින් මනින්නද ? ඒ නිසයි බුදු ගුණ අනන්ත වෙන්නෙ.

රා පොවල මත්වෙච්ච නාලාගිරි ඇතා තමන් ඉදිරියට එන බව නොදැනද බුදුන් වහන්සේ වැඩියෙ? රහසක් නැති, ආවරණයක් නැති අනාවරණඥානයෙන් ඒ සියල්ල දැක්කා. ඇතා දමනය වෙලා යහපතක් සැලසෙන බවත් දැක්කා. එදා එක්තරා මවක් බුදුන් වහන්සේ කෙරෙහි ඇති ගෞරවයෙන්, උන් වහන්සේට අනතුරක් නොකර මේ දරුවා ගනින් කියල තමන්ගෙ දරුවා ඇතා ළඟට විසි කළා. ඇතා දරුව දෙසට යොමු වුනාම බුදුන් වහන්සේ ''මා කුංජර නාග මාසෙ දෝ ....'' ආදී වශයෙන් දේශනා කරපු ගාථාව අදත් ඇතුන් දමනය කරන්න භාවිතා කරනවා. අරහං බුදු ගුණයේ ඇතුළත් වන තවත් බුදු ගුණයක් තමයි, දමනය කළ යුතු වූවන් දමනය කර සෙත සැලසීම. අංගුලිමාල ඉදිරියට බුදුන් වහන්සේ වැඩියෙත්, ඔහුට ප්‍රඥාවත්, පිරුණු පිනත් ඇති බව අනාවරණඥානයෙන් දැකපු නිසා මහා කරුණාවෙන්මයි. **එහෙනම් මහා කරුණාව කිව්වෙත් අරහං බුදු ගුණයේම ඇතුලත් වන තවත් බුදු ගුණයක්.** මේ විදියට සියලු කෙළෙස් අරටු සිඳපු නිසා තමයි බුදු බව ලැබුවෙ. බුදු බව ලැබුව නිසා තමයි අභිඥා බල, පටිසම්භිදා ඥාන, අනාවරණඥාන ආදිය ලැබුවෙ, මහා කරුණාව සියලු ලෝ සතුන් කෙරෙහි පැතිරෙව්වෙ. මේ විදියට අරහං බුදු ගුණය කියන්නෙ අනන්තව පැතිරුණ ගුණ පෙදෙසක්.

මේ ශරීරය සත්වයෙක්, පුද්ගලයෙක් නෙවෙයි, හේතු ඵලයක් කියල විවිධාකාරයෙන් දැක්කා. මේ ශරීරය සකස් වෙලා තියෙන කොටස් බෙද බෙදා බැලුවම, අන්තිමට සතර මහා ධාතූන්ගේ සකස් වීමක් කියල දැක්කෙ භගවා කියන බුදු ගුණයෙන්. බෙදා බලන වත හෙවත් භගවතා කියන බුදු ගුණයෙන් අරහං බුදු ගුණය මතු වෙනවා. මේ වගේ මේ බුදු ගුණ 9 තුළම එකිනෙක අනෙක් බුදු ගුණත් තියෙනවා. **එක එක බුදු ගුණයක් අනන්ත නම්, අනන්තය තුළ සියල්ලම තියෙනවා. අරහං බුදු ගුණය වඩන කොට අනෙක් බුදු ගුණත් යම් ප්‍රමාණයකට වැඩෙනවා.** ඒ නිසා බුදු ගුණ අනන්තයි කියල විස්තර කරනවා මිසක්, විස්තර කරල ප්‍රමාණ කිරීමක් කරන්න බෑ. ඒ ඒ බුදු ගුණය තුළ එබඳු දිගු කලක පටන් පුරුදු පුහුණු කරපු ශක්තිය ගැබ් වෙලා තියෙනවා.

අපිට දකින්න තියෙන උදාහරණයකින් මේ ගැන හිතල බැලුවොත්, යම්කිසි දුක් කරදරවලට නිතර නිතර මුහුණ දෙන්න සිදු වුන කෙනෙක් කාලයක් ගියාම ඒ ගැන මොකද කියන්නෙ. ''මගේ හිත දැන් ඔවායින් කම්පා වෙන්නෙ නෑ. මට දැන් ඔව ඕන දෙයක් දරාගන්න පුළුවන්....'' හැබැයි දරාගන්න පුළුවන් කියන මේ ශක්තිය, ඇත්තෙන්ම ඊට වඩා දරාගන්න බැරි අවස්ථාවක් ආවම බිඳෙනවා. නමුත් මේ පුංචි කරදරය ටික කලක් ඉවසල, ඉවසන්න පුරුදු කරගැනීමේ ශක්තිය ලබා ගැනීමත් අපි මහ ඉහළින් ලොකු ශක්තියක් ගොඩ නැගුන විදියට කියනවා. එහෙනම් අසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනින් පුරුදු පුහුණු කරපු ගුණයක තියෙන ශක්තිය කොහොම ප්‍රමාණ කරන්නද?

ථේරාපදාන පාලියට අනුව පෙර අත්බැවක සැරියුත් මහ රහතන් වහන්සේ සුරුචි කියන තාපසයෙක් වෙලා අනෝමදස්සි බුදුන් වහන්සේගෙ ප්‍රඥා ගුණ වර්ණනාවක් කරල තියෙනවා. මේ පිළිබඳ දිගු විස්තරයක් හෙළ බොදු පියුම 21 වන කලාපයේ සඳහන් වෙනවා. අසමසම, අනන්ත බුදු ගුණ වර්ණනා කිරීමේ ආනිසංස අප්‍රමාණ වන න්‍යාය ධර්මය ඒ ඇසුරින් වටහා ගන්න පුළුවන්. ඒ වගේම මේ අනන්ත බුදු ගුණ මෙනෙහි කරල, ඒ ගුණයන්ට උපහාර පූජා පැවැත්වීමෙන් ලබන්න පුළුවන් ශාන්තියත් අප්‍රමාණයි. ඒ නිසා බුදු ගුණ මෙනෙහි කරන කොට ''කෙළෙස් අරටු සිඳලූ හෙයින් අරහං නම් වන සේක....'' ආදී වශයෙන් ගුණ සීමා කරන්න හොඳ නෑ. අනන්ත වූ අරහං බුදු ගුණයට මම නමස්කාර කරමි, නැමී සිටිමි කියන අදහස තමයි ''නමෝ අරහං'' කියන කොට හිතට ගන්න ඕන. අනන්ත වූ සම්මා සම්බුද්ධ ගුණයට මම නමස්කාර කරමි, නැමී සිටිමි කියන අදහස තමයි ''නමෝ සම්මා සම්බුද්ධෝ'' කියන කොට හිතට ගන්න ඕන. මේ විදියට බුදු ගුණ 9 ම මෙනෙහි කිරීමෙන් අප්‍රමාණ ශාන්තියක් සැලසෙනවා.

මේ එක එක බුදු ගුණයක් අනන්තයි කිව්ව වගේ **දහම් ගුණ, සඟ ගුණ ගත්තමත් ඒ එක එක ගුණයක් අනන්තයි. බුදුන් වහන්සේගේ මහා කරුණා ගුණය, මහා සාගරය වගෙයි කිව්වත් ඒක වැරදියි. මොකද මේ මහ පොළව හා සම්බන්ධ සාගරය කියල ඒක ප්‍රමාණ කරන්න පුළුවන්** නිසා. නමුත් අනන්තයි කියන එක අනන්ත අවකාශය වගෙයි. ප්‍රමාණ කරන්න බෑ. බුදු ගුණ වඩන කොට සිද්ධ වෙන්නෙ මොකක්ද? බුදු, දම්, සඟ ගුණ අනන්තයි. ඒ අනන්තය තුළ සියල්ලම ඇතුළත් වන නිසා එක බුදු ගුණයක මාත්‍රයකට අපි ඇතුළත් වුනා නම්, අනෙක් ගුණ 23 ටම යම්කිසි ප්‍රමාණයකට ඇතුළත් වුනා වෙනවා. අපි ඉන්නෙ ඒ අනන්ත අවකාශයේම යම් කිසි ඉඩ ප්‍රමාණයක. ඒ ඉඩ ප්‍රමාණයේ ඉඳගෙන දකින්න පුළුවන් ගුණ ප්‍රමාණය වඩා ගැනීම අපට නිවන් දකින්න ප්‍රමාණවත්.

හැම දරුවෙක්ම මවු ගුණ දකිනවද? බොහෝ විට දරුවන් කටයුතු කරන ආකාරය දැක්කම පේන්න තියෙන්නෙ, තමන්ගෙ මල්ල පුරව ගන්න ගුණ දකින ආකාරය තමයි. තමන්ට, තමන්ගෙ දරුවන්ට, බිරිඳට හෝ ස්වාමියාට හොඳ ආදර කරුණාව ඇතුව ඒ අයගෙ වැඩ කටයුතුවලට උදව් උපකාර කරගෙන ඉන්නව නම්, ඒ අම්මා හොඳ ගුණවත් කෙනෙක්. සමහර මවුවරුන්ට පෝය දාට සිල් ගන්නත් දරුවන්ගෙන් නිවාඩු ඉල්ලන්න වෙලා තියෙනවා. ඒ අය කවදාවත් මවු ගුණ දැකල නෑ. දැනගෙනත් නෑ. මේ විදියට බුදු ගුණ දකින අයත් ඉන්නවා. කරදර, නඩු හබ, ලෙඩ දුක් ආවම බුදු ගුණ සොයාගෙන යනවා. සම කරුණාව ඇති මහා කාරුණික බුදු ගුණය නිසා, ඒ අයටත් සෙතක් ශාන්තියක් ලැබෙනවා.

කිසිවක් කර කියාගන්න බැරි මස් කැටියක් වගේ අනාත අසරණ කුඩා කාලයේ මගේ අම්ම ලේ කිරි කරල පොවල පෝෂණය කරල ලෙඩ දුකට පිහිට වෙලා, මළ මුත්‍ර සෝදල පිරිසිදු කරල මාව හදා වඩා ගත්තා. මට අවවාද දීල පවින් වළකල මා යහමග යැව්වා.... මේ ආදී වශයෙන් කෘතෝපකාර සිහි කරන ගුණයෙන් මවු ගුණ දැකීම තමයි යහපත් ගුණ දැකීම වෙන්නෙ. මේ වගේ බුදු ගුණ මෙනෙහි කරන කොටත්, සතර අපා ආදී මහා භයානක දුක් සහිත සසර කතරින් මිදීමට මග හෙළි කළ උත්තම ශාස්තෘන් වහන්සේය, උන් වහන්සේ දෙසූ දහම් අසා බොහෝ පිරිස් නිවී සුවපත් වී ඇත, මමද ඒ විශ්වාසයෙන් දහම් අසා මේ භයානක සසරේ සැරි සැරීම අසාර බව අවබෝධ කරගත්තෙමි, ලෝකයා මහා වටිනා දේවල් හැටියට සලකන ගේ දොර ඉඩ කඩම්, රැකී රක්‍ෂා, දූ දරුවන්, හිත මිතුරු පිරිස් අත්පත් කර ගන්න අප්‍රමාණ වෙහෙසක් වින්ද හැටි සිහි කරන කොට, ඒ අත්පත් කර ගත් හැම දෙයක්ම වහ වහා ගෙවී ගිය ආස්වාද මාත්‍රය පසු පසින් පැමිණි ආදීනව ගොඩක්ම පමණක් වුනා, ඒ සියල්ලේ අසාරත්වය අවබෝධ කරගත් නිසා, අද මම ගෙවන සැහැල්ලු සාමකාමී ජීවිතයේ සැනසීමක් දකිමි, මේ දහමින් නැවත උපන්නා වැනි මම උන් වහන්සේගේ දරුවෙක් වෙමි, මේ මග කියා දුන් උන් වහන්සේ මාගේ ශාස්තෘන් වහන්සේය. සතුන් මැරීම, සොරකම් කිරීම, සුරා සූදු දුරාචාර ආදිය නොකළ යුතු බව උන් වහන්සේ දේශනා කර ඇත. උන් වහන්සේ ගුරු කොට මම සත්ව හිංසාවෙන් වැළකෙමි, සොරකමින් වැළකෙමි. සුරා සූදු දුරාචාරවලින් වැළකෙමි....

මේ විදියට දස අකුසලයෙන් වෙන් වෙන්න අදිටන් කරගෙන සුචරිතයේ පිහිටීම බුද්ධානුස්සතිය හෙවත් බුදු ගුණ මෙනෙහි කළ යුතු ආකාරයක්. මේ විදියට උන් වහන්සේ පිය කොට, ගුරු කොට සිතා දස අකුසලයෙන් වැළකී සුචරිතයේ පිහිටන තැනැත්තාට වගේම, නිවැරදිව නව අරහාදී බුදු ගුණ සජ්ජායනා කරන තැනැත්තාටත් බුදු ගුණ ආරක්‍ෂක වළල්ලක් විදියට පිහිටල භය තැති ගැනුම්, ලොමු දැහැ ගැනුම් දුරු වෙලා, මහත් වූ ශාන්තියක් ලැබෙන බව ධජග්ග සූත්‍රයේ මේ විදියට විස්තර කරල තියෙනවා. ''මහණෙනි, තොපට බියක් හෝ තැති ගැන්මක් හෝ රෝමෝද්ගමනයක් හෝ ඉපදුනේ නම් මාව සිහි කරවු, කෙසේද? ඉතිපි සෝ භගවා අරහං...'' ආදී වශයෙන්.

නව ගුණ ගාථාවෙන් කියවෙන ගුණ පද 9 නිවැරදිව සජ්ජායනා කිරීමත් බුද්ධානුස්සතියක්, බුදු ගුණ මෙනෙහි කිරීමක්. මෙහිදී බුදුන් වහන්සේලා දේශනා කරපු ධර්මය කවදාවත් කිසිවෙකුටවත් බොරු කරන්න බෑ. එහෙම බොරු කරපු කෙනෙකුත් නෑ. මතුත් කිසිවෙකුට බුද්ධ දේශනා බොරු කරන්න බෑ. ඒ නිසා උන් වහන්සේලා දේශනා කරපු බුදු ගුණත් සත්‍යයි. මෙහෙම කියල විශ්වාසයෙන්, ගෞරවයෙන් නිවැරදිව ගුණ සජ්ජායනා කළ යුතුයි. අද බොහෝ අවස්ථාවල බුදු ගුණ සජ්ජායනාව විවිධාකාරයෙන් කරන බව ඇහෙනවා.

ඉතිපිසෝ භගවා - අරහං සම්මා සම්බුද්ධෝ - විජ්ජාචරණ සම්පන්නෝ - සුගතෝ ලෝකවිදූ - අනුත්තරෝ පුරිස ධම්ම සාරථී - සත්ථා දේව මනුස්සානං - බුද්ධෝ භගවා තී

මේ විදියට පද වෙන් කරල ගායනා කළාම බුදු ගුණ 7 යි තියෙන්නෙ. එයිනුත් ඉතිපිසෝ කියල කිව්වම නිවැරදි ගුණය එන්නෙ නෑ. පෙළ පොත්වල පැහැදිලිව ''ඉතිපි සෝ භගවා ....'' කියල පද වෙන් කරල තියෙනවා. ඒත් සජ්ජායනා කරන්නෙ ඉතිපිසෝ කියල **''ළමයාගෙ දකුණු කකුල'' යන්න ''ළමයාගේද කුණු කකුල'' කියල කිව්වොත් අර්ථය කොච්චර නම් වෙනස් වෙලාද කියල විමසල බලන්න. ඉතිපිසෝ කියල කිව්වමත් මෙන්න මේ වගේ ගුණ අර්ථය සහමුලින්ම වෙනස් වෙනවා.**


ඉතිපි සෝ භගවා, අරහං - සම්මා සම්බුද්ධෝ - විජ්ජාචරණ සම්පන්නෝ - සුගතෝ - ලෝකවිදූ - අනුත්තරෝ පුරිස ධම්ම සාරථී - සත්ථා දේව මනුස්සානං - බුද්ධෝ - භගවා තී කියල නිවැරදිව ගුණ පද 9 වෙන් වෙන්ව සජ්ජායනා කිරීමෙන් බුදු ගුණ ශාන්තිය ලබන්න පුළුවන්.

ඒ වගේම මේ අනන්ත බුදු ගුණ සිහි කරල ගුණ උපහාර පූජා පැවැත්වීමෙන් නිවන් මග පුරන්න තියෙන බොහෝ බාධක දුරු කර ගන්න පුළුවන්. ආනන්තරීය පාප කර්ම නොවන, අනෙකුත් පාප විපාක අවම කරගන්න පුළුවන්. සසර ණය ගනුදෙනු පියව ගන්න උපකාර කර ගන්න පුළුවන්. විදර්ශනාත්මකව මල්, සුවඳ දුම්, පහන් පූජාවලින් ගුණ උපහාර පූජා පවත්වන හැටිත්, ඒවා නිවනට උපකාර වන හැටිත් පසුගිය කලාපවලින් පැහැදිලි කළා.

15 වෙනි පිටුවට...

**අභයරතනාලංකාරය - 23**

# ඇස්වහ කටවහ සම්බන්ධයෙන් සත්‍ය අත්දැකීම් කිහිපයක්....



**- වහරක අභයරතනාලංකාර හිමි**

*(පසුගිය කලාපයෙන් - අධ්‍යාත්මික ශක්තියෙන් ගුප්ත රෝග සුවපත් කළ හැටි... ...)*

ඇස්වහ කටවහ මගින් ලෙඩ රෝග කරදර ඇති වෙන හැටි පසුගිය කලාපයෙන් විග්‍රහ කළා. දැන් මේ විස්තර කරන්න යන්නෙ, මට අත්දකින්න ලැබිච්ච ඒ වගේ සිද්ධි කිහිපයක්.

අපේ ගම් පළාතෙ හොඳට ගොවිතැන් බත් කරන්න දන්න බොහොම දක්ෂ පුද්ගලයෙක් හිටියා. ඔහු ගොවිතැන් වගා කටයුතු වගේ වැඩකට අත ගැහුවොත් ඒක බොහොම හොඳට සශ්‍රීක වෙනවා. ඒ වගේම ඔහු හොඳ ගුණ යහපත් කෙනෙක්. තමන්ට ඉතිරි වෙච්ච පොඩි බිම් කොටසක පස සකස් කරල, පෝර වර්ග දමල, හොඳට ක්‍රමානුකූලව සාත්තු කරල වගා කරපු රබර් ගස් 10 කුත් ඔහුට තිබුණා. මේ රබර් ගස් 10 ගත්තම ඒ කාලෙ හැටියට රාත්තල් 10 ක (කිලෝ ග්‍රෑම් 5 ක) පමණ රබර් කිරි ඒ ගස් 10 න් එක වරකට ගන්න පුළුවන්කම තිබුණා. ඒක සාමාන්‍ය රබර් වගාවකින් ගන්න බෑ. ඒ ගස්වල රබර් කිරි කැපීම් ආදියත් හොඳට සිද්ධ කළා. ඒවායේ කිරි එනකොට පොල්කටු තියල හරි යන්නෙ නෑ. ලොකු ටින් තියන්න ඕන. ඒ ගස් දහයෙනුත් එක රබර් ගහක් තිබුණා, ටින් එකක් තිව්වත් උතුරල යනවා. ඒ නිසා අනෙක් ගස්වලට තියනවටත් වඩා ලොකු ටින් එකක් තමයි ඒ ගහට තියල තිබුණෙ.

මේ අතර එක්තරා මනුස්සයෙක් හිටියා, ඔහු යමක් දිහා බලල යමක් කිව්වොත් ඒක සාප වුණා වගෙයි දවසින් දෙකෙන් ක්‍රියාත්මක වෙනවා. මේ මනුස්සය දවසක් මේ රබර් වත්ත ළඟින් යන කොට, අර රබර් කිරි ටින් එක පිරිල උතුරල යනව දැක්කා. දැකල මෙහෙම කිව්වා. ''... අයියට මේ ගස් දහයම ඇති, වෙන මුකුත් ඕන නෑ.'' ඔහු එච්චරයි කිව්වෙ. ඊළඟ දවස වෙන කොට අර එක ගහකවත් කිරි බිංදුවක් නැති වෙන්නම හිඳිල තිබුණා. ඊට පස්සෙ කිරි ගන්නම බෑ. පට්ට තැම්බිලා. හේතුවක් හොයන්නත් බෑ. සාමාන්‍යයෙන් පට්ට තැම්බෙන්නෙ වතුර තියෙද්දි කිරි කැපුවොත් තමයි. මොකද එතකොට ඒ වතුර, පට්ට ඇතුළින් එක මොහොතකින් ඇතුළට යනවා. එතකොට කිරි නාල සිදුරු වැහෙනවා. ඒ වගේම විස බැක්ටීරියා ගියොත් තැම්බෙනවා. මේ විදියට විවිධ හේතු තියෙනවා. කොහොම හරි මේ විදියට පට්ට තැම්බුනාම සාමාන්‍යයෙන් ඒ ගහ නැවතත් හරි යන්නෙ නෑ. ඊට පස්සෙ ගහෙන් වැඩකුත් නෑ. ඒ තරමටම ගහ විනාස වෙනවා. මෙන්න මේ වගේ සිද්ධියක් අර ගස් 10 ටත් සිද්ධ වුණා. ඊළඟ දවසෙ කිරි කැපුවට මොකවත් ගන්න දෙයක් තිබුණෙ නෑ.

ඒ වගේම මේ රබර් ගස් 10 ට ටිකක් එහායින්, මේ රබර් වගාව හිමි පුද්ගලයටම අයිති වතුර පිරිච්ච හොඳ ළිඳක් තිබුණා. දැන් අර මනුස්සය මේ රබර් ගස් ටිකත් පහු කරගෙන ළිඳ ළඟට ගිහින් බලන කොට ළිඳේ වතුර කට මට්ටමටම පිරිල, හෝ... ගාල උතුරල යනව දැක්කා. මෙහෙම ළිඳක් තියෙනව නම් ගමටම වතුර දෙන්න පුළුවන් කියල, අර ළිඳ දිහා බලල මේ මනුස්සය යන්න ගියා. පුදුම සිද්ධිය කියන්නෙ ඊළඟ දවස වෙන කොට ළිඳත් හිඳිල. දැන් මේ එකම දවසෙ වෙච්ච සිදුවීම් නිසා අර රබර් ගස්වල කිරිත් නැති වෙලා, ළිඳත් හිඳිල ගියා.

දැන් ඉතින් මේකට මොකක්ද කරන්නෙ කියල මේක අයිති පුද්ගලය කල්පනා කරනවා. කොහොම හරි ඔහු මේ කාරණය දැනගෙන, මේකට මොනව හරි කරන්න ඕන කියල කල්පනා කරන කොට, තමන් දන්න හඳුනන මලයාලි ගුරුකම් දන්න කෙනෙකුත් ඒ පැත්තෙ හිටියා. එහෙම දැනගෙන මේකට මොකක්ද කරන්නෙ කියල දැනගන්න මේ ගුරුකම් දන්න කෙනාව හමුවෙන්න ගියා. ඔහු ළඟ එක්තරා පැරණි කෙම් ක්‍රමයක් තිබුණා. යම් කිසි පුද්ගලයෙක්ගෙන් එන ඇස්වහ කටවහ දෝස සම්පූර්ණයෙන්ම නවත්වනවා කියන එක තමයි ඒකෙන් අදහස් කළේ. හැබැයි ඒක ටිකක් ගැඹුරු ක්‍රමයක්. දැන් මේ ක්‍රමයෙ සත්‍යය ඔප්පු කරල පෙන්වන්න ඔහු ඊට අමතරව තවත් දේකුත් සිද්ධ කළා. ඒක මේ කෙම් ක්‍රමයට අදාල නෑ. සත්‍යය පෙන්වල විශ්වාසය ඇති කරන්න කියලයි ඔහු ඒක කළේ. ඒ කියන්නෙ තනිකරම සැර ඇසිඩ් ටිකක් අල්ලට අරගෙන ඒකෙන් ඔහු මූණ හෝදනවා. නමුත් හම යන්නෙවත්, පිච්චෙන්නෙවත් මොකුත් නෑ. හරි සැරයි. නමුත් පුද්ගලයට මොකුත් වෙන්නෙ නෑ. ඔහු ඒක කරල පෙන්වනවා. සමහර විට මොනව හරි බේතක් සම්බන්ධ කරල ඒක කරනවද දන්නෙත් නෑ. කොහොම හරි ඒකෙන් ඒ පුද්ගලයට හානියක් වෙන්නෙ නෑ.

දැන් මේ රබර් ගස් අයිති පුද්ගලය අර ගුරුකම් දන්න කෙනා හම්බ වෙන්න ගිහින් තමන්ට වෙච්ච සිද්ධිය කියල, මේකට මොකක්ද කරන්නෙ කියල අහපුවම, මේ විදියට කෙමක් කිව්වා. හැබැයි ඒ කෙම් ක්‍රමයෙන් කිසි කෙනෙකුට කරදරයක්වත් වස විසක්වත් වෙන්නෙ නෑ, තමන්ටත් යහපතයි, ලෝකයටත් යහපතයි කියල තමයි ඔහු කියල තිබුණෙ. ඒ ඇස්වහ කටවහ තියෙන පුද්ගලය කොහේ හරි ඉඳගෙන හෝ හිටගෙන හෝ හිටපු තැනකින් මොනව හරි පයට පෑගිච්ච පස් ටිකක්, වැලි ටිකක් හෝ තණ කොළ ටිකක් හරි කමක් නෑ, පිටි අතින් අතට අහු වෙන ප්‍රමාණයක් ගන්නවා. ඒ කියන්නෙ අත පිටිපස්සට අරගෙන ඒ දිහා බලන්නෙ නැතිව පහත් වෙලා අහුරක් ගන්නවා. එහෙම අරගෙන කතා නොකර ගෙදර ගෙනත් තියා ගන්නවා. ඊට පස්සෙ ඒ ඇස්වහ කටවහ තියෙන ☞

පුද්ගලයගෙ ගෙදරට රහසිගතව යන්න ඕන. මේක හරි අමාරු වැඩක්. එහෙම ගිහින් අර විදියටම බලන්නෙ නැතිව, අත පිටිපස්සට අරගෙන උඩට උස්සල, ඒ ගෙදර වහලෙ තියෙන්නෙ පොල් අතු නම් පොල් අතු රොඩු ටිකක්, උළු වහලයක් නම් රීප්පයක් හරි පරාලයක් හරි රැහැල රොඩු පොඩ්ඩක් හූර ගන්නවා. ඒකත් සද්ද නැතිව අරන් එනවා. දැන් අර පයට පෑගිච්ච වැලි හෝ පස් හෝ තණකොළ ටිකට මේ රොඩු ටිකත් එකතු කරනවා. ඊට පස්සෙ ඒකට අබ, ලුණු කැට, හොඳට සැරට පැහිච්ච ගම්මිරිස්, මිරිස් කියන මේ වර්ග 4 ටික ටික දානවා. දැන් මේ ටික ඔක්කොම එකට දාල කලවම් කරල, තුංමං හන්දියක් වගේ තැනක පොල් කටු අඟුරු දාල පත්තු කරනවා. ඒ කියන්නෙ පොල් කටු පිච්චිලා අඟුරු බැස්සම අර මිශ්‍රනය ඔක්කොම පිච්චෙන්න, අහක බලාගෙන ඒ අඟුරු ටිකට හලනවා. එතකොට මිරිස්, ලුණු කැට, ගම්මිරිස්, අබ කියන මේවා චිරි චිරි ගාල, චට චට ගාල පිච්චි පිච්චි, පුපුර පුපුර දුම නැගෙන්න පටන් ගන්නවා.

දැන් මෙතනදී පුද්ගලයගෙ ඇස්වහ කටවහ කියල දෙයක් තිබුණ නම්, ඒ දුම සාමාන්‍ය කෙනෙකුට කිසිම අපහසුවක් නැතිව ආස්වාස කරන්න, උරන්න පුළුවන්. කිසිම සැරක් කැස්සක් එන්නෙ නෑ. නිකන් සාමාන්‍ය දුමක් වගේ. ඒ කියන්නෙ ඒ පුද්ගලයගෙ ඇස්වහ කටවහ තිබුණ නම් ඒ එන දුම සැර නෑ. හැබැයි ඇස්වහ කටවහ කියල දෙයක් තිබුනෙ නැත්නම්, දුම යන්තමින් එනකොටත් කැස්ස එනවා. පැත්ත පළාතෙ ඉන්න බෑ, හරි සැරයි. මේ ක්‍රමයෙන් ඇත්තටම ඇස්වහ කටවහ තිබුණද නැද්ද කියලත් හොයාගන්න පුළුවන්.

මෙතනදී ඒ පුද්ගලයගෙ විසට, විසෙන් විස පුච්චනව වගේ ක්‍රමයක් ක්‍රියාත්මක වෙනවා. එහෙම නැත්නම් ඒ පුද්ගලයට සම්බන්ධ අමනුස්ස කොටස් ඇදිල එන්නත් පුළුවන්. මොකද මේ විදියට ලුණු, මිරිස් වගේ දේවල් තුංමං හන්දියක දාල පුච්චනව කියන්නෙ, එතන ඉන්න අමනුස්සයින්ට එක්තරා ආකාරයක කැප කිරීමක් වෙනවා. අර වගේ මොනව හරි පයට පෑගිච්ච දෙයක් අරගත්තම, ඒ ඇස්වහ කටවහ තියෙන කෙනාවත් මෙතනදී කැප වෙනවා. හැබැයි ඒ කැප කරන්නෙ මනුස්සයා මරන්න, කරදර කරන්න වගේ දේකට නෙවෙයි. අර විස ටික අයින් කරන්න. එතකොට විසට ප්‍රතිචාර දක්වන යම්කිසි අමනුස්ස කොටස් ඉන්නව නම්, ඒ අයගෙ හිමිකම අරගෙන ඒ අයත් ඒකට ප්‍රතිචාර දක්වනවා. ලුණු මිරිස් වගේ දෙයක් දුන්නම ඒ අමනුස්ස ලෝකෙ අයට දොළ පිදේනියක් දුන්න වගේ වෙනවා. එතකොට අමනුස්සයො මොකද කරන්නෙ, අර ඇස්වහ කටවහ තියෙන මනුස්සයට තියෙන්නා වූ ඒ ගති ස්වභාවයට ප්‍රතිවිරුද්ධ දෙයක් පතුරනවා. එතකොට අර විස එන්නෙ නැතුව යනවා. ඊට පස්සෙ ඒ මනුස්සය මොනව කිව්වත් වැඩක් වෙන්නෙ නෑ. සමහර විට ඒ මනුස්සයගෙ කටින් ඒ වගේ දෙයක් පිට වෙනවත් එක්කම, අර අමනුස්ස කොටස්වලටත් යම්කිසි කැප කිරීමක් කරල තියෙන නිසා, ''ඕකා කියන ඒවා කොහොමද වෙන්නෙ? ඕකා කියන ඒව වෙන්නෙ නෑ, ඕකා ඔහොම කිව්වට



ගස්වලට මොකුත් වෙන්නෙ නෑ .....'' මේ ආදී වශයෙන් ප්‍රතිවිරුද්ධ ශක්තියක් අර අමනුස්සයො විසින් යොදවනවා. ඒ ශක්තිය බලවත් නම් එහෙම, අර මනුස්සයගෙ ඇස්වහ කටවහින් කරදරයක් වෙන්නෙ නෑ. ඒ වගේම ඒ මනුස්සයට කරදරයක් වෙන්නෙත් නෑ.

ඒ වගේම සමහර වෙලාවට ඇස්වහ කටවහ තියෙන පුද්ගලයින්ට ඥාති පරපුරෙන් අරක්ගත් අමනුස්සයොත් සම්බන්ධ වෙලා ඉන්න පුළුවන්. එහෙම වුණාම ඒ පුද්ගලයො මාධ්‍ය කරගෙන ඒ අමනුස්සයො ක්‍රියාත්මක වෙනවා. එතකොට අර වගේ අබ, ලුණු, මිරිස් ආදිය දාල කැප කළාම, එතන ඉන්න තවත් බලවත් අමනුස්සයො අර පුද්ගලයට අරක් ගත්තු අමනුස්සයන්ව පලවා හරින්න පුළුවන්. එතකොටත් ඒ පුද්ගලයගෙන් එන ඇස්වහ කටවහ දෝස කැපිල යනවා. කොහොම හරි මේ කියපු කෙම් ක්‍රමය අර ඇස්වහ කටවහ තියෙන මනුස්සයටත් ක්‍රියාත්මක කළා. ඊළඟ දවසෙ ඉඳල අර රබර් ගස්වල කිරිත් තිබුණා, ළිඳේ වතුරත් හොඳට පිරිල තිබුණා. ඒ ඇස්වහ කටවහ තිබිච්ච පුද්ගලයට ඒ කෙම් ක්‍රමයෙන් කරදරයක් වෙලත් නෑ.

ඊළඟට මේ කෙම් ක්‍රමය අර විදියට හරි ගියාට පස්සෙ, මටත් ඕක කෙනෙක් ඇවිත් කිව්වා. එහෙම කිව්වට පස්සෙ, මටත් ඒ ක්‍රමය එක්තරා පුද්ගලයෙක්ගෙ විසක් කපන්න අත් හදා බලන්න ඕන කියල හිතුණා. ඉතින් ඔය ක්‍රමයටම මමත් ඒක අත්හදා බැලුවා. හරියටම හරි. පළවෙනි වතාවෙන්ම ඒ පුද්ගලයගෙ ඇස්වහ කටවහ ඉවරයි. ඊට පස්සෙ ඒ පුද්ගලය මොනව කිව්වත් ඇස්වහ කටවහ වදින්නෙ නැතුව ගියා. ඒ වගේම ඒ පුද්ගලයටත් කිසිම කරදරයක් වුනා කියල දැන ගන්න ලැබුණෙ නෑ. එහෙම කරදරයක් වෙන්නෙ නෑ කියල මටත් දැනුණා. ඒ වගේම ඇස්වහ කටවහ නැති, නිකන් කෙනෙකුටත් මම ඕක අත්හදා බැලුවා. ඒකත් සම්පූර්ණයෙන්ම අර විදියටම සිද්ධ වුණා. ඒ කියන්නෙ එතකොට එන දුම හුඟක් සැරයි. නමුත් කොයි ක්‍රමයෙන් හරි මම මේ අත්දැකපු සිද්ධියක් කිව්ව මිසක්, මේ වගේ දෙයක් කරන්න කියල කියනව නෙවෙයි. මොකද මේ ක්‍රමයෙ අනාගතය ගැන වැඩිපුර යමක් කියන්න මම දන්නෙ නෑ. නමුත් සිද්ධිය නම් ඒ කියපු විදියටම වුණා. මොකද කෙනෙකුට කොඩි විනයක් කළා වගේ දෙයක් මේකෙන් වෙන්නෙ නෑ කියල තමයි, අර මලයාලි ගුරුකම් දන්න කෙනත් කියල තිබුණෙ. මගේ අත් දැකීමට අනුව බැලුවත් එහෙම කරදරයක්, කාටවත් දැනගන්න නම් වෙලා නෑ. අර වගේ දොස් කැපෙන එකනම් සිද්ධ වුණා. ඒක කාටත් යහපත්. ඉතින් මලයාලි වගේ ක්‍රමවල වුනත් ඒ වගේ යහපත් පැති තියෙන්න පුළුවන් බව මේ වගේ කාරණාවලින් පෙනී යනවා. මේ එක ක්‍රමයක්.


**ඒ වගේම සමහර වෙලාවට, ඇස්වහ කටවහ තියෙන පුද්ගලයෙක් ඒ වගේ යමක් කියන කොටම, තවත් කෙනෙක් තුන්: කියල එක පාරටම කෙළ පාරක් අහකට ගහන ක්‍රමයකුත් තියෙනවා. මෙතනදී කෙළ ගහන එක විතරක්**

**නෙවෙයි සිද්ධ වෙන්නෙ, ඒ තුන්ඃ කියන වචනෙත් පලවා හරින ගති ස්වභාවයක් තියෙනවා. බොහෝ කොටම සැඩ පරුෂ, දුෂ්ට දෙයක් පහ කරන්න ප්‍රයෝගයක් විදියට මේක යොදා ගන්නවා. ඒ ක්‍රමයටත් දොස් කැපිල යනවා. ඒකත් හුගක් සාර්ථකයි.**

මේ ඇස්වහ කටවහ සම්බන්ධයෙන් මම පුද්ගලිකව දැනුවත් වෙච්ච තවත් සිද්ධියක් තියෙනවා. ඒ කාලෙ මම පූගොඩ පෙහෙකම්හලේ තමයි සේවය කළේ. ඒ ප්‍රදේශයේ කඩයක් හිමි එක්තරා මුදලාලි කෙනෙක් හිටියා. මමත් ඔය කඩේට නිතර යනව එනවා. ඒ කඩේ ඉස්සරහ මුදලාලිට අයිති තැඹිලි ගස් දෙකකුත් තිබුණා. මේ වගේ මොනව හරි දෙයක් දැක්කම, මොකුත් නොකියා ඉන්න බැරි එක්තරා කාන්තාවකුත් මේ ප්‍රදේශයේම හිටියා. ඒ කාන්තාව මල්ලක් දෙකට නවල කිහිල්ලෙ ගහගෙන තමයි නිතරම මේ කඩේට යන්නෙ එන්නෙ. කඩේට ගියාමත් බඩු ගන්නෙ නෑ. නිකන් අතපත ගාල, ගණන් අහල, ගණන් වැඩියිනෙ... ආදී වශයෙන් මොනව හරි කියල යන එක තමයි කරන්නෙ. මේ කාන්තාව දවසක් කඩේට එනකොට අර තැඹිලි ගහක හොඳට සරුවට හැදිල තිබ්බච්ච තැඹිලි වලු දෙකක් දැකල මෙහෙම කිව්වා. ''මුදලාලිට කඩේ මොකටද මේ තැඹිලි ගස් දෙකම මදැයි'' එච්චරයි කිව්වෙ. එහෙම කියල ඒ කාන්තාව හැරිල යනකොටම, අර තැඹිලි ගහේ ගෙඩි ටක් ටක් ගාල පුපුර පුපුර වතුර බිමට වැක්කෙරෙන්න පටන් ගත්තා. ඒ කියන්නෙ බලා ඉඳෙද්දි නිකම්ම ගෙඩි පුපුරල වැටෙන්න පටන් ගත්තා. මමත්, එතන හිටපු අනෙක් පිරිසත් ඒ සිද්ධිය ඇස් දෙකෙන්ම දැක්කා. තැඹිලි ගහක ගෙඩි එහෙම කවදාවත් නිකන් වැටෙන්නෙ නෑ. ඒක අර කාන්තාවගෙ තිබ්බච්ච ඇස් වහ කටවහ කියන ස්වභාවයත් එක්කම වෙච්ච දෙයක්.

මේ වගේම තවත් සිද්ධියක් ඒ කාලෙ සිද්ධ වුණා. ඒ පළාතෙ තිබ්බච්ච දූරියන් ගහක උඩ අත්තක ගෙඩි හුගක් තිබුණා. එක්තරා පුද්ගලයෙක් එතනින් යන ගමන් මේ ගහ දිහා බලල, මේ අත්ත උස්සගෙන ඉන්නවම මදැයි කියල යන්න ගියා. කියල අඩි 10 ක් යන්න හම්බ වුනේ නෑ, අත්ත කඩාගෙන වැටුණා. ඒක පැහිලවත් නැති ගැට තිබ්බච්ච අත්තක්. නමුත් අර විදියට කඩාගෙන වැටුණා. මේ වගේ අත්දැකීම් ඕන තරම් තියෙනවා.

මේ කියන්න යන්නෙ තවත් ඒ වගේ සිද්ධියක්. මම දන්න එක්තරා මනුස්සයෙක් හිටියා. ඒ මනුස්සය තමන්ගෙ වයසක තාත්තට හොඳටම දොස් කියනවා. ඒ කියන්නෙ මොනව හරි පුංචි අඩුපාඩුවක් දැක්කත් විවිධාකාර කතා කියල බනිනවා. කන්න බොන්න වෙලාවට දෙන්නෙ නෑ. මොනව හරි අඩුපාඩුවක් ඇදල ගන්නවා. දවසක් මෙහෙම දොස් කියන කොට, මේ වයසක තාත්තට තරහ ගිහින් ඇඳේ ඉඳගෙනම අර තමන්ගෙ පුතාට කිව්ව, තෝ අද පොළගම කාපිය කියල. ඇතිවෙච්ච කේන්තියත් එක්ක බොහොම හිතේ අමාරුවෙන් තමයි එහෙම කිව්වෙ. මොකද කොයි වෙලෙත් දොස් කියන එකමයි කරන්නෙ. නමුත් මේ මනුස්සය එහෙම බැන්නත් ගණන් ගත්තෙ නෑ. මොකද වෙනදත් ඔය වගේ දේවල් කියන නිසා. දැන් මේ මනුස්සය (පුතා) නිදාගෙන ටික



වෙලාවක් යන කොට පිඹින සද්දයක් ආවලු. බලන කොට ඇඳ යට ඇත්තටම පොළඟෙක්. තව ඩිංගෙන් දෂ්ට කරනවා. අනූ නවයෙන් බේරුනේ. ඊට පස්සෙ මේ මනුස්සය මොකද කළේ, තාත්ත ළඟට ගිහින් බුලත් අතක් දීල, අනේ තාත්තෙ මගෙන් වරදක් වුනා නම් මට සාප කරන්නෙ නැතිව සමාවෙයන්, මාව එහෙම පොළඟ කන්න එපා කියල... මේ ආදී වශයෙන් තාත්තගෙ ඇඟ අතගාල කියන කොට, මගෙ රත්තරන් පුතේ උඹට එහෙම කරදරයක් වෙන්නෙ නෑ කියල ඒ වයසක තාත්ත කිව්වලු. දැන් මේ විදියට සාප කළොත් වදින අවස්ථාත් තියෙනවා.

මේ හා සමාන නමුත් මීටත් වඩා බරපතල සිද්ධියක් මට දැනගන්න ලැබුණා. ඒක සිද්ධ වුනේ මීට අවුරුදු 45 කට විතර ඉස්සර යක්කල ප්‍රදේශයේ. ඒ ප්‍රදේශයේ තිබ්බච්ච සෙනග එකතු වෙන පොළක් වගේ ස්ථානයකට එක්තරා දේශකයෙක් ආවා. එහෙම ඇවිත් එහේ ඉන්න පිරිස්වලට පොදුවේ බීමත්කමේ ආදීනව ගැන දේශනා පවත්වනවා. ඔහු එක තැනක ඉන්නෙත් නෑ, එහෙම දේශනා කර කර තැනින් තැන යනවා. බොන මිනිස්සුන්ගෙ තියෙන කාලකණ්නිකම, අසත් පුරුෂකම.... ආදී දේවල් කියන කොට, ඒ ගමේ ටිකක් ලොකු තත්ත්වයකින් හිටපු බේබදු මිනිහෙකුත් හිටියා. ඒ මිනිහ චණ්ඩියෙක්. දැන් අර දේශක මහත්තය මේ වගේ දේශනාවක් කරන අතරෙදි, මේ මිනිහ පැනපු ගමන් අර මහත්තයගෙ කනට පාරක් ගැහුවා. ඒකෙන් දැඩි කළකිරීමට පත්වෙච්ච ඒ මහත්තය මොකද කළේ, වරදක් නොකර යහපතක් කරන මට මෙහෙම ගහපු උඹ අද කොටියම කාපන් කියල, බිම තිබ්බච්ච වැලි ටිකක් අරගෙන බිමට දමල ගැහුවා. නමුත් ඒ මිනිහ ඒක ගණන් ගත්තෙ නෑ.

මේක මහ පුදුම සිද්ධියක්. බලන කොට මේ මිනිහට තමන්ගෙ ගෙදරට යන්න තියෙන්නෙ අඩි පාරක් දිගේ. ඒ අඩි පාර දිගේ මේ මිනිහ යන කොට කොටියෙක් පැනල කාල මළා. පස්සෙ ඒ මිනිහගෙ ඥාති හිතවත්තු එකතු වෙලා ඒ කොටිය මැරුවා. අඩි 12 ක් දිග කොටියෙක්. නමුත් ඒ ප්‍රදේශය එහෙම සතෙක් ඉන්න පැත්ත පළාතක්වත් නෙවෙයි. පස්සෙ හොයල බලනකොට, අභය භූමියක ඉඳල නිකං නිච්චි නැතුව ඇවිත් තියෙන කොටියෙක්. කොහොම කොයි වෙලාවක ආවද දන්නෙ නෑ. මට කෙනෙක් කිව්ව, ඒ කොටියගෙ හමට පුළුං පුරවල කොටියෙක් හදල, අර මැරිච්ච මිනිහගෙ ගෙදර තියෙනව කියල. ඒකෙත් මොනව හරි සිද්ධියක් ඇති. මොකද සතා මරපු සාපය යන්න කියල, නිකං පණ ඇති සතෙක් හැදුව වගේ සමාන දෙයක් තමයි කළේ. ඒක කාගෙ හරි කියමනකට අනුව කරපු දෙයක්. කොහොම හරි මේ වගේ **සාධාරණව යහපතක් කරන මනුස්සයෙක් වුණත්, තමන්ට එන අසාධාරණයකදී මෙහෙම සාප කරන්න පුළුවන්. එහෙම සාප කළොත් ඒක බොහොම තදින් වදිනවා.**

දැන් මේ වගේම සිද්ධියක් ත්‍රිපිටකයෙත් තියෙනවා. මේ වගේ කාරණා සිද්ධ වෙන බව ඔප්පු කරන්න ඒක හරි වැදගත්. එක්තරා භූමියක කුටි හදාගෙන සෘෂිවරු හත් දෙනෙක් හිටියා. මෙහෙම ඉන්න කොට ගුප්ත ලෝකයේ ☞

යම්කිසි කෙනෙක්ගෙන් එතන හිටපු බොහෝ නවක යෝගීවරුන්ට බාධක එන්න පටන් ගත්තා. කොහොම හරි මේ සෘෂිවරු 7 දෙනා උත්සාහයෙන් වීර්යයෙන් සෘද්ධි බලය ලබල මහා අභිඥා ලාභීන් බවට පත්වුණා. දැන් අර අභිඥා බලයෙන් බලන කොට මේ සෘෂිවරු දැක්කා, භාවනා ප්‍රගුණ කරන නවක යෝගීන්ට සම්බර කියල අසිරිඳු කෙනෙක් (අසුර නායකයෙක්) කරදර බාධක කරනවා. දැන් අර සෘෂිවරු 7 දෙනා මොකද කළේ, තමන්ගෙ අභිඥා බලයෙන් දික් කළ අතක් වක් කළ සැනින් මේ අසුරය ඉන්න තැනට ගියා. ගිහින් මේ අසුරයට කිව්ව, මේ විදියට දැහැමින් සාමයෙන් ඉන්න යෝගීව කටයුතු කරන අයට ඇයි කරදර බාධක කරන්නෙ, එහෙම කරන්න එපා කියල. මේ විදියට කියල ඒ අසුරයට අවවාද කළා. සක්‍රයගෙ ගුණ කියන එවුන් එක්ක මගේ කිසිම හිතවත්කමක් නෑ, මං උන්ට කරදර කරනව, සාප කරනවමයි කියල ඒ අසුරය ඊළඟට කිව්වා. ඒ පාර මේ සෘෂිවරුත් සාපයක් කළා. ඒක දැහැමි සාධාරණ සාපයක්. යම් කෙනෙක් මේ වගේ අසාධාරණයක් කරනව නම්, ඒ පුද්ගලයට නිදාගන්න ලැබෙන්න එපා කියල තමයි සාප කළේ. එහෙම සාප කරල මේ සෘෂිවරු, දික් කළ අතක් වක් කළ සැනින් නැවතත් තමන්ගෙ භූමියට ආවා. එදා පටන් අර සම්බර කියන අසුර නායකයා රෑ තුන් යලක් බය වෙලා මහ හයියෙන් කෑ ගහනවලු, නැගිටිනවලු. එදා ඉඳන් නිදාගන්න බැරි වුණාලු. අර සෘෂි සාපය ගිහින් වැදිච්ච හැටි. (<u>අරඤ්ඤායතන සෘෂි සූත්‍රය</u> - සං.නි.1) මේ වගේ සිද්ධි අදත් වෙන්න පුළුවන්.

ඒ වගේම වස් කවි, මන්තර ආදිය ගත්තත් එක්තරා කටවහක් සම්බන්ධ වෙන අවස්ථාත් තියෙනවා. මට අහන්න ලැබිච්ච ඒ වගේ සිද්ධියක් තමයි මේ. හොරණ ප්‍රදේශයේ කට්ටඩි වැඩ දන්න එක්තරා පුද්ගලයෙක් හිටියා. ඒ පුද්ගලයගෙ පොඩි දුවත් ඒ පරපුරේම පොඩි පොඩි මන්තර සාස්තර ඉගෙන ගත්තා. මේ පුද්ගලය (ළමයගෙ තාත්ත) හරි කැමතියි කිතුල් රා බොන්න. කොහොම හරි ඔහුට දවසක් ඒ ගම් ප්‍රදේශයේම කිතුල් රා මදින කෙනෙක් රා මුට්ටියත් එක්කම ඉස්සරහට හම්බ වුණා. ඉතින් රා බොන්න කැමැත්තෙන්, අනේ මමත් මේ රා ටිකක් බොන්න තමයි ආවෙ කියල ඉල්ලන කොට, අර කිතුල් රා මදින මනුස්සය, අද රා නෑ කියල මග හැරල යන්න ගියා. දැන් අර රා ඉල්ලපු මනුස්සයගෙ දුවත් මේ වෙලාවෙදි වතුර ගේන්න ළිඳට යන ගමන් හිටියෙ. ඒ යන ගමන් මේ කතාව ඇහුණා. මේ ළමය මොකද කළේ, තාත්තට රා දුන්නෙ නැතිවට ඕකට හොඳ වැඩක් කරන්න ඕන කියල, පුංචි මන්තරයක් අරගෙන මතුරල අර කිතුල් ගහ අතගාල ගියා. පුදුම වැඩේ කියන්නෙ ඊළඟ දවස වෙන කොට ගහ උඩින් හතට පැලිල. මලක් නෑ. මුළු ගහම පුපුරල ගිහින්. එතකොට අර පුංචි ළමයගෙ මේ ශක්තිය මොකක්ද? එච්චර දෙයක් හිතන්න පුළුවන් ළමයෙක්වත් නෙවෙයි. නමුත් අර මන්තරයත් එක්ක මොකක් හරි අමනුස්ස බලවේගයක්, එහෙම නැත්නම් කටවහක් ක්‍රියාත්මක වෙච්ච හැටි. අර වගේ කිතුල් ගහක් පැලිල යන්න මහ විශාල බලයක් එපැයි. ඒක අර පුංචි මන්තරෙන් සිද්ධ වුණා.

ඒ වගේම ඒ කාලෙ අපේ ගම් පළාතෙ තවත් මනුස්සයෙක් හිටියා. ඔහුට කිසිම කෙනෙක් තමන්ගෙ ගහකින් ගෙඩි කඩා ගන්න දෙන්නෙ නෑ. මොකද ඒ මනුස්සය ගෙඩි කැඩුවොත් ගහ වැටෙනවා. එක්කො මැරිල යනවා. එහෙම නැත්නම් ගෙඩි හැදෙන්නෙ නැතුව යනවා. ඒ ගෙඩි කඩපු වාරය අවසාන වාරය වෙනවා. හැබැයි ඒ මනුස්සය කඩේට ගියාම කඩේ මුදලාලි හරි කැමතියි, ඒ බඩු කඩේට අරගෙන ඉස්සෙල්ලම ඒ මනුස්සයට කඩෙන් බඩු අලෙවි කරන්න. මොකද එතකොට කඩේ බඩු ටික හවස් වෙන කොට විකිණෙන ස්වභාවයක් තිබුණා. දැන් මේ සිද්ධිය දන්න නිසා ගමේ මිනිස්සු, කඩේට දෙන්න උදේ පාන්දර දෙහි කඩන කොට, අර මනුස්සය ඇවිත් දෙහි ඉල්ලුවොත්, අපි උදේම කඩේට දෙන්නම් එතනින් ගන්න කියල කියනව මිසක් කෙලින්ම ඒ මනුස්සයට දෙන්නෙ නෑ. ඉතින් කඩේ මුදලාලිත් කැමතියි ඒ මනුස්සයට දෙහි ටික නොදී කෙලින්ම කඩේට ගෙනත් දෙනවට. ඉතින් කඩේ අරින කොටම අර මනුස්සයත් දෙහි ගන්න එනවා. මුදලාලිත් බොහොම කැමැත්තෙන් පළමු දෙහි ටික ඒ මනුස්සයට දෙනවා. හැබැයි දෙන්නෙ ලාභයක් තියාගෙන නෙවෙයි, අර ගත්ත ගාණටමයි. ''අපි විතරක් හම්බ කරගෙන හරියන්නෙ නැනෙ. උඹත් කීයක් හරි හම්බකරගෙන ජීවත් වෙන්න එපැයි. ඒ නිසා මම මේ ටික ගත්ත ගාණටම දෙනවා.'' දැන් මෙහෙම කියල කඩේ මුදලාලි බොහොම සන්තෝසෙන් අර මනුස්සයට දෙහි ටික දෙනකොට, ඒ මනුස්සයත් බොහොම සන්තෝසෙන් අරගෙන මුදලාලිගෙ හොඳ කියල යනවා. ඒ නිසා එතනදි අර වගේ දාහයක්, ඇස්වහ කටවහක් වදින්නෙ නෑ. මේ නිසා එදාට කඩේ බඩු ටික බොහොම හොඳට විකිණෙනවා. නමුත් ගහෙන් කඩාගන්න ඉඩ දුන්නොත් මුළු ගහම ඉවරයි. නැවතත් හැදෙන්නෙ නැතුව යනවා. විශේෂයෙන් කිරි අල වගේ දෙයක් දුන්නොත් ගහත් එක්කම වත්තෙන්ම වඳවෙලා යනවා.

මේ අත්දැකීම් තියෙන ගම්මු, ඒ මනුස්සයට කිසිම දෙයක් තමන්ගෙ ගෙදරකින් දුන්නෙ නෑ. හැබැයි මේ මනුස්සයත් කපටිකම් කරනවා. සමහර වෙලාවට ඔහුට යමක් ගන්න හිතුණොත්, අර විදියටම ගෙවල්වලට ගිහින් මොනව හරි කියනවා. ''තව බඩු වගයක් ගන්න තියෙනවා. ඒක විශේෂ ලාභයක් ගන්න පුළුවන් දෙයක්.'' මේ විදියට කියල මොනව හරි තිබුණොත්, මේ මනුස්සය අනාගතය ගැන බලන්නෙ නැතිව ඒක ගන්න විදියක් හොයනවා. ''ඉස්සෙල්ල ගෙනිච්ච දෙහි ටිකට හිතුවටත් වඩා මට ලාභ තිබුණනෙ! ආ... තව ගාණක්'' මෙහෙම කියල නොඉල්ලද්දිත් තවත් රුපියල් 10 ක් 15 ක් අර ගෙදර උදවියට දෙනවා. දැන් ඉතින් අර ගෙදර උදවියත් කල්පනා කරනව, මේ මනුස්සය හරි අවංක පුද්ගලයෙක්නෙ, ඕන නම් මේ මුදල තියාගන්නත් තිබුනනෙ කියල. දැන් මේ මනුස්සය මොකද කරන්නෙ ඒ පිටටම ''ආ හරි වැඩේනෙ! සල්ලි ගෙනාවෙත් නැනෙ! අර අල ටික තියෙනව නේද? එහෙනම් ඒ ටිකත් දෙන්නකො, මම ගිහින් විකුණල ගෙනත් දෙන්නම්...'' මේ ආදී වශයෙන් කියල අර රුපියල් හාර පන්සියයක් වටින අල හරි මොනව හරි දෙයක් තමන් දීපු රුපියල් 10 - 15 ට හිලව් කරල අරගෙන යනවා. හැබැයි එහෙම ගියොත් ගියාමයි, නැවත ඒ ගෙදර පළාතටවත් යන්නෙ නෑ. මේ ජාතියෙ පුද්ගලයෙක්. ඒකෙන් පෙන්වන්නෙ ඒ පුද්ගලයගෙ අභ්‍යන්තරයේ තියෙන වංචා සහගත බව ඒකට බලපාන හැටි. මේ වගේ සිද්ධිත් ඇස්වහ කටවහත් එක්ක සම්බන්ධයි.

ඒ වගේම මේ ඇස්වහ කටවහ කියන එක ප්‍රතිවිරුද්ධ පැත්තට ක්‍රියාත්මක වෙන අවස්ථා තියෙන බවත් පසුගිය කලාපයෙන් විග්‍රහ කළා. දැන් මේ විස්තර කරන්නෙ ඒ වගේ අත්දැකීමක්. අපේ ගෙවත්තට අල්ලපු වත්තෙ කුරුම්බ ගහක් තිබුණා. හැබැයි ඒ වත්තෙ අයිතිකාරයො කියල කවුරුවත් ආවෙ ගියේ නෑ. නිකන් ඔහේ අත හැරල දාල තමයි තිබුණෙ. ඉතින් අපිත් ගිහින් ඕකෙ කුරුම්බ කඩාගෙන කනවා. කවුරුවත් එපා කියන්නවත් එහෙම හිටියෙ නෑ. ගහ පොඩි වුණාට ඒ ගහේ විශාල කුරුම්බ ගෙඩි හැදෙනවා. ඒ දවස්වල අයියයි මමයි ගිහින් ඔය ගහට නැගල ගෙඩි කඩනවා. ඒව අතින් කරකවන්නත් බැරි තරම් විශාල ගෙඩි. හැබැයි කඩල, කපල බැලුවම ඇතුලෙ මොකුත් නෑ නිකන් ලෙල්ල විතරයි. ගෙඩිය කොච්චර ලොකු වුනත් ඇතුලෙ කන්න බොන්න දෙයක් නෑ. මමයි අයියයි දවසක් මේ ගහෙන් ගෙඩි 4 - 5 ක් බිමට කඩල දැම්මා. එයින් ගෙඩි 2 ක් කැපුවා. කන්න බොන්න කියල ඇතුලෙ මොකුත්

තිබුණෙ නෑ. අනිත් ඒවත් කපල වැඩක් නැති බව දන්න නිසා, ඒ ගෙඩි 3 ම ගහ යට තියෙන්න ඇරියා.

මේ කාලෙ අපේ ගමේ ඇස්වහ කටවහ තියෙන එක්තරා වයසක කාන්තාවක් හිටියා. උන්දෑ අරව මේව හොයන්න අපේ වතුවලටත් යනව එනවා. දැන් අයියයි මමයි කතා වුනා මේ කාන්තාව යන එන කොට, අන්න අතන කුරුම්බ වගයක් වැටිල තියෙනව කියල ඇයට දැනුම් දෙන්න. එහෙම කතා වෙලා අපි ඒ කාන්තාවට පණිවිඩය දැනුම් දුන්නා. එහෙනම් හොඳ වෙලාව, යං යං දුවේ මාත් මේ ඉන්නෙ හරි පිපාසෙන් කියල, උන්දෑගෙ ලේලි කෙනෙකුටත් කතා කරගෙන අර කුරුම්බ ගෙඩි ටික තියෙන තැනට ගියා. මේක දැකපු ගමන් මේ කාන්තාව, රත්තරං ගෙඩි ටික තමයි කියල අර කුරුම්බ ගෙඩි අරගෙන කපන්න පටන් ගත්තා. කපනව කපනව, ඉවර වෙන්න කැපුවත් ලෙලි විතරයි මොකුත් ගන්න දෙයක් තිබුණෙ නෑ. දැන් පිපාසය වැඩි කමට උන්දෑට ඉබේටම මෙහෙම කියවුණා. ''අප්පොච්චියේ මෙහෙම මොකද මේ....? මෙච්චර ලොකුවට ගෙඩි තිබ්ලත් වැඩක් නෑ, එකකවත් වතුර කඳුලක්වත් නෑනෙ!'' දැන් මේ සිද්ධියෙන් පස්සෙ ඒ ගහේ හැදෙන විශාල ගෙඩි, වතුරයි මදයයි එක්කම ඉතාමත් සාරෙට හැදුණා. අපි දැනුවත්ව තවමත් ඒ ගහ ඒ වත්තෙ තියෙනවා. එදායින් පස්සෙ මේ වෙනකල්ම ඒ ගහේ ගෙඩි පුහු වෙලා නෑ.

දැන් මෙතනදි මේ ඇස්වහ කටවහ කියන එකේ ප්‍රතිවිරුද්ධ පැත්ත තමයි සිද්ධ වුණේ. තමන්ට ප්‍රයෝජන ගන්න ඇවිත් ඵල ප්‍රයෝජනයක් නැති වුණාම තමයි අර කාන්තාවට අර වගේ වචන කියවුණේ. එහෙම නැත්නම් මුලින්ම කියවෙන්නෙ මොකක්ද, ''පොල් ගෙඩිවල තරම මදැයි! ලොඳේ නැතිවුණාට පෙනුමම මදැයි ගෙඩිය විකුණ ගන්න බැරිය'' මේ වගේ අදහස් තමයි පිටවෙන්නෙ. එහෙම එන්නෙ තමන්ට ලැබෙන්නෙ නැති, අනුන්ගෙ දේවල්වලට. දැන් මෙතනදි තමන්ට ලැබීමක් වශයෙන් ආපු එකට තමයි අර විදියට පහර වැදුනෙ. අධික පිපාසයෙන් වතුර ටිකක් බොන්න තමයි හිතාගෙන ආවෙ. බැලුව බැලුව ඒත් නෑ. ඒ නිසා අර වගේ වචන පිටවුණා. මම දැනුවත්ව ඇස්වහ කටවහ කියන එක ප්‍රතිවිරුද්ධ පැත්තට වැඩ කරපු අවස්ථාවක් තමයි මේ. හැබැයි වැඩිපුරම සිද්ධ වෙන්නෙ, අර කලින් විස්තර කළා වගේ නරක පැත්තටමයි.

දැන් මේ කියපු කාන්තාවට පුංචි ළමයෙක්වත් පෙන්නන්නෙ නෑ. ගෙදරකට ගියොත් හංගනවා. ළමයෙක් උපන්න කියල දැනගත්තොත්, උන්දෑ යනව ඒක හොයන්න. හරි ආසයි ළමයි බලන්න. ''කෝ ළමයෙක් උපන්න කියල ආරංචියි, කෝ ඒ චූටි මහත්තය ඉන්නවද? කෝ දුව ඉන්නවද?...'' මේ විදියට අහනවා. එහෙම අහල හිටියොත් පොඩි එකාව ඉඹලත් යනවා. ඉඹල ගියොත් එහෙම පොඩි එකාගෙ ඇඟ හැම තැනම බිබිලි දාන්න පටන් ගන්නවා. මේක දන්න දෙමවුපියො උන්දෑට ළමයෙක් පෙන්නන්නෙ නෑ. ''සනීප නෑ, බේත් ගන්න එක්කගෙන ගියා, පස්සෙ වෙලාවක පෙන්නන්නම්කො....'' මේ ආදී වශයෙන් කියල මග හරිනවා.

දැන් ඉතින් මේ වගේ කාරණා කිහිපයක් පෙන්නුවෙ, නිකන්ම අහල අහක දාන්න නෙවෙයි. මේ වගේ සිද්ධිවලින් මේ ලෝකයේ තියෙන පැටලෙන සුළු මහා සංකීර්ණ ස්වභාවයත්, ඒ නිසා මුහුණ දෙන්න වෙන සෑහීමකට පත් වෙන්න බැරි කරදරකාරී පෙළෙන ස්වභාවයත් තේරුම් ගන්න ඕන. ඉතින් මේ අනන්ත සංසාර ගමනෙ, පෙරත් ඔය වගේ දේවල්වලට අනන්තවත් මුහුණ දෙන්න මේ හැමෝටම සිද්ධ වෙලා තියෙනවා. දැනුත් එහෙමයි. මේ විදියට ගියොත් මතුවටත් එහෙමම තමයි. ඒ නිසා මේ කාරණා ඥානවන්තව තේරුම් අරගෙන, මේ ලෝකයේ මිනිස්සු සම්පත් කියල පොරකන දේවල්වලින් අවසානයේ දුකක්, දාහයක් මිසක් කිසිම හරයක් ලැබෙන්නෙ නෑ කියල දහමට අනුව තේරුම් ගන්න ඕන. එහෙම තේරුම් ගත්තම මේ ඇස්වහ කටවහ කියන කාරණයත් එකිනෙකා කෙරෙන් දුරු වෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

*10 වෙනි පිටුවෙන්...*

# සීමා නොකළ යුතු අනන්ත බුදු ගුණ...

ජීවිතය පවත්වා ගැනීමට පරිභෝග කරන සිසිල් පැන්, භෝජන, පළතුරු, කැවිලි, දැහැත්, ගිලන් පස, ඖෂධ, පිරිකර ආදියෙනුත් ඒ ඒ බුදු ගුණ සිහි කරල උපහාර පූජා පවත්වන්න පුළුවන්. යම් කෙනෙකුට පවස නිවාගන්න, අපිරිසිදු දේ සෝදා පිරිසිදු කරගන්න, ගතේ දාහය නිවා සිසිල් කරගන්න ජලය අවශ්‍යයි. පූජා පවත්වන කොට ජලය හොඳින් පිරිසිදු බඳුනකට පෙරා ගෙන, ඒ පිරිසිදු ජලය තමයි පැන් කියල පූජ කරන්නෙ. පිරිසිදු සිසිල් දේ පූජා කිරීමේ ආනිසංස වශයෙන් තමන්ටත් පිරිසිදු සිසිල් දේවල් ලබන්න හේතු වෙනවා. පුදන්නේ පිදුම් ලැබීමට හේතු වෙයි කියල බුදුන් වහන්සේ දේශනා කරල තියෙනවා. ඉතින් අපට ලැබෙන පිරිසිදු සිසිල් දේ තමයි පින. ඒ පින අනන්ත සියලු ලෝ සතුන්ට විහිදුවා, පතුරුවා පිහිටුවන්න පුළුවන්. ඒ විදියට පින් අනුමෝදන් කිරීමෙන් ඒ සියලු ලෝ සතුන්ටත් සිසිලැති පැනින් නැහැවුනා වගේ මහා සිසිලක් ලැබෙනවා. හේතු වාසනා තියෙන විදියට ලැබීමේ වාසනාවත් තියෙනවා.

**සැම ලෝ සතගෙ හැම දුක් ගිනි නිවේවා**
**සිසිලැති පැනින් නැහැවුන ලෙස දැනේවා ....**

මේ ආදී වශයෙන් පැවැත්වුන අති උත්තම බුද්ධ පූජාවකදී දේශනා වුනේ මේ කියපු න්‍යාය ධර්මය තමයි.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ඩබ්. ඒ. තිළිණවතී**
(විශ්‍රාමික මහජන බැංකු නිලධාරිනී )
කඩවත

## නිවැරදි කිරීම

**පසුගිය 22 වන කලාපයේ පළ වූ ''නිරුක්ති පටිසම්භිදා ඥානයෙන් හෙළිදරව් වන හෙළ බසේ සහ හෙළයින්ගේ මූලාරම්භය'' ලිපිය යටතේ 23 පිටුවේ සඳහන් වූ ''යසකුල සිටු පුත්‍රයාට'' යන්න ''කාල සිටු පුත්‍රයාට'' යනුවෙන් නිවැරදි විය යුතුය.**

# පස් පොළක් නීච කළ හෙළයේ මහා වංශ කතාව...


*(පසුගිය කලාපයෙන් - නිරුක්ති පටිසම්භිදා ඥානයෙන් හෙළිදරව් වන හෙළ බසේ සහ හෙළයින්ගේ මූලාරම්භය....)*

හෙළ බසේ සහ හෙළයින්ගේ මූලාරම්භය ඇති වෙන හැටිත්, ඒ හෙළ පරම්පරාව ලෝකයේ ව්‍යාප්ත වෙන හැටිත් පසුගිය කලාපවලින් යම් පමණකට පැහැදිලි කළා. නමුත් ඒ විදියට බිහි වෙච්ච ශ්‍රේෂ්ටතම හෙළයා වන ලොවුතුරා බුදුන් වහන්සේගෙන් බිහි වූ සිහල පරම්පරාව, හෙළ පරම්පරාව හෙවත් ආර්ය පරම්පරාව, අපිවත් නොදන්නා ඉතිහාස කතාවකින් නීච කරපු හැටි තමයි මේ පෙන්වා දෙන්නේ. හැබැයි මේ කතාව හෙළිදරව් කරන්නෙ, ඒ ඉතිහාස කතා ලියපු කියපු කිසිවෙකුටවත් අපහාස කරන්නවත්, ඒ අය හෙලා දකින්නවත් නෙවෙයි. (මෙතනදී **හෙලා යන්නෙන් අදහස් කරන්නෙ හලනවා, හලා දමනවා කියන අර්ථය**) මොකද ඒ වරද්දපු උදවියත් කවදා හරි මේ භයානක සංසාරයෙන් ගොඩ ගිහින් නිවන් දකින්න ඕන. ඒකට ඒ අයත් කවදා හරි මේ හෙළ තත්ත්වයට පත් විය යුතුයි.

නමුත් මේ තුන් ලෝකයේ බිහිවෙච්ච ශ්‍රේෂ්ටතම පරපුර හෙවත් හෙළ පරපුර ගැන අපට කියා දෙන, මොනම සත් දහමකටවත් ගලපන්න බැරි නීච කතා නිසා මේකෙ අග මුල හොයාගන්න බැරිව, බුදුන් වහන්සේ ඇතුළු ඒ හෙළ පරපුරම නිග්‍රහයට ලක් කරල තියෙනවා. ඒක ලෝක ධර්ම ස්වභාවයේ හැටියක් වුනත් බොදුනුවො විදියට මේ හෙළ පරපුර කියන්නෙ මොකක්ද, කොහොමද බිහි වෙන්නෙ, කොහොමද ව්‍යාප්ත වෙන්නෙ ආදී කාරණා, හුදෙක් ඉතිහාසමය කරුණු කාරණාවලින් විතරක් නෙවෙයි, පටිච්ච සමුප්පාද දහමට අනුව ඥානවන්තවත් තේරුම් ගත්තොත් තමයි මේ දහම් අවබෝධය ලබල, අනිත් ලෝක සත්වයන්ටත් ඒ වටිනා දහම් මග කියා දෙන්න පුළුවන් වෙන්නෙ.

ඉතින් දැන් තියෙන මේ ඉතිහාස **කතාවලින් මේ හෙළ බසේ සහ හෙළ පරපුරේ අග මුල නූල් බෝලෙ වගේ පැටලුවට, සිවු පිළි සිඹියාපත් ඥානවලට මේකෙ ඇත්ත නැත්ත ගෝචර වෙනවා.** විශේෂයෙන් නිරුක්ති පටිසම්භිදා ඥානයෙන් මේ වචන හැදිච්ච හැටි කෙස් ගහටම හොයාගන්න පුළුවන්. එහෙම හොයාගෙන ඒවා ධර්මයට ගලපල බලන කොට, කාටවත් අපහාසයක් නිග්‍රහයක් නොකර, ලෝක සම්මතයේ තියෙන වෙනත් ජාතියක් නීච නිග්‍රහයන්ට ලක් නොකර, මුළු ලෝක සත්වයාටම පොදු වූ පෙළ දහමින් බිහිවෙච්ච හෙළ පරපුරේ වතගොත හොයාගන්න පුළුවන්. ඒ අනුව **මේ ලෝකයේ කිසිදු ජාති ආගම් කුලමල භේදයකින් තොරව හේතු වාසනා තියෙන, නැණ නුවණ තියෙන ඕනෑම කෙනෙකුට හෙළයෙක් බවට පත්වෙන්න පුළුවන් ඒ මාර්ගය හොයාගන්න පුළුවන්.**

හැබැයි දැන් තියෙන ඉතිහාස කතා කරපින්න ගෙන, අපි තමයි සිංහල බෞද්ධයො, අපි තමයි හෙළ පරම්පරාව, අපි තමයි ආර්ය පරම්පරාව.... ආදී නම්වලින් ලොකුවට කෑ ගැහුවට, පෙළපාලි ගියාට ඔය කියන හෙළ පරපුරවත්, ඒ හෙළ පරපුරට අයිති උරුමයවත් රැකගන්න ලැබෙන්නෙ නෑ. ඒක භෞතික වස්තු විතරක් අල්ලගෙන රැකගෙන කෑ ගැහුව පළියට, නීති ගෙනත් සම්මත කළ පළියට රකින්න පුළුවන් දෙයක් නෙවෙයි. මොකද ඒවත් කවද හරි විපරිනාමය වෙලා වැනසිලා යනවා. දහමක් අවබෝධ කර නොගත්තොත් දැන් මේ කෑ ගහන උදවියත් මැරිල ගිහින් කොහේ කවුරු වෙලා ඉපදෙයිද කියල කවුද දන්නෙ? **මැරිල ගිහින් සතර අපායෙ හරි වෙනත් ලෝකයක හරි ඉපදුනාට පස්සෙ ඔය කියන සිංහල බෞද්ධකම් ඔක්කොම ඉවරයි. ඊට පස්සෙ මොනව කළාද කියලවත් මතක නෑ. නමුත් බුදුන් වහන්සේ බිහි කරපු හෙළ පරම්පරාවෙන් බිහි වෙච්ච හෙළයෙක් නම්, ඒ පුද්ගලය මැරිල කොහේ ගියත්, මොන රටේ, මොන ලෝක සම්මත ජාතියක ඉපදුනත් ඒ හෙළ භාවය නැති වෙන්නෙ නෑ. කාටවත් නැති කරන්නත් බෑ. ඒක නිවන් දක්නා ජාති දක්වා පිරිනිවන් පානකල්ම තියෙනවා.**



මේ නිසා අවුරුදු 60 - 70 ක ආයු කාලයකට විතරක් සීමා වෙච්ච ලෝක සම්මත හෙළයෙක් නොවී ජාති, ජරා, ව්‍යාධි, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස... ආදී වශයෙන් කියන මේ ගිනි නැති හෙළයෙක් බවට පත් වෙන පරපුර ගැන ඇත්ත දැනගෙන සිටීම කාට කාටත් වැදගත්. හැබැයි ඉතින් ඒක දැන් මේ තියෙන ඉතිහාස කතා පොත්වලින් තෝරගන්න බෑ. ඒ නිසා තමයි බුදුන් වහන්සේ සතර මහාපදේශ කියල දෙයක් දේශනා කළේ. ඒ කියන්නෙ කවුරුවත් **කිව්ව පළියටවත්, පොතක පතක තිබ්බච පළියටවත්, පරම්පරාවෙන් ගෙනාපු පළියටවත්, තමන්ගෙ ලබ්ධියට එකඟ වෙච්ච පළියටවත් පිළිගත්තොත් ඇත්ත** හොයාගන්න බෑ. මේ නිසා ඒවාට

සීමා නොවී, එහෙම කියන කතාවලිනුත් නිවැරදි දේ පමණක් විමසිලිමත්ව සිහි බුද්ධියෙන් තෝර ගන්න ඕන. දෘෂ්ටි ගත වෙලා ඒක කරන්න බෑ. මෙතනදි මේ ඉතිහාස කතා පොත් අහක් කරන්න කියල නෙවෙයි කියන්නෙ. ඒවායේ තිබුණත්, ඒ කියන්නෙ ඇත්තක්ද, ඒ වගේ දේවල් වෙන්න පුළුවන්ද, කොහොමද.... ආදී කාරණා නැණ නුවණින් විමසල බලල, තමන්ට හරියි කියල ගෝචර වෙන කොටස පමණක් අරගෙන, අනෙක් මතවාද ඉවතට දාල සත්‍යය යථාර්ථය විතරක් තෝර ගන්න පුරුදු වෙන්න ඕන. ඒ වගේම ඒ ක්‍රමය අනෙක් අයටත් කියල දෙන්න ඕන.

මොකද ඔය ඉතිහාස කතා කියල තමන්ගෙ මතයක් මහජනතාව අතරට කාවද්දන්න ඕන වෙනකොට, ඒකට අනුගමනය කරන ක්‍රමවේදයකුත් තියෙනවා. ඒ කියන්නෙ ඇත්තකින් පටන් අරගෙන ඒක වටා බොරු කතාවක් නිර්මාණය කරනවා. ඒ ඇත්ත කතාවට ගන්නෙ, සමාජයේ අති මහත් බහුතරයක් ඇත්තෙයි කියල පිළිගන්න දෙයක්. මොකද එහෙම නැතිව සමාජයේ හැමෝටම පහසුවෙන් පේන්න තියෙන, දන්න දෙයක් බොරුයි කියල කතාව පටන් ගත්තොත් මිනිස්සු ඒක පිළිගන්නෙ නෑ, ප්‍රතික්ෂේප කරනවා. එතකොට ඒකට පිළිගැනීමක්, පැවැත්මක් නැතිව යනවා. මේ නිසා පොදුවේ හැමෝම පිළිගන්න ඇත්තකින් කතාව පටන් අරගත්තම, බැලු බැල්මට ඒක මිනිස්සු අතරට ගෙනියන්න ලේසියි.

උදාහරණයක් විදියට කවුරුහරි කිව්වොත් අලියට වඩා හරක ලොකුයි, ගොඩබිම ඉන්න ලොකුම සතා අලිය නෙවෙයි හරකයි කියල, ඒ කතාව කවුරුවත් පිළිගන්නෙ නෑ. මොකද ඒක හැමෝම අත්දැකීමෙන් දන්න කරුණක් නිසා. මේ නිසා ඒ පුද්ගලය එතැන් පටන් ඉදිරියට අලිය හෝ හරක ගැන කියන කිසිම කතාවක් මිනිස්සු පිළිගන්නෙ නෑ. මොකද ආරම්භයම බොරු නිසා. නමුත් ඒ පුද්ගලයා, හරකට වඩා අලියා ලොකුයි කියල මුලින්ම විග්‍රහ කරල සමාජයම පිළිගත්තු සත්‍යයකින් කතාව පටන් ගත්ත නම්, එතැන් පටන් ඔහු අලිය හෝ හරක ගැන කියන, සාමාන්‍ය ජන සමාජය නොදන්නා බොරු කරුණු කාරණාවලටත් මිනිස්සු අතර යම් පිළිගැනීමක් එන්න පුළුවන්. මොකද අර මුල් කාරණාවල තියෙන සත්‍යතාවය නිසා සාමාන්‍ය මිනිස්සු අනික් කතාත් පිළිගන්න පෙළඹෙනවා. ඒ ගැන සැක කරන්න යන්නෙ නෑ. මෙන්න මේ විදියට තමයි එදා හිටපු බමුණු පැළැන්තිය මිනිස්සු රවට්ටන්න බොරු කතා ගෙතුවෙත්.

මොකද ඔය බමුණන්ට විශාල මාන්නයක් තිබුණා. එදා තිබිච්ච පාලි භාෂාවට මහප්‍රාණ එකතු කරල, ඒ විදියට බමුණො සකස් කරගත්තු මාන්නක්කාර භාෂාවක් තමයි සංස්කෘත භාෂාව කියන්නෙ. ඉතින් ඒ මාන්නක්කාර බමුණො එදත් බුදු දහමට විරුද්ධයි. මොකද ඒ අයට සමාජයේ තියෙන තැන නැතිවෙයි කියන බයට. ඉතින් බුදුන් වහන්සේගෙන් පටන් ගත්තු පෙළ දහමත්, හෙළ පරම්පරාවත් අග මුල ගලපගන්න බැරි වෙන්න පටලවල දාන්න, ඒ බමුණො පසු කාලීනව විවිධ පොත් පත් අටුවා කතා ලියන්න පටන් ගත්තා. මුලින් තිබිච්ච පාලිය වෙනස් කරපු එක තමයි ඉස්සෙල්ලම කළේ. උදාහරණ විදියට පාලියෙන් මාතු, පීතු කියල කියන වචන දෙක මාතෘ පීතෘ කියල මහප්‍රාණ කරල, උස් කරල ලොකු කරල, අහංකාරකමට කියන්න පටන් ගත්තා. මාතා පිතු කියල කියන කොට, ඒක පොඩි උන් කියන එකනෙ, අපි ලොකු එවුන්නෙ කියල ඒ ලොකුකම ඔළුවට අරගෙන අර විදියට මාතෘ පිතෘ කියල ලොකු කරල එකක් හදාගත්තා. දැන් ඉතින් ඒක සාමාන්‍ය පොඩි මිනිස්සුන්ට උච්චාරණය කරන්න බැරි නිසා, තමන්ට ආවේණික අර මහප්‍රාණ සංස්කෘත වචනවලින් මාන්නක්කාරකම තවත් ලොකු කර ගත්තා.

දැන් මේ බමුණන්ගෙ මාන්නක්කාරකම පෙන්වන්න හොඳ උදාහරණයක් මේ මෑත කාලයේ එක්තරා ගම් ප්‍රදේශයකින් අහන්න ලැබුණා. ඒ ගමේ හිටපු එක්තරා කාන්තාවක් අවුරුදු ගණනාවකට රට ගිහින් නැවත ගමට ආවා. ඉතින් ඒ ගමේ පුරුදු කඩේට ගිහින් බඩු ඉල්ලන කොට, දැන් අර කලින් කතා කරපු භාෂාව නෙවෙයි කතා කරන්නෙ. දැන් ඉංග්‍රීසි කෑලිත් ටිකක් දනගෙන අර කලින් වගේ හරි අමාරුයි සිංහලෙන් කතා කරන්න. ඉතින් කඩේට ගිහින්, ළමයා පාන්ස් තියෙනවද කියල ඇහුවා. කඩේ හිටපු ළමයටත් කර ගන්න දෙයක් නැතිව, පාන්ස් නෑ නෝනා කේක්ස් නම් තියෙනව කිව්වා. අර කාන්තාවට පහරක් වදින්නම ඒ ළමයත් එහෙම කිව්වා. දැන් ඉතින් මේ පාන් කියන එක පාන්ස් වුනේ කොහොමද? අර බමුණන්ගෙ වගේ ගති ලක්ෂණ නිසා එදා කතා කරපු විදියට පාන් ඉල්ලන්නෙ නැතිව, මේ රට ගිහින් ආපු ටිකට මාන්නක්කාර වෙලා.

මේ වගේ, බමුණො ඉගෙන ගෙන මාන්නක්කාර වුනාමත් අනෙක් අයගෙ භාෂාවන් කතා කරන්න කැමති නෑ. බුදුන් වහන්සේ ඒ මාන්නක්කාරකමට පහර ගහල මනා නිග්‍රහයෙන් නිගරු කළේ ඒ නිසා තමයි. **(නිග්‍රහයන් වර්ග දෙකක් තියෙනවා. එකක් මනා නිග්‍රහය. අනික නීච නිග්‍රහය. බුදුන් වහන්සේ නමක් නිග්‍රහ කරන්නෙ මනා නිග්‍රහයෙන්. සාමාන්‍ය අය කරන්නෙ නීච නිග්‍රහය. සුනිග්ගහිතං නිග්ග හිත්වා - මනා වූ නිග්‍රහයෙන් නිග්‍රහ කළ)** හැබැයි උන් වහන්සේ කවදාවත් මූලික බ්‍රාහ්මණයින්ට ඒ වගේ නිගරු කළේ නෑ, ඒ අයගෙ හොඳ කිව්ව මිසක්. මොකද මූලික බ්‍රාහ්මණයො කියන්නෙ ඍෂිවරු. ඒ ඍෂි භාෂිතය අරගෙන ඒක විකෘති කරල හදාගත්තු අයට තමයි උන් වහන්සේ අර විදියට නිග්‍රහ කළේ. ඔය විදියට මුල් පාලි භාෂාව මත පදනම් වෙලා සියලුම සංස්කෘත වචන ඒ අයට ඕන විදියට හදාගත්තා. ඊට පස්සෙ ඒක හෙළ භාෂාවටත් කා වැද්දුවා. එහෙම කාවද්දපු වචන තමයි අදටත් බොහොමයක් අපි නොදැනුවත්ව මේ සිංහල කියල කතා කරන්නෙ. දැන් එහෙම ඒ අයට ඕන විදියට හදාගෙන තමයි, ඊළඟට සාමාන්‍ය ජනතාව අතරට දහම හා ඒ සම්බන්ධ ඉතිහාස කතාව විකෘති කරල ගෙනියන්න උපක්‍රම යෙදුවෙ.

ඒ විදියට ලියපු ඉතිහාස කතාවක් තමයි අද අපිට, අපේ මහා වංශය කියල දීල තියෙන්නෙ. මහා වංශයේම විස්තර කරල තියෙනවා, ඒකට මහා වංශය කියල කියන්න හේතුව. එතකොට මුලින්ම හිටපු සක්විති රජ පරම්පරාවක් ගැන කියවෙනවා. මනු කියන රජුටත් එහා මහා සම්මත කියන සක්විති රජුගෙන් ආපු පරම්පරාවක් තමයි මහා වංශය කියන්නෙ කියල සඳහන් වෙනවා. සක්විති රජ පරම්පරාවෙන් පැවත එන ඒ පරම්පරාවටම බුදුන් වහන්සේත් අයිති වෙන බව සමහර දහම් පොත්වලත් සඳහන් වෙනවා. සිංහල ජාතියේ මුල එතන කියල තමයි දීල තියෙන්නෙ. නමුත් මුලින් එහෙම කියල, අනිත් සැරේ විස්තර කරන කොට ලියල තියෙනවා, විජය රජ්ජුරුවන්ගෙන් තමයි පටන් ගත්තෙ කියල. ඊළඟට විජය රජ්ජුරුවො කවුද කියල අහපුවම, සිංහබාහු සිංහසීවලි කියන දෙන්නෙක් සම්බන්ධ කරල තියෙනවා. සිංහබාහු සිංහසීවලි කියන්නෙ සහෝදර සහෝදරියන් දෙන්නෙක්ලු. **ඊළඟට මේ සිංහබාහු රජකම ගන්න තමන්ගෙ තාත්තත් මැරුවලු. ඒ කියන්නෙ ආනන්තරීය පාප කර්මයක් කරගත්තු මහ කාලකන්නියෙක්. එතකොට එතනම එක පොළක් නීච කළා. ඊළඟට මේ සිංහබාහු සිංහසීවලී කියන සහෝදර සහෝදරියො දෙන්න විවාහ වෙලා ඇති වෙච්ච ළමය විජය රජ්ජුරුවො කියල සඳහන් වෙනවා. දැන් එතන තව පොළක් නීච කළා. ඇයි? එක පවුලේ සහෝදරියයි සහෝදරයයි කසාද බැන්ද නිසා.**

**ඊළඟට සිංහබාහු, සිංහසීවලී කියන්නෙ කවුද කියල අහපුවම,** ☞

**සුප්පා දේවිය කියල තවත් වෙසඟනක් තිරිසනෙක් එක්ක සංවාසයේ යෙදිල ඉපදිච්ච ළමයි දෙන්නලු.** එතන තවත් දෙපොළක් නීච කළා. එකක් වෙසඟනක් වීම, අනෙක තිරිසනෙක් එක්ක සංවාසයේ යෙදීම. ඇය කාමුක තැනැත්තියක් බවත්, දෙමව්පියන් ඇය කෙරෙහි කළකිරිල හිටපු බවත් මේ මහා වංශයේ සඳහන් වෙනවා. ඒ වගේම **ඇය කවද හරි තිරිසනෙක් එක්ක සංවාසයේ යෙදෙන බව නැකැත්කරුවන් විසින් ප්‍රකාශ කළ බවත්, ඇය ඒ සඳහා ආසාවෙන් බලාගෙන හිටපු බවත් මේ මහා වංශයේම සඳහන් වෙනවා. නැට්ට වන වනා ආපු තිරිසනෙක් එක්ක සුප්පා දේවිය පැනල ගියයි කියල පැහැදිලිවම ඒකෙ සඳහන් වෙනවා.** ඒ විදියට තිරිසනෙක් එක්ක ගියපු බවමයි සඳහන් වෙන්නෙ. අඩු ගානෙ සිංහ කියන මිනිහෙක් එක්ක පැනල ගියයි කිව්වනම් ඒක තව විස්වාස කරන්නවත් පුළුවන්. නමුත් මේ කියන මහා වංශයේ තියෙනවා, නකුට වන වනා සිංහය ළඟට ආවට පස්සෙ උෟ අත ගගා ඉඳල මේ සුප්පා දේවියව ගල් ලෙනකට ගෙනිච්ච කියල. **දූන් මේ තිරිසනෙකුට දාව ඉපදිච්ච සහෝදරයයි සහෝදරියයි එකතු වෙලා සංවාසයේ යෙදිල, ඒ දෙන්නට දාව ඉපදිච්ච දරුව තමයිලු විජය කියන්නෙ. එතකොට මේ කියන මහා වංශයෙ ඉන්න රජ්ජුරුවො මේ තිරිසනාද? කෝ අර මුලින් කියපු සක්විති රජ පරම්පරාව? ඒ රජ පරම්පරාවට මොකද වුණේ?** බලාගෙන යන කොට, අර කැලේ හිටපු තිරිසනෙක්ගෙන් සුප්පා දේවියට දාව බිහි වෙච්ච ළමයින්ගෙන් තමයි අපේ පරම්පරාව බිහි වෙලා තියෙන්නෙ! මේ කියන විදියට එතනින් තමයි අපේ මුල පටන් අරගෙන තියෙන්නෙ! එතකොට මේ කතා දෙකෙන් මොකක්ද ඇත්ත?

ඊළඟට සිංහබාහු සිංහසීවලී දෙන්නට දාව ඉපදිච්ච ඒ කියන **විජය ගම රට කාල, ඔළුවෙ පැත්තකුත් බූ ගාල රටින් පිටුවහල් කළාලු.** එතනින් තවත් පොළක් නීච කළා. ඒ පිටුවහල් කළ ගමන් තමයි නැව සුළඟට අහුවෙලා ලංකාවට ආව කියන්නෙ. ඒ ආපු විජය තමයි මෙහේ හිටපු කුවේණි එක්ක විවාහ වෙලා සිංහල පරම්පරාව ඇති කළා කියන්නෙ. දූන් මේ විදියට පස් පොළක්ම නීච කරල. **ඒ පස් පොළක් නීච වෙලා හැදිච්ච පරම්පරාවකින්, මේ සිංහල පරම්පරාව එන හැටියට තමයි මේ ඉතිහාස කතාවෙ උගන්වන්නෙ.** නමුත් අපේ මිනිස්සු ඒක දන්නෙ නෑ. ඉතින් ඕකද අපේ මහා වංශය? හරි අපූරු මහා වංශයක්! දූන් ඉතින් මේව කාටද කියන්නෙ? මෙච්චර නීච කරල අපේ මුල පටන් ගත්ත හැටි කියන මේ පොතට අපේ අය සාදු කියලත් වඳිනවා. ඒක අපේ ඉතිහාසය කියලත් උගන්වනවා. නමුත් බලාගෙන යද්දි කියපු තරමක් බොරු තමයි කියල තියෙන්නෙ. ඕක අරගෙන නොදන්නකමට සමහරු නාට්‍ය හදලත් පෙන්වනවා. මිනිස්සුත් ඉතින් උඩ පැන පැන අගක් මුලක් නොදූන බලනවා. දූන් කොහොමද අපි ඕක ඇත්ත කියල පිළිගන්නෙ? **බුදුන් වහන්සේ දේශනා කරපු අර සතර මහාපදේශවලට දාල බලන කොට මේ කතාව අපිට පිළිගන්න පුළුවන්ද?**

අද තියෙන මොන විද්‍යාව **අරගෙන බැලුවත් තිරිසනෙකුට දාව මනුස්ස ස්ත්‍රියකට දරුවො හැදෙන්න විදියක් නෑ. එහෙම න්‍යාය ධර්මයක් කොහේවත් නෑ. ඒක ගැලපිලා නෑ. වෙන්න බැරි දෙයක්. දහමට අනුව බැලුවත් ඒක මහ නීච වැඩක්. බුදුන් වහන්සේ දේශනා කරපු වාසෙට්ඨ සූත්‍රයේ තියෙනවා මිනිස්සුන්ගෙන් මිනිස් ජාතියත්, තිරිසනුන්ගෙන් තිරිසන් ජාතියත් හැදෙන බව.**



ඒ වගේම එක ජාතියකින් තවත් ජාතියක් හැදෙන්නෙ නැති බවත්, ලෙයට ලෙය, සංවාසයට සංවාසය කියන මේවා එක ජාතියකට මිසක් ජාති දෙකක් අතර සංයෝගයක් වෙන්නෙ නැති බවත්, එය නොගැලපෙන බවත් සඳහන් වෙනවා. ඒ වගේම අද **ලෝකයේ මිනිස්සු හදාගත්තු ජාති භේදය මාන්නක්කාරකමට හදාගත්තු එකක් මිසක් නියම ජාති බෙදීමක් නොවන** බවත් මේ සූත්‍රයේ සඳහන් වෙනවා. එතකොට මේ ලෝකයේ ඉන්න විවිධ ජාති බිහිවෙන හැටි එතනින් බලාගන්න පුළුවන්.

දූන් මේ අනුව මේ මිනිස් තිරිසන් සංවාසය කොහොමටවත් ගලපන්න බෑ. නමුත් ඒ වගේ කතා තමයි මේ මහා වංශයෙ තියෙන්නෙ. ඉතින් කොහොමද ඕකෙන් යථාර්ථය දකින්නෙ? නමුත් දූන් ඔය වගේ ඉතිහාස කතා පොත්වලම තමයි, මේ මුළු බුද්ධාගම අපට ගෙනාපු හැටි සඳහන් කරල තියෙන්නෙ. අපට ඉන්දියාවෙන් බුද්ධාගම ගෙනාවයි කියල කියන සියලුම සිද්ධි ඔය පොතේ තමයි සඳහන් වෙන්නෙ.

ඊළඟට මේ බුද්ධ ශාසනයේ හිටපු හොඳ ශ්‍රාවිකාවන්ගෙ සුද්ධ චරිත පවා අන්තිම නීච ස්ත්‍රීන්ගෙ චරිතවලට දාල තමයි මේ පොතේ ලියල තියෙන්නෙ. ඒව කියවන්නවත් බෑ. දූක්කොත් එහෙම මොනවද මේ ලියල තියෙන්නෙ කියල හිතෙනවා. මහ නීච අසභ්‍ය කතා. ඒ කතා බණ දේශනා කරන්න කොහොමටවත් සමාධියට එන්නෙ නෑ. නමුත් ඒව තමයි සමන්තපාසාදිකාව ආදී අටුවාවල ලියල තියෙන්නෙ. ඒ වගේම ඒ අටුවාවල තියෙන සමහර අදහස් මහා වංශයෙත් සඳහන් වෙනවා. ඒ කාලෙ හිටපු අති පාරිශුද්ධ තෙරණින් වහන්සේලාගේ නම්වලට තමයි, මේ අහවල් ගෑනි, අහවල් වෙසඟන කියල ආදේශ කරල තියෙන්නෙ. ඒ වගේම පාරමිතා පුරන කාලයේ බෝසතාණන් වහන්සේගේ චරිතයත් සමහර අටුවාවල එහෙම ආදේශ කරල තියෙනවා. ඒ කාලෙ හිටපු එක තවුසෙක් රැව්ව කියල දොළොස් අවුරුද්දක් වැස්සෙ නැතිලු. ඉතින් මේ තවුසගෙ සිල් බිඳින්න ස්ත්‍රියක් යවල දූෂණය කරවන්න කියල රජතුමා පුරෝහිතට කිව්වලු. රජතුමා දුවට කතා කරල යැව්වලු. ඊළඟට ඒ දුව ගිහින් කරපු විස්තරයක් තියෙනවා. ඒවා කියන්නවත් බැරි මහ නීච කතා.

ඊළඟට සත්තු කරපු වැඩ තියෙනවා. ඉබ්බෙකුයි වඳුරෙකුයි සම්බන්ධ අසභ්‍ය කතාවකුත් ඒ විදියට ගොතල තියෙනවා. ඒවත් වෙන්න පුළුවන් දේවල් නෙවෙයි. නිකන් විහිලු කතා මිසක් දහමට එකඟත් නෑ, විද්‍යාවට එකඟත් නෑ. අද සමහර අය නව කතා, කෙටි කතා ලියනව වගේ ඒ කාලෙත් ලෞකිකව රස විඳින්න පුළුවන් මේ වගේ කතා ලියල තියෙනවා. මිනිස්සු හිනස්සන කතා තමයි බොහොමයක් තියෙන්නෙ. නමුත්

ඒවා බුදු දහමත් එක්ක සම්බන්ධ කරපු එක තමයි මහා භයානකත්වය. මහ විනාශයක් ඒකෙන් කරගත්තෙ. කොහේ හරි ඉඳගෙන ලියපු ඒ වගේ කතා තමයි අද අපිට මහා වංශය, සමහර අටුවා කතා ආදී වශයෙන් කියවන්න ලැබිල තියෙන්නෙ.

ඒ වගේම ඔරුවක ඉඳගෙන ලියපු අටුවා කතාවක් ගැනත් සඳහන් වෙනවා. ඒ කියන්නෙ එතනත් මොකක් හරි හොර වැඩක් තියෙන්න ඕන. මොකද මෙච්චර මේ ප්‍රසිද්ධ තැන් තියෙද්දිත්, මහ තෙරුන් වහන්සේලා ඇසුරේ ඉඳගෙන ගරුත්වයෙන් ලියන්න පුළුවන්කම තියෙද්දිත් ඒ වගේ ඔරුවක ඉඳන් ලිව්වෙ ඇයි කියන ප්‍රශ්නය මතු වෙනවා. ඒක කොච්චර නම් ගරුත්වයකින් කරන්න තිබුණද? එදා ඉඳන් අද වෙනකල් පුස්කොළ පොත්වල ලියල ගෙනාපු ඒව තමයි අද ඔය පොත්වලට අරගෙන තියෙන්නෙ.

**දැන් මේ කියන මහා වංශයත් අවුරුදු 700 ක ආපු කට කතාවලින් ලිව්වයි කියල මහා වංශයේම සඳහන් වෙනවා.** නමුත් අපේ දැන් ඉන්න මේ පිරිසට අවුරුදු 700 ක පටන් තමන්ගෙ පරම්පරාව ආපු හැටි ලියන්න කිව්වොත්, එක්කෙනෙ-කුටවත් තමන් දැකපු පරම්පරාවෙන්වත්, ගෙනාපු පරම්පරාවෙන්වත්, අහගත්තු පරම්පරාවෙන්වත් එහෙම එකක් ලියන්න කියන්න බෑ. කාගෙන් හරි ඇහුවොත් තමන්ගෙ තාත්තගෙ තාත්ත (මුත්ත) කවුද කියල, ඒක කියන්න පුළුවන්. නමුත් ඒ මුත්තගෙ තාත්තගෙ නම (නත්ත) දන්නවද කියල ඇහුවොත් කලාතුරකින් කෙනෙක් තමයි ඒකවත් දන්නෙ. මේ විදියට තවත් පරම්පරාවක් පිටි පස්සට ගිහින්, එයාගෙත් තාත්තගෙ නම (පනත්ත) ඇහුවොත් කොහේ ඉඳන් කොහොම ආවද කියල දන්නෙ නෑ. ඒ විදියට කිත්ත, කිරි කිත්ත ... ආදී වශයෙන් පරම්පරා 7 කට එහා තමන්ට මූලික වෙච්ච කෙනාගෙ නම ඇහුවොත් කවුරුවත් කියන්න දන්නෙ නෑ.

නමුත් මේ හත් මුතු පරම්පරාව කියල කියන්නෙ මහ ලොකු කාලයක් නෙවෙයි, අවුරුදු 200 - 300 කින් මෙහාට අහුවෙන කාලයක්. මොකද හත් මුතු පරම්පරාවට යන කොට, දෙන්නෙක් අතර වයස් පරතරය යන්නෙ අවුරුදු 20 - 30 කින් වගේ පොඩි කාල පරාසයකින්. ඉතින් අවුරුදු 200 - 300 කින් මෙහාට තමන්ගෙ පරම්පරාවවත් දන්න කිසිම කෙනෙක් මේ රටේ නෑ. දිව්‍ය අභිඥා වඩපු කෙනෙක්ගෙ ඒ දිවැසට අහුවුනොත් හැරෙන්න, මේ ඉන්න සාමාන්‍ය කිසි කෙනෙකුට ඒක කියන්න බෑ. දැන් ඉතින් **අපේ පරම්ප-රාවෙ ඉතිහාසයවත් අපි දන්නෙ නැති කොට, කොහොමද වෙන ඉතිහාසයක් ගැන දැන ගන්නෙ? කාටද ඒක කියන්න පුළුවන්? ඉතින් මේව දන්නෙ නැතිව අපි කොහොමද අපේ අගක් මුලක් ලෝකෙට කියන්නෙ?**

අනික් කාරණය තමයි රාජ කතා, චෝර කතා, ජනපද කතා, ස්ත්‍රී කතා, පුරුෂ කතා.... ආදී වශයෙන් කියවෙන දෙතිස් (32) කතාවම මේ මහා වංශයේ තියෙනවා. දැන් අර පරපුර පටන් ගත්තු හැටි කියන කතාවත් මේ දෙතිස් කතාවලින් එන රාජ කතා, චෝර කතා ආදියට ඇතුලත් වෙනවා. **මුළු මහා වංශෙම තියෙන්නෙ ඔය වගේ දෙතිස් කතා. නමුත් භික්ෂු භික්ෂුණීන්ට මේ දෙතිස් කතාවම තහනම්.** ඒවා කතා කරන්න එපා කියල විනය නීතිත් පනවල තියෙනවා.

එතකොට ථේරවාදී පරපුර කියන්නෙ මහා විහාරයේ හිටපු සුද්ධ භික්ෂූන් වහන්සේලා. **ඉතින් ඔය මහා වංශය ලියපු භික්ෂූන් වහන්සේ ථේරවාදී භික්ෂූන් වහන්සෙ නමක් නම්, බුදුන් වහන්සේ විසින් තහනම් කරපු දෙතිස් කතා ලියයිද?** එතකොට දෙතිස් කතාවක්වත් භාවිතා නොකරන ථේරවාදී භික්ෂූන් වහන්සේ නමක්, අවුරුදු 700 ක කට කතාවක් කාගෙන් අහගෙන කොහොම ලියන්නද? ඒක මොන මූල ධර්මයක්ද? මේ කියන එකක්වත් ගැලපෙන්නෙ නෑ. එකකට එකක් පරස්පරයි. ඉතින් මහා වංශය ථේරවාදී භික්ෂූන් වහන්සේ නමක් ලිව්ව කියල කිව්වොත් ඒක වෙන්න බෑ.

එදා තිබ්බ්ච භාෂාව සිංහලට පරිවර්තනය කරල, සිංහලෙන් නැවතත් පාලියට පරිවර්තනය කරල, නැවතත් සිංහලට පරිවර්තනය කරල... මේ ආදී වශයෙන් රවුමක් ගහල මේ කතා පෙළ ගෙනාව කියල තමයි ඉතිහාසෙ තියෙන්නෙ. ඉතින් මෙහෙම පරිවර්තනය වෙවී එන කොට ඒකට මොනව එකතු කරන්න බැරිද? ඒකෙන් මොනව හලන්න බැරිද? ඒ නිසා තමයි 18000 ක් කියල සඳහන් වෙන සූත්‍ර සියල්ලම අද ත්‍රිපිටකයේ නැත්තෙ. ඒවා බොහොමයක් හලල. සමහර අටුවාවලම තියෙනවා දීඝ නිකායේ, මජ්ඣිම නිකායේ මෙච්චර සූත්‍ර ගණනක්, මෙච්චර අකුරු ගණනක් තියෙනවයි කියල. නමුත් බලන කොට එහෙම නෑ. උදාහරණ විදියට ජලනන්දන පිරිත, දස දිසා පිරිත වගේ ඒවා දැන් තියෙන ත්‍රිපිටකයෙ නෑ. හැබැයි මේ ත්‍රිපිටකයේ දැනට තියෙන පාලි අනුවාදය බැලුවොත් ඒ තියෙන ටිකෙන් අර්ථ හොඳට ගැලපිලා තියෙනවා. පරස්පර තැන් නෑ. නමුත් සිංහල පරිවර්තනයේ දෝෂ තියෙනවා.

එතකොට ඉන්දියාවෙ ඉඳන් ආපු සමහර හිමිවරු ලංකාවට ඇවිත් ලියපු පොත් පත් ගැන කතා කරන කොට, ලංකාවෙ හිටපු සිවු පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා හඳුන්වා දුන් හෙළ අටුවාවල තිබ්බ්ච අතිශයෝක්ති කරුණු හා පුනර් දෝෂ ඉවත් කරල සුද්ද කරල, අර පිටින් ආපු හිමිවරු නැවතත් අපට පොත් ලිව්වයි කියල ඒ පොත්වලම සඳහන් වෙනවා. එතකොට සිවු පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා හඳුන්වා දීපු දෙයකින් පුනරුක්ත දෝෂ හා අතිශයෝක්ති කරුණු ඉවත් කරල නැවත ලියන්න ඒ අය කවුද? ඊට පස්සෙ ලොවුතුරා බුදුන් වහන්සෙ පහළ වුනාද වැරදිච්ච ඒව හදන්න? **සිවු පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලාට කොහොමද වරදින්නෙ?** දැන් මේ විදියට දහමට අනුකූල නොවන, වෙන්න බැරි දේවල් අපි කොහොමද පිළිගන්නෙ? ඔය දැන් තියෙන මහා වංශය ඇතුළු සමහර අටුවා කතා ලියල තියෙන්නෙ ඔය විදියට. ඒ අයගෙ ආචාර්ය මත තමයි ඒවායේ බොහොමයක් තියෙන්නෙ. ඒ බවත් පැහැදිලිවම කියල තියෙනවා. එහෙම නැතුව රහතන් වහන්සේලා දේශනා කරපු එකක් කියල සඳහනක්වත් නෑ. දැන් එතකොට කොහොමද හරි කතාව හොයා ගන්නෙ?

ඊළඟට මේ මහා වංශය ලියන්නත් ඉස්සර අතීතයේ ලියවිච්ච දිව්‍යාවදානයේ සඳහන් වෙනවා, බුදුන් වහන්සේ බෝසතාණන් වහන්සේ කාලෙදී සිහලුන්ගෙ පළවෙනි රජ්ජුරුවො වුනයි කියල. බුදුන් වහන්සේ කිව්ව විදියට තමයි ඒකෙ සඳහන් වෙන්නෙ. නමුත් ඒ කතාවත් දිව්‍යාවදානයේ පටලවල තියෙන්නෙ. මොකද බෝසතාණන් වහන්සේ කාලෙ ඔය සිද්ධිය වුනා නම්, බුදු වෙන්න පෙර අත්බවයක වෙන්න ඕන. එතකොට උන්වහන්සේගෙ බුදුවෙන්න පෙර අත්භවයත් තුසිත දෙව්ලොව අවුරුදු පනස් හත් කෝටි හැට ලක්ෂයක් ආයුස තිබුණා. බෝසතාණන් වහන්සේ නමක් බුදු වෙන්න පෙර අත්භවය තවුතිසා දෙව් ලොව ඉපදිලා සියලු ආයුස ගෙවලයි නැවතත් බුදු වෙන අත්බවට එන්නෙ කියන කාරණය ධර්මයෙ පැහැදිලිව සඳහන් වෙනවා.

එතකොට මේ කතාව ඊටත් පෙර සිදු වෙච්ච එකක් වෙන්න ඕන. නමුත් ඔය කියන විදියට සිංහල ජාතියේ ආරම්භය අවුරුදු පනස් හත් කෝටි හැට ලක්ෂයකටත් පෙර වෙන්න පුළුවන්ද? ඒකත් පටලවල තියෙන්නෙ. නමුත් මේ දිව්‍යාවදානය ගැන මෙතන සඳහන් කළේ, මේ හෙළ පරම්පරාව බුදුන් වහන්සේගෙන් පටන් ගත්තයි කියල තවත් සාක්ෂියක් පෙන්වන්න විතරයි. මොකද මේ සිහල ජාතියේ

ආරම්භයට බුදුන් වහන්සේගේ සම්බන්ධයක් තියෙන බව එතනිනුත් මොනව හරි කියන්න උත්සාහ කරල තියෙනවා.

නමුත් මේ කාරණා මොන විදියට පටලවල වසං කළත්, සිවු පිළිසිඹියා ඥානවලට ඔය එකක්වත් වසං කරන්න බෑ. ඒ ඥානවලට ඇත්ත කතාව ගෝචර වෙනවා. දහමට අනුකූලවමයි ඒ සත්‍යය යථාර්ථය මතු වෙලා එන්නෙ. නැවතත් පරස්පර හොයන්න තැන් ඒවායෙ නෑ. විශේෂයෙන් නිරුක්ති පටිසම්භිදා ඥානයට ඔය හැම වචනයකම මුල හැදිච්ච හැටි අහුවෙනවා. ඒ කාරණය පසු ගිය කලාපවලින් පැහැදිලි කළා.

එළි පහළි, එළි පෙහෙළි .... ආදී වශයෙන් යමක් සුද්ධ පවිත්‍ර කරන කොට අදත් කියනවා. හැම තැනම එළියයි කියන එක තමයි එළි කියන්නෙ. ඒ කියන්නෙ සුද්ධ භාවය. සුද්ධ භාවය තියේ නම් තමයි සියලු දේවල් එළි වෙන්නෙ. ඒකට හංගන්න දෙයක් ඉතිරි වෙන්නෙ නෑ. ඒක ඉස්සෙල්ලම ආවෙ ලොවුතුරා බුදුන් වහන්සේට. ඒක තමයි හෙළ කිව්වෙ. ඒ හෙළි වෙච්ච එකේ සුද්ධතම ශ්‍රේෂ්ට භාවය තමයි සීහ හෙළ - සිහල කියල කියන්නෙ. ඒ කියන්නෙ බුදුන් වහන්සේ. ඒක උන් වහන්සේට කවුරුවත් දුන්නු ජාති නමක් නෙවෙයි. සුද්ධ භාවයේ ශ්‍රේෂ්ටයා නිසයි සීහ හෙළය කියල කිව්වෙ. එතකොට සුද්ධ **භාවය පටන් ගත්තු ජාතියක් ඇත්නම් ඒ තමයි සිහල ජාතිය. ඒ සිහල ජාතියේ භාෂාව තමයි සිහල බස, හෙළ බස කියල කියන්නෙ. ඒ තමයි බුද්ධ භාෂිතය.** නමුත් මේක තමයි අද තෝරගන්න බැරුව පටලවා ගෙන තියෙන්නෙ.

මනස නැතිව පංචේන්ද්‍රියන් විතරක් සංවර කරගෙන, පහ එළි කරගත්තු එදා හිටපු බ්‍රාහ්මණ පිරිස වේදය හදාරල යෝගීන් වුණා, ධ්‍යාන ලාභීන් වුණා. ඒත් එක්කම බ්‍රහ්ම කල්පික මිනිස්සුන්ගෙ පැත්තට සම්බන්ධය තියෙන ඒ සුද්ධ ගති ලක්ෂණයට හෙවත් මාගධී භාෂාවට කිට්ටු ගති ලක්ෂණ තියෙන හඬක් ඒ අයට ආවා. ඒක තමයි පාලි කිව්වෙ. සාමාන්‍යයෙන් ඒ කාලෙ ලෞකික ගුණ ධර්ම තිබිච්ච අය භාවිතා කරපු භාෂාව තමයි පාලි කියන්නෙ. මනසත් එක්ක ඉන්ද්‍රියන් 6 ම එළි කර ගත්තු සුද්ධ හෙළ භාෂාව ඒ කාලෙ තිබුණෙ නෑ. **බුදුන් වහන්සේ තමයි පළමුවෙන්ම මනස කියන 6 වෙනි ඉන්ද්‍රියත් සුද්ධ කර ගෙන, හය එළි හෙවත් හෙළි කරගත්තෙ. ඒ හෙළි කරගත්තු ගති ලක්ෂණයට අදාල භාෂාව තමයි හෙළ කියන්නෙ.** ඒ සුද්ධ වෙච්ච හෙළ භාෂාවෙන් තමයි බුදුන් වහන්සේ, භික්ෂූන් වහන්සේලාට කතා කළේ. ඒ කියන්නෙ සිවු පිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා බවට පත් වුණාට පස්සෙ ලැබෙන බුදු බස. ඒ භාෂාව අනෙක් අය දැනගෙන හිටියෙ නෑ. නමුත් උන් වහන්සේලාට තියෙන මහා සුද්ධතාවය නිසා ඒක නිරායාසයෙන්ම ගලා ගෙන එනවා. උන් වහන්සේලා ඒකෙන් කතා කරන්න ගත්තට පස්සෙ තමයි සීහ හෙළ හෙවත් සිහල (හෙළ) පරම්පරාවක් බිහි වුණේ.

මෙතනදී සීහ හෙවත් ශ්‍රේෂ්ටයා කියන්නෙ බුදුන් වහන්සේට. එහෙම නැතිව දැන් මේ කියන සතර අපාගත සිංහයා කියන එක නෙවෙයි. බුදුන් වහන්සේ ඇරෙන්න හෙළ කියන සුද්ධතාවයේ ශ්‍රේෂ්ටතම සුද්ධතාවය ලබපු කවුරුවත් නෑ. **එතනින් පටන් ගත්තු සීහ හෙළ පරපුර තමයි භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා වශයෙන් ආපු සිවු පිරිස.** මෙතනදී සිවු හෙළය කියල වචනයක් ඉතිහාස පොත්වල එනවා. නමුත් ඒකෙ අර්ථය දීල නෑ. **මේ සිවු හෙළය කියන එකේ නියම අර්ථය තමයි භික්ෂු භික්ෂුණී, උපාසක, උපාසිකා කියන සිවුවනක් පිරිස.** ඒ අය තමයි සිවු හෙළයට අයිති වෙන්නෙ. එතකොට මේ සිවු හෙළය පටන් අරගෙන තියෙන්නෙ මේ හෙළ දේශයෙන්. ඒ පිරිස ලෝකයේ කොහේ හිටියත්, ගොඩ නැගෙන මූල ධර්මය මේකයි.

ඉතින් මේ විදියට එදා තිබිච්ච ඔක්කොම විස්තර අදත් සැඟවිලා තියෙනවා. නමුත් ඒව ඔක්කොම අද යටපත් වෙලා තියෙන්නෙ. **මේ භූමියේ තිබිච්ච සෙල් ලිපි පෙනි පෙනී යට ගහල තියෙන්නෙ. කරුණු කාරණා හොඳට හොයල බැලුවොත් භවත් ගෞතමයන්ට (බුදුපියාණන් වහන්සේට), සැරියුත් හිමියන්ට, මුගලන් මහ රහතන් වහන්සේට, ආනන්ද හිමියන්ට ලෙන් පූජ කරපු සෙල්ලිපි අදටත් මේ රටේ තියෙනවා. ධර්ම භාණ්ඩාගාරික ආනන්ද කියලම ඒ සමහර සෙල්ලිපිවල සඳහන් වෙනවා.** ඒ කියන්නෙ ඒ හෙළ පරම්පරාවට පූජ කළා කියල සාක්ෂි පෙන්වන්න පුළුවන් සෙල්ලිපි අදටත් තියෙනවා. නමුත් ලාභ, කීර්ති, ප්‍රශංසාවලට ගිජු වෙච්ච අය මේව කියනවට බොහොම අකමැතියි. නමුත් එහෙම අකමැති වුණයි කියල මේව නොකිය ඉන්නත් බෑ. මොකද මේවායේ තියෙන සත්‍ය අසත්‍යතාවය මිනිස්සු කවද හරි දැනගන්නත් ඕන.



දැන් මේ විදියට මේ කරුණු කාරණා ඉදිරිපත් කළේ, තුන් ලෝකයෙන්ම උතුම් වූ, ශ්‍රේෂ්ට වූ බුදුන් වහන්සේ ප්‍රමුඛ හෙළ පරම්පරාව මෙච්චර නීච නිග්‍රහයන්ට යටත් කරල, අපි නොදන්නා අපේ හෙළ පරම්පරාව නන්නත්තාර කරපු විදිය පෙන්වා දීල, සැබෑ හෙළ පරම්පරාව හෙළිදරව් කිරීමට මිසක්, කාටවත් අපහාසයක් නිග්‍රහයක් කරන්නවත්, කාගෙවත් පැත්තක් ගන්නවත් නෙවෙයි. ඒ හෙළ පරම්පරාවෙ මුල දැන ගත්ත නම්, මේ ලෝකයේ හේතු වාසනා තියෙන නැණවත් පිංවතුන්ට, ලෝක සම්මත ජාති භේදයකින් තොරව හෙළ බවට පත් වෙලා සදා සැනසීම තියෙන නිවන් සුවය අත්පත් කරගන්න පුළුවන්.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෝවහ අඬෝවැඩියාවලින් ලෙඩ රෝග කරදර ඇති වන හැටි

*(පසුගිය කලාපයෙන් - ඇස්වහ කටවහ මගින් ලෙඩ රෝග කරදර ඇති වන හැටි.....)*

අද සමාජයේ කතා නොකරන, මනුස්සයාට හා මනුස්සයා ඇසුරු කරන වස්තු සම්පත්වලට ලෙඩ රෝග කරදර හදන තවත් පැත්තක් තමයි මේ හෙළිදරව් කරන්නෙ. ඇස්වලින් හා කටින් පිටවෙන වස ඇස්වහ කටවහ වගේ, **හදවතින් නැගෙන වස තමයි හෝවහ කියල කියන්නෙ.** ඒ කියන්නෙ වචනයෙන් පිට නොකර හිතෙන් සාප කරනවා, හූල්ලනවා. ''අනේ වෙච්ච දෙයක්! අනේ අපට නැනෙ! අරුන්ට හැදිල තියෙන හැටි! උන්ට නම් කිරි ඉතිරෙනවා, ඕකුන් පට්ට හොරු, උන් අසාධාරණ විදියට හරි හම්බ කරගත්තෙ, ඕකුන්ට නම් වගතුවක් වෙන්න එපා...'' මේ විදියට තනියෙන් හිත හිතා හූල්ලනවා. එතකොට හදවතින් විස කිරණක් නැගෙනවා. ඒ කිරණ, අරමුණු කරපු තැනට විහිදෙනවා. එහෙම විහිදිලා හේතු තියේ නම් ඒ පුද්ගලයාට හෝ වස්තුවට වදිනවා. එහෙම නැතිව නිකම්ම වදින්නෙත් නෑ. ඒකාන්තයෙන්ම සමනන්තරයක් තියේ නම් සමහර විට එතැන හේතු තියෙනවා. එතකොට අනන්තර වශයෙන් සසරෙදි කරපු හේතුවක් තියේ නම්, සමනන්තරයක් නැතත් ඒකට අර අනන්තරයෙන් කොටසක් හරි ප්‍රත්‍ය වෙන්න පුළුවන්. එතකොට ඒ අනන්තරය විසින්ම සමනන්තරයක් ගොඩ නගාගෙන එනවා. එහෙම ප්‍රත්‍ය වෙලා වදින්න පුළුවන්. උදාහරණ විදියට සාමාන්‍ය කෙනෙක් හේතුවක් තියේ නම් තවත් කෙනෙක් එක්ක රණ්ඩු වෙනවා. නමුත් කෙනෙකුට රණ්ඩු වෙන්නම ඕන නම්, හේතුවක් හදාගෙන හරි රණ්ඩුවට එනවා. එතකොට ඒක හරි බලවත්.

දැන් මේ හෝවහවලදී ඒකට ලක් වෙන පුද්ගලයා හෝ වස්තුව ළඟ ඉන්න ඕන නෑ. දන්නව, හඳුනනව නම් ඒ ප්‍රමාණවත්. එහෙම නැත්නම් නමක්, ගමක් අහල තියෙන පුද්ගලයෙක් වෙන්න ඕන. නම ගම අහල තිබුණොත් අපි නොදැක්කට, අපිට නොදැනුනාට ඒක හිතට අරමුණු වෙනවා. ආවර්ජනය කිරීමේ ශක්තිය මදිකම නිසයි අහුවෙන්නෙ නැත්තෙ. **පුද්ගලය කොහේ හරි ඉන්නව නම්, හිතට අරමුණු නොවන කිසිම දෙයක් නෑ. ලෝකෙ සියල්ලම හිතට අරමුණු වෙනවා. ඒක තමයි හිතේ ස්වභාවය.** ධර්මයේ පෙන්වා තියෙන කාරණයක් තමයි, මනසට සියල්ල අරමුණු කිරීමේ හැකියාව තියෙන බව. මේ නිසා බාධක නැතිවම මනස යම් අරමුණක් කරා එල්ල කරන්න පුළුවන්. නමුත් ඒක බාහිර හේතු නිසා තමයි වැහිල තියෙන්නෙ. ඒ නිසා අරමුණු වීම තමන්ට බාහිරට එළි දක්වගන්න බැරි වෙනවා. මනස නිදහස් කරපු මට්ටමට එළි දකිනවා. ඒ මට්ටමින් පර සිත් දැකීමේ හැකියාව ධ්‍යාන සමාධි ආදියේදී ලැබෙනවා. මේ විදියට අරමුණු දැනගැනීමේ හැකියාව නිසා තමයි ලොවුතුරා බුදු වෙන කොට සර්වඥතා ඥානය ලබන්න පුළුවන් වෙන්නෙ. ඒ ඥානයට සියල්ල අරමුණු කිරීමේ හැකියාවත්, ආවර්ජනය කිරීමේ



හැකියාවත් ලැබෙනවා. එතකොට මේ අරමුණු වෙච්ච දේ වැටහෙනව නම්, ආවර්ජනය කරන්න හැකියාව තියේ නම් තමයි, ඒ පුද්ගලය කවුද කියල හරියටම දැන ගන්න පුළුවන් වෙන්නෙ. නමුත් ඒ විදියට අරමුණු වෙන දේ සියයට සියයක්ම ආවර්ජනය කරන්න හැකියාව තියෙන්නෙ ලොවුතුරා බුදුන් වහන්සේ නමකට පමණයි. අනෙක් අයට ඒ හැකියාව නෑ.

උදාහරණ විදියට යම් කිසි කෙනෙක් නමක් ගමක් කිව්ව කියල හිතමු. ගුණපාල කියල කිව්වොත්, අපි දන්නෙ නෑ ගුණපාල කියන නමින් කී දෙනෙක් නම් ඉන්නවද කියල. නමුත් මෙතනදී ගුණපාල කියල ඒ පුද්ගලය අදහස් කළේ, යම් කිසි විදියකින් අඩු ගානෙ හෝඩුවාවකින් හරි තමන් දන්න කෙනෙක්. එතකොට ඒ අදහස් කරපු කෙනා කවුද කියල, මනස ක්‍රියාත්මක වෙලා එතනින් විහිදෙන කිරණක් අර තමන් අදහස් කරපු ගුණපාල ළඟට ගිහින් වදිනවා. එතකොට ඒක අහගෙන ඉන්න කෙනාට අරමුණු වෙනවා. මේකම තමයි සමහර අය සාස්තර කියන කොට නමක් ගමක් අහල බලපුවම, තමන්ට පේන දේ පේන කියනවයි කියල කියන්නෙ. එතකොට සාස්තරය අහන්න ගිය පුද්ගලය අදහස් කරපු කෙනා හෝ වස්තුව අරමුණු වෙනව නම්, ඒ අරමුණු වෙන දේ පේනවා. ඒ වගේ තමයි නම ගම කිව්වම ඉන්න දිහාවක් දන්නෙ නැති වුණත්, අඳුනෙන් බලන ක්‍රමයකින් ඒකත් කියනවා. මෙන්න මෙහෙම දිහාවක, මේ වගේ තැනක ඉන්නව කියල ඒ ආදී වශයෙන් කියනවා. කපටි වංචා නොකරන, ඒ වගේ හරියට කෙරෙන තැනුත් තියෙනවා. කොහොම හරි මේ විදියට යන්තම් සෝයාවක්, හෝඩුවාවක් තියේ නම් ඒ ගැන සම්පූර්ණයෙන් අරමුණු කර ගැනීමේ ශක්තියක් මනුස්සයාට තියෙනවා. මේ හඳුනා ගැනීමට හොඳ උදාහරණයක් විදියට එක්තරා කාලයක සිද්ධ වෙච්ච සිදුවීමක් මේ විදියට සඳහන් කරන්න පුළුවන්.

මෙතනදී තියෙන්නෙ අඳුරු කරපු පෙට්ටියක්. ඒක ඇතුලෙ මොකවත් නෑ. ඒ තුළින් තමයි බලන්නෙ. ඒ අඳුරට සම වැදිල බලන කොට ඒ තුළින් ආලෝක වෙලා මොනව හරි සිද්ධියක් පේන්න පටන් ගන්නවා. මේ විදියට බලන්න පුළුවන් බොහොම දක්ෂ කෙනෙක් ඉන්දියාවෙ හිටියලු. ලංකාවෙ හිටපු පශු වෛද්‍ය පිරිසක් මේ පුද්ගලයගෙ දක්ෂතාවය බලන්න, හරකෙක්ගෙ ලේ බිංදුවක් අරගෙන මොකවත් විස්තරයක් කියන්නෙ නැතිව, ඒ ලේ බිංදුවෙන් විස්තරයක් කරල එවන්න කියල අර පුද්ගලයට යැව්වලු. ඊට පස්සෙ ඔහු ඒ ලේ බිංදුව අරගෙන අර අඳුන තුළින් බලන කොට, ඒක හරකෙක්ගෙ ලේ බිංදුවක් කියල පෙනුනලු. ඒ වගේම ඒ හරකට බඩ මහත් වෙලා කෑම හිරවෙන අසනීපයකුත් තිබුණලු. අර අඳුනෙන් බලන කොට උගේ බඩේ කම්බි ගුලියක් තියෙන බවත් අහුවුණාලු. ඒ කියන්නෙ ඌ මොනව හරි ගිලල, ඒ ගිලපු ගුලිය සෙමත් එක්ක බැඳිල හිරවෙලා ඒක තමයි රෝගය විදියට අහුවෙලා තියෙන්නෙ. දැන් මේ විදියට රෝග විස්තරයත් කියල ඒ හරකගෙ පාට, ස්වභාවය ආදී විස්තරත් ඔක්කොම ☞

කියල එච්චලු. එතකොට වෙන රටක ඉඳලත් අර විදියෙ පුංචි ලේ බිංදුවකින් විශාල විස්තරයක් කියන්න පුළුවන් වුණා. නමුත් අපේ මනස දුර්වල නිසයි අපිට ඕක තේරෙන්නෙ නැත්තෙ. **හැබැයි සමහර තිරිසන් සතුන්ට කර්ම විපාකජ ඍද්ධියකින් පිහිටපු ඉව නිසා, සාමාන්‍ය මනුස්සයින්ට වඩා යමක් දැන ගැනීමේ හැකියාව ලැබිල තියෙනවා.**

උදාහරණ විදියට යම්කිසි හොරු කණ්ඩායමක් ගෙදරකට පැනල හොරකමක් කරල, ගිනි කූරක් පත්තු කරල දාල පැනල ගියයි කියල හිතමු. එතකොට පොලිස් සුනඛයෙක් ගෙනත් සෝදිසි කරල, අර ගිනි කූරු කෑල්ල ඌට කියල ඉව කරවනවා. දැන් ඌට පුරුදු කරල තියෙන්නෙ ඒ ඉව පස්සෙ යන්න. දැන් අර ගිනි කූරෙ තියෙන හොරුන්ගෙ ඉව අපිට තෝර ගන්න බැරි වුනාට බල්ලට ඒක තේරෙනවා. ඒක තමයි කර්ම විපාකජ ඍද්ධියක හැටි. එතකොට හොරු අඩිය ගහගෙන ගියපු පාර ඌ ඉව අල්ලල, මොහොතකින් ඒ ඔස්සේ හොයාගෙන යනවා. මොකද අර අඩිය ගහපු තැන තියෙන උෂ්ණය, ඉව දවස් ගානක් ගිහිල්ලත් තියෙනවා. ඒ ඔස්සෙ තමයි ඌ හොයාගෙන යන්නෙ. මේ කාරණය යම්කිසි මනසකට ආවර්ජනය කරන්න පුළුවන් නම්, ඒක හොයාගන්නත් පුළුවන්. නමුත් එහෙම ආවර්ජනය කරන්න බැරි නිසා තමයි වැටහෙන්නෙ නැත්තෙ.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, තිරිසන් වෙලත් එහෙම හැකියාවක් තියේ නම් ඇයි ඊට වඩා පුණ්‍ය ශක්තියකින් ඉපදෙන මනුස්සයින්ට එහෙම හැකියාවක් නැත්තෙ කියල. ඒකට හේතුව මේකයි. **උපතින් උපක්‍රමශීලී ශක්තිය තිබිච්ච මනුස්සයා දස අකුසල්වලට වැටීම නිසා ඒ ශක්තිය යටපත් වෙනවා. ඒ කියන්නෙ ප්‍රයෝග විපත්තියට පත් වෙනවා. ඒ අනුසාරයෙන් ගතිය වෙනස් වෙලා ගති විපත්තිය එනවා. ඊළඟට ස්වභාව ධර්මය වෙනස් වෙලා කාල විපත්තිය එනවා. ඒ කාල විපත්තිය නිසා හට ගන්නා රස හීන වූ භව භෝග පරිභෝගයෙන් උපධි විපත්තිය වශයෙන් ලෙඩ රෝග ආදිය හැදෙනවා. අදත් වෙලා තියෙන්නෙ ඒකයි.** නමුත් කවද හරි දස අකුසලයෙන් වෙන් වෙලා චතුර්ථ ධ්‍යානයට සම වැදිච්ච දවසට අර සුද්ධ භාවය නැවතත් නැගිල බාහිරින් නොපෙනෙන දේවල් පවා අරමුණු වෙන්න පටන් ගන්නවා. එතකොට සතුන්ට වඩා ශක්තියක් මනුස්සයාට නැගෙනවා. ඒකෙන් හරියටම යමක් එල්ල කරල කියන්න පුළුවන් හැකියාවත් ලැබෙනවා. යම් වස්තුවක් දක්කමත්, ඒ ගැන හිතන කොටම ටක් ගාල හරියට අරමුණු කරල ආවර්ජනය කළොත්, ඒක කවුද හැදුවෙ කියල අහු වෙනවා. ඒ වගේ ක්‍රමයක් මේ හෝවහවලදීත් සිද්ධ වෙනවා.

උදාහරණ විදියට කෙනෙක් මරල දාල තිබුණ කියල හිතමු. නමුත් මරපු කෙනෙක් හොයාගන්න නෑ. හැබැයි හොයාගන්න බැරිවුණාට කොහේ හරි අනිවාර්යයෙන්ම ඉන්නවා. දැන් කෙනෙක් ගිහින් මළ මිනිය දිහා බලල මෙහෙම හිතනවා. ''අනේ අප්පච්චියේ මේ මනුස්සයට කරල තියෙන අපරාදේ! අනේ මේ අපේ අහවල් එක්කෙනානෙ! කාටවත් කරදරයක් නැති මනුස්සයා! හෙණ හතම ගහන්න ඕන මේක කරපු එකාට.'' දැන් මෙහෙම හිතෙන් හිතනවා. හැබැයි මේ හුල්ලන මනුස්සයට ආවර්ජනය කරන්න බැරි නිසා මිනී මරුව දන්නෙ නැති වුණාට මනස ඒක දන්නවා. ඒ කියන්නෙ කවුරු හරි මිනීමරුවෙක් ඉන්න එපැයි. නිකං මැරුනෙ නැනෙ. මේ නිසා අර කරන සාප සිතිවිල්ල ඒ ඔස්සේ මිනීමරුවව හොයාගෙන යනවා. ගිහින් ඒ පුද්ගලය කොහේ හිටියත් හේතු තියෙන ප්‍රමාණයට ඒක වදිනවා. එහෙම වදින නිසා තමයි මේ වගේ මිනීමැරුම් කරපු පුද්ගලයො කාලයක් ගිහිල්ල හරි නීතියේ රැහැනට කොටු වෙන්නෙ. එතකොට මේ විදියට කරන සාප කිරීම් තමයි හෝවහ කියන්නෙ. ඉතින් දිවැස් තියෙන කෙනෙක් ඕක යොමු කරල බැලුවොත්, ඒ පුද්ගලයා කවුද කොහේද ඉන්නෙ ආදී කාරණා පේනවා. ඒ අරමුණ ආවර්ජනය කරන්න පුළුවන් නම් තමයි එහෙම පේන්නෙ. ඒකට බලවත් දිවැසක් තියෙන්න ඕන. අනෙක් අයට දිවැස් නැති වුණාට අර වගේ හිතට අරමුණු වෙනවා. නමුත් ආවර්ජනය කරගන්න බෑ. උදාහරණ විදියට අපි හිතලම හුස්ම ගන්නවා, පිටකරනවා. නමුත් නින්ද ගිහින් ඉන්න වෙලාවට කී පාරක් හුස්ම ගත්තද, කොහොමද හුස්ම ගත්තෙ කියල ඇහුවොත් ඒක අපි දන්නෙ නෑ. මොකද, හිත ක්‍රියාත්මක කළත් ආවර්ජනය කරන්න බෑ. ආවර්ජනයක් නැති නිසා අපිට ඒක දැනෙන්නෙ නෑ.

ආවර්ජනය කිව්වම ක්‍රම දෙකක් තියෙනවා. එකක් තමයි විපාක සිතේ ආවර්ජනය. ඒක තමයි මනස දන්නෙ. ඒකෙන් අරමුණු වෙනවා. ඊළඟ එක ජවන් සිතේ ආවර්ජනය. ඒක තමයි හරි බලවත් වෙන්නෙ. නමුත් ජවන් සිතේ ආවර්ජනය දුර්වල නිසා තමයි වැටහෙන්නෙ නැත්තෙ. උදාහරණ විදියට කෙනෙක් නිදාගෙන ඉන්න කොට තියෙන්නෙ පරිත්තාරම්මන චිත්ත වීථි ඒ කියන්නෙ ජවන් පහළ නොවන චිත්ත වීථි. මෙතන දී විපාකාවර්ජනය තමයි එන්නෙ. උදාහරණ විදියට නින්දෙදි කෙනෙක් කෙනිත්තුවොත් කෙඳිරි ගාන්න පුළුවන්. ඒ වගේම සිහි නැති වෙච්ච වෙලාවට තියෙන්නෙ අතිපරිත්තාරම්මන චිත්ත වීථි. එතන දී විපාකාවර්ජනයවත් එන්නෙ නෑ. ඒ කියන්නෙ කෙනිත්තුවත් ප්‍රතිචාරයක් නෑ. දැන් මේ අවස්ථා දෙකේදිම ජවන නෑ. ඒ වෙනුවට වීථි භවාංග විතරයි තියෙන්නෙ. අපිට ආවර්ජනය වෙන්නෙ නෑ කිව්වෙ මෙන්න මේ කියන ජවන් ආවර්ජනය නොවීම. එතකොට ඒක වැටහෙන්නෙ නෑ.

කෙනෙකුට පිස්සු හැදුනම ඒ පුද්ගලය දන්නෙ නෑ මොනවද කරන්නෙ කියල. එතකොට පරිත්තාරම්මන චිත්ත වීථි තමයි වැඩියෙන් එන්නෙ. මහන්තාරම්මන චිත්ත වීථි ආවත් ජවන මෝහ මූලික වෙනවා. මෝහය මුල් වෙලා ඒ පුද්ගලයා අගක් මුලක් දන්නෙ නැතිව ඕනම දෙයක් කරනවා. **(ලෝභය මුල් වුනොත් කාටවත් දෙන්නෙ නැතුව අල්ලගෙන ඉන්නවා, ද්වේශය මුල් වුනොත් මරාගෙන මැරෙන්න යනවා, මෝහය මුල් වුනොත් මොකක්ද කරන්නෙ කියල නිච්චි නැතුව යනවා)** උදාහරණ විදියට පංච කාමය විඳින්න චේතනාවක් ආවොත් කිසිම ලැජ්ජාවක් බයක් නැතිව ඒක ඒ ආකාරයෙන්ම කරන්න පෙළඹෙනවා. නමුත් ප්‍රඥාව මුල් වුණාම ධර්මානුකූල දෙයක්මයි කරන්නෙ. ඒක මග ඵල ලාභීන්ට විශේෂයි. ඒ නිසා තමයි මග ඵල ලාභියෙක් සතර අපාගත නොවෙන්නෙ. නමුත් පිස්සු හැදිච්ච කෙනෙක්ගෙ පුරුද්ද ක්‍රියාත්මක වෙනවා. ඒ නිසා **පිස්සු හැදිච්ච කෙනෙක් හැම වෙලේම හංගන්නෙ නැතිව තමන්ගෙ පුරුද්ද එළියට දානවා. තිරිසන් සතුන්ටත් තියෙන්නෙ මේ වගේ ස්වභාවයක්. උන්ගෙ උපත් ගතිය හංගන්නෙ නැතිව එළියට දානවා. මේ නිසා සත්තු බොරු කරන්නෙ නෑ. උදාහරණ විදියට බල්ලෙක් නගුට වනල හපා කන්නෙ නෑ. ඌ නගුට වැනුව නම් ඇත්තටම ඒ ලෙන්ගතුකමින්ම තමයි. මිනිස්සු වගේ නෙවෙයි. මිනිස්සු නම් පිටින් ලෙන්ගතුකම පෙන්වල යටින් ගින්දර දෙනවා. නමුත් එහෙම දෙයක් සතුන්ට නෑ.**

මේ විස්තර කළා වගේ සිද්ධියක් හෝවහ කියන එකේදිත් සිද්ධ වෙනවා. ආවර්ජනය නොවුනට, ඒ සාපය හදවතින්ම නගන කොට ඒ අරමුණු ඔස්සේ සිතිවිලි තරංග ගමන් කරනවා. එහෙම ගමන් කරල අදාල පුද්ගලයාට හෝ වස්තුවට වදිනවා.

දැන් මෙතනදී අරමුණු කිව්වම ඒක විපාකයක්. ඒක අපේ පාලනයෙන් තොරයි. ඒ නිසා ඒක නිකන් උපේක්ෂාවෙන් ගලාගෙන යනවා. නමුත් ආවර්ජනය කියන එක එහෙම නෙවෙයි. ඒක ජවන් සිත්වලට මුලින් සම්බන්ධ ක්‍රියා සිතක්. ඒ කියන්නෙ පුණ්‍ය, අපුණ්‍ය, ආනෙඤ්ජාභි කියන මේ සංඛාරත් එක්ක ජවන් ආවර්ජනය සම්බන්ධයි. අරමුණු සංඛාර වශයෙන් වැටහෙද්දි කරන ආවර්ජනය පුද්ගලයත් එක්ක සම්බන්ධයි. ඒ නිසා අවිද්‍යා සහගතව කරන ජවන් ආවර්ජනය මුල් කරගෙන හට ගන්නා ද්වේශ සිත් තමයි සාපයක් වෙන්නෙ. එහෙම නැතිව හැම ආවර්ජනයක්ම සාපයක් වෙන්නෙ නෑ.

විශේෂයෙන් මේ හෝවහ ☞

වදින්නෙ සාප කරන අයට තමයි. ඒ කියන්නෙ විනාශයක් කරල, දූෂණය කරල, මංකොල්ල කාල, මරල දාල අපරාධයන් කරපු දේවල් සම්බන්ධයෙන්. ඒ වගේම ඉඩකඩම්, ගෙවල් දොරවල්වලට කුලල් කාගෙන, ගස්වල ගෙඩි කඩාගෙන නොයෙක් දේවල් කරන කොට, එතනින් අවාසියට ලක් වෙන කෙනා මේ වගේ සාප කර කර හූල්ලනවා. ''අනේ වෙච්ච දෙයක්! අවුරුදු ගාණක් මෙච්චර මේ මහන්සියෙන් මං හදාගත්තු කෙහෙල් කැන! මොන තරම් අපරාධයක්ද? මේක කපාගෙන ගියපු එකාට හෙණ හතම ගහනවා.'' දැන් මෙහෙම තනියෙන් හිත හිතා හූල්ලනවා. මෙහෙම හූල්ලන කොටත්, ඒ කෙහෙල් කැන කැපුව කෙනාව ආවර්ජනය නොවුනට මනස දන්නවා, මනසට අරමුණු වෙනවා. එතකොට ඒ ඔස්සේ කිරණ ගමන් කරනවා. එහෙම ගිහින් අදාල පුද්ගලයට වදිනවා. හෙණ හතම ගහපන් කියල කිව්වොත් එහෙම සෙල්ලමක් නෙවෙයි. හේතු තිබුණොත් වදිනවා. වචනවලින් කිව්වත් ඒ වචන සමග ගොඩ නැගෙන සිතිවිලි හෝවහ වෙන්න පුළුවන්. ඒ වගේම ඒ වචන කටවහ වෙන්න පුළුවන්. එතකොට කටවහ හෝවහ කියන මේ දෙකම පිටවෙනවා. ක්‍රියාවත් ඒ වගේමයි. ඒකෙන් සාපය තවත් වැඩි වෙනවා. උදාහරණයක් විදියට **කෙනෙක් වැලි අහුරක් අරගෙන හෙණ හතම ගහපිය කියල බිම ගැහුවොත් ඒක හරි බලවත්. ඒකෙන් මහ හෝවහ කොටසක් හැදෙනවා.**

**මෙතනදී ලෝක සම්මතයේ භාවිතා වන කියමනක් තමයි ''හද පත්ලෙන්ම නැගෙන වචන'' කියන්නෙ. හැබැයි වචන භාවිතා කළාට ඒක ක්‍රියාත්මක වෙන්නෙ නැති අවස්ථාත් තියෙනවා. මේකට හොඳ උපමා කතාවක් බුදු දහමේ සඳහන් වෙනවා. එක්තරා ළමයෙක් තමන්ගෙ අම්ම කියන දේවල් අහන්නෙ නැතිව කැලේට ගියා. ඉතින් දවස් කිහිපයක් මේ විදියට යන්න එපා කියල අවවාද කළත් ඒ ළමය ඒක ඇහුවෙ නෑ. මේ නිසා ඊළඟ දවසෙත් එපා කියද්දි යන කොට, තොට අද කුළුමීම ඇණපිය කියල ඒ අම්ම ළමයට කිව්වා. දැන් මෙහෙම යන කොට එදා ඇත්තටම කුළුමීමෙක් ඉස්සරහට ආවා. ''අම්ම යමක් හිතින් හිතුව නම් ඒක වේවා, වචනයෙන් කිව්ව නම් ඒක නොවේවා'' කියල මේ ළමය අධිෂ්ඨානයක් කරල සත්‍යක්‍රියාවක් කළා. එතකොට අර කුළුමීම වෙනත් පැත්තකට හැරිල පලා ගියා.**

**දැන් මේ වගේ, දෙමවුපියො ළමයින්ව බොරුවට බය කරනවා. බනිනවා. හැබැයි එහෙම කරන්නෙ කරදරයක් වෙන්න කියන චේතනාවෙන් නෙවෙයි, ඒක අහල හැදියන් කියන අදහසින්. එතනදී වචන ප්‍රකාශ කළත් ඒවා හද පත්ලෙන් නැගෙන වචන නෙවෙයි. මේ වගේ යමෙක් වචන ප්‍රකාශ කරපු පළියට ඒක සාපයක් වෙලා ඵල දෙන්නෙ නෑ. නමුත් අර විදියට හද පත්ලෙන්ම නැගෙන කොට ද්වේශය මූලිකවයි ඒක සිද්ධ වෙන්නෙ. ඒව ඵල දෙනවා.**

දැන් මේ විදියට විශේෂයෙන් අරමුණක් එල්ල නොකළත්, මේ හෝවහ වදින අවස්ථා තියෙනවා. උදාහරණ විදියට කෙනෙක්ගෙ හදවතින් මෙහෙම දෙයක් නැගෙන්න පුළුවන්. ''අනේ මේ ලෝකෙ මිනිස්සු කරන අපරාධයක හැටි! එළවළුවලට වස විස ගහල මුන් සල්ලි හම්බ කරනවා! යකෝ මිනිස්සු මරණවට, ලෙඩ කරනවට මුන්ට හෙණ හතම ගහනවනෙ! මුන්ට සල්ලි හම්බ කරන්න තියෙන කෑදරකමට කරන මේ අපරාධය මොන තරම් සහ ගහනවද?'' එතකොට මෙහෙම හිතන කොට ඒක පුද්ගලිකව තමන්ට වෙච්ච දේකුත් නෙවෙයි, ඒ වගේම ඒ වස විස කරන අයව දැකලත් නෙවෙයි. නමුත් අර සිද්ධිය දැකල හිත ඒකට අරමුණු වෙනවා. ඒ කියන්නෙ වස විස ගහල එළවළු හදනවයි කියන කාරණය දන්නවා. ඒව තමයි කඩවල්වල හැම තැනම වගේ විකුණන්න තියෙන්නෙ කියන කාරණයත් දන්නවා. දැන් ඒ කාරණය දැනගෙන අර විදියට හිතෙන් හිතන කොට ඒකත් වදිනවා. වස් වදිනව කියන්නෙත් මේක තමයි. ඒ තමයි හෝවහ. ඒක කටවහට වැඩිය වෙනස්. ඒකට ඇත්තටම හදවත ලතැවෙන දෙයක් වෙලා තියෙන්න ඕන. නිකන් ලතැවෙන්න බෑ. හැබැයි කටවහේදි වුණත් හදවතින් ආපු වේගෙට කටින් කතා කළාට, සමහර වෙලාවට ඒකත් ඉරිසියාව නිසා ලතැවෙන එකක් වෙන්න පුළුවන්.

උදාහරණ විදියට යම්කිසි පිරිසක් පුංචි පැල් කොටයක පොඩියට කුළී වැඩ කරගෙන ජීවත් වෙනවා. නමුත් ටික කලකින් බලන කොට, තමන්ට වඩා මේ මිනිස්සු ඉහළට ගිහින්. රට ගිහින් හරි හම්බ කරගෙන කොහොම හරි තමන්ට කියල ලොකු ගෙයකුත් හදල වාහනයකුත් ගත්තොත්, දැන් මොකද හිතෙන්නෙ? ''මුන් අපේ වළං හෝදල කාපු එවුන්. මුන්ට දැන් හරියනව නෙවෙයි, අසාධාරණකම් කරලයි ගන්නෙ. උන්ට දැන් මුල මතක නෑ. අපි දැක්කමත් අහක බලාගෙන යනවා. ඕකුන්ට හොඳක් නම් වෙන්නෙ නෑ.'' මෙහෙම දේවල් තනියෙන් හිතනවා. එහෙම හිතන කොටත් ඒ පිරිසට හේතු තියේ නම් ඒක වදිනවා. එතකොට ඒවට ලතැවෙන්නත් මොනව හරි හේතුවක් හැදෙනවා. ලතැවෙන්නෙ නැති කෙනෙක්ගෙන් එහෙම හෝවහ පිටවෙන්නෙ නෑ.

ඊළඟට ළපැලියා කියන්නෙත් පපුව (ළය) පැලෙන තරමට ඇතිවෙන්නා වූ දාහය. අර හෝවහවලින් ඇති වන්නා වූ දාහය පපුව පැලෙන්න තරම් විශාල දාහයකින් එළියට පිට කරනවා. ''මොකුත් නැතිව පැළිලම පලයං.... වැනසිලාම පලයං.....'' මේ ආදී වශයෙන් කියන උදවිය ඉන්නවා. ඒ විදියට ළයෙන් නැගෙන්නා වූ දාහය තමයි ළපැලියාව කියන්නෙ.

ඊළඟට අඬෝවැඩියා කියල දෙයක් තියෙනවා. ඒක වචනයට සම්බන්ධයි. හැම වෙලේම අඬ අඬා සාපය නගනවා. අඬ අඬා හූල්ල හූල්ල ඉන්නවා. එතකොට හිත ඇතුලෙන් මොනව හරි තව තවත් දෝස කොටස් හැදෙනවා. මේ වගේ දෙයක් කටින් කියන කොට, හදවතින් නැගෙන්නා වූ අදහස් බලවත් වෙනවා. කටින් පිට වෙන වචන වගේම, හදවත ඊටත් වඩා බලවත් වෙලා චිත්ත කිරණක් විහිදෙනවා. ඒ චිත්ත කිරණ තමයි ළපැලියා, අඬෝවැඩියාවලටත් වැටෙන්නෙ. **අඬ අඬා කරන්නා වූ වැඩියාව හෙවත් වර්ධනය තමයි අඬෝවැඩියා කියන්නෙ. අඬන එකේ සාපය තමයි නැගෙන්නෙ. ඇයි අඬන්නෙ? මොකක් නිසාද? මෙහෙම ප්‍රශ්න කරන කොට ඒක තවත් වැඩි කරනවා.** යළි යළිත් හිතන නිසා වර්ධනය කරනවා, ආසේවනය කරනවා. ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙන කොට අඬෝවැඩියා වෙනවා. ඒකෙන් චිත්ත කිරණ නිකුත් වෙලා අර කියන සාපයන්ට හේතු වෙනවා. ඒව ඒකාබද්ධව විහිදිලා යනවා.

දැන් මේ කියන කාරණාවලින් **හෝවහ, ළපැලියා, අඬෝවැඩියා කියන ඒවා කපන්න බැරි හූනියමක්, කොඩිවිනයක් වගේ වෙනව** කියල පැරණි අය කියනවා. ඒවායේ ස්වභාවය තමයි කාටවත් කපන්න බැරි බව. ඒ කියන්නෙ හිත මුල් කරගෙන නැගෙන්නා වූ සාප කිරීම්. මේවා යම්කිසි ගෙදරක තියේ නම් කපන්න බැරි කොඩිවින වගෙයි. ඒකෙන් ඒ ගෙදරම කාලකන්නි වෙනවා. මොකද ඒක කපන්න ක්‍රමයක් නෑ. කපන්න පුළුවන් කොඩිවින කියන්නෙ, කවුරු හරි බාහිරින් කරපු කොඩිවිනයක්, හූනියමක් තවත් කෙනෙක් ලවා කපන එකක්. නමුත් මේ කියන හෝවහ, ළපැලියා, අඬෝවැඩියා ආදිය තමන්, තමන්ටම කරගන්න දෙවල්. උදාහරණයක් විදියට කෙනෙක් ඇවිද ගෙන යන කොට කළු ගලක පය පැටලිලා තුවාල වුනොත්, ඒ තුවාලය බේත් ටිකක් දාල හොඳ කරගන්න පුළුවන්. ඒ වගේම ඒ කළු ගල ඒ පුද්ගලයව හොයාගෙන පස්සෙන් එන්නෙ නෑ. හැබැයි තමන්ගෙ හතුරෙක් මෙහෙම යනකොට ඇගේ හැප්පුනොත්, එහෙම නැත්නම් තල්ලු කළොත් එහෙම, පස්සෙන් පන්නගෙන ඇවිත් ගහනවා. එතකොට ඒ කරදරය ඉවරයක් නෑ. ඒ වගේ තමයි මේ හෝවහ, ළපැලියා, අඬෝවැඩියා කපල ඉවර කරන්න බෑ. ඒක තමන්ම නවත්ත ගත්තෙ නැත්නම්, තමන්ටම මහ විනාසයක් වෙනවා, වෙන කෙනෙකුට කපන්න බැරි කොඩිවිනයක් වෙනවා. ඒවා තමන්ටත්, ගෙදරටත්, වත්ත පිටියටත් හොඳ නෑ. ඒ තරම් ශක්තියකින් විහිදිලා ක්‍රියාත්මක වෙනවා. **අනුන්ට සාප කරපු එක අනුන්ට විතරක් නෙවෙයි තමන්ටත් එනවා.** ☞

**වැඩියෙන්ම ඒක විපාක වශයෙන් විඳින්න වෙන්නෙ තමන්ට.** හේතු නැත්නම් අනුන්ට වදින්නෙ නැතිව තමන්ටම කැරකිලා එනවා.

මේකට හොඳ උදාහරණයක් දහමින් පෙන්වා දෙන්න පුළුවන්. බුදුන් වහන්සේට එදා හිටපු එක්තරා බමුණෙක් හොඳටම බැන්නා. එහෙම බැනලත් උන් වහන්සේ නිශ්ශබ්දව හිටියා. අන්තිමට උන් වහන්සේ බමුණාගෙන් අහනවා, බමුණ ඔබ යමෙක් ගෙදරට ගෙන්වල කෑම පිඟානක් දුන්නම, ඒ පුද්ගලය ඒක කෑවෙ නැත්නම් ඔබ මොකද කරන්නෙ කියල. එතකොට බමුණා කියනවා, එහෙම වුණොත් මම ඒක කනව කියල. ඒ වගේ තමයි ඔබ මට බැන්න එකක්වත් මම බාර ගන්නෙ නෑ, දැන් ඔබම බාර ගන්න කියල බුදුන් වහන්සේ බමුණාට කිව්වා.

සමහර විට තමන්ගෙ ගෙදර ඉන්න මනුස්සය ගෙදරට සලකන්නෙ නෑ. බේබද්දෙක් වෙලා නන්නත්තාර වෙලා ඔහේ ඇවිදිනවා. විවිධ වැරදි වැඩ කරනවා. එතකොට ඒ ගෙදර භාර්යාව, ගෙදර ඉඳගෙනම අර විදියට හූල්ලනවා. දුක්කමත් මූණ පුළුටු කරගෙන අහක බලාගන්නවා. කරන්න දෙයක් නැති කමට ඉන්නවා. මේ මිනිහත් එක්ක ආපු එකේ මෝඩකම කියලත් හිතනවා. එහෙම හිත හිතා අර ගෙදරම ඉඳගෙන හෝවහ, ළපැලියා, අඬෝවැඩියා නගනවා. ''මේ කරන වැඩවලට ඔය මිනිහට නම් වගතුවක් වෙන්න එපා, හෙණ හතම ගහන්න ඕන.'' මෙහෙම හිතනවා, කියනවා. දැන් මේ විදියට හිතන්නෙ කියන්නෙ හොඳකට නෙවෙයි. පැලියාවෙන් පැලිලම පලයං කියන අදහසින්. එතකොට හදවතින් නැගෙන්නා වූ විස තමයි හෝවහ, ළපැලියා, අඬෝවැඩියා ආදී වශයෙන් පිට වෙන්නෙ. කරන කරන වැඩ පැලිල විනාස වෙයන් කියල, ඒ මිනිහ ඇසුරු කරන වෙනත් කාන්තාවක් ඉන්නව නම් ඒ ගෑණිටත් හොඳ පදයක් දෙකක් කියල, හෙණ හතම ගහන්න ඕන පවුල් කඩා කප්පල් කරනවට කියල මේ විදිහට සාප කරනවා.

දැන් මේ වගේ වචනයක් පිට වුණොත් එහෙම ඒකෙ සාපය අවුරුදු ගණනාවක් ගියත් ඉවර වෙන්නෙ නෑ, මැරෙන කල්ම පස්සෙන් එනවා. මේ විදියට පුරුෂයාගේ සිද්ධියක් දැකල භාර්යාවත්, භාර්යාවගේ සිද්ධියක් දැකල පුරුෂයත් හෝවහ, ළපැලියා, අඬෝවැඩියා නගන්න පුළුවන්. ඒක දෙපැත්තටම තියෙනවා. ඊට පස්සෙ ඒ ගෙදරම **කාලකණ්ණි වෙනවා. එකිනෙකාට එකිනෙකා පේන්න බැරිව යනවා. පවුල් ජීවිතය එපා වෙනවා. වත්තෙ පිටියෙ තියෙන ගස්කොළන් පවා නිසරු වෙනවා, වැනසිලා යනවා.** මේ කියන කපන්න බැරි කොඩිවින නිසා තමයි එහෙම සිද්ධ වෙන්නෙ. **ඒකට පිරිත් කියල, සෙත් ශාන්ති කළාට වැඩක් වෙන්නෙ නෑ. තමන්ම යථාර්ථය දැනගෙන, ඒ යථාර්ථය සිහි කරල, කවද හරි මේ ලෝක ස්වභාවය තේරුම් අරගෙන අවබෝධ වෙච්ච දාට තමයි ඕව නතර වෙන්නෙ.** එතකල් කාටවත් නතර කරන්න බෑ. මොකද අවිද්‍යාවෙන් වැහිල තියෙන නිසා, අවිද්‍යාවෙ ඉන්න තාක් ඒ ස්වභාවය එහෙම්මම තියෙනවා. කවද හරි අවිද්‍යාව නිරෝධ කිරීම ආරම්භ කරල දහම් අවබෝධය ලැබුව නම්, එදාට ලෝකයේ යථා ස්වභාවය වැටහෙන කොට, එතැන් පටන් මේව කැපෙන්න පටන් ගන්නවා. එතකොට අර වගේ සිද්ධි හිතේ හිටින්නෙ නෑ, ඒව ආසේවනය වෙන්නෙ නෑ. මග ඵල ලාභියෙක්ගෙන් කවදාවත් ඔහොම සාප කිරීම්, අසාධාරණකම් වෙන්නෙ නෑ. තව කෙනෙක් තමන්ට වරදක් කළත් ඔය විදිහෙ සාප කිරීම් කරන්නෙ නෑ. එහෙම ස්වභාවයක් ධර්මාවබෝධයෙන් පස්සෙ ලැබෙනවා.

මේ නිසා **මේකට තියෙන එකම ප්‍රතිකර්මය තමයි දහම් අවබෝධය.** අනිච්ච, දුක්ඛ, අනත්ත වැටහිච්ච කෙනෙක් ඉන්නව නම්, ඔය වගේ අවස්ථාවකදී මේ විදියට තමයි අදහස් එන්නෙ. ''අසාර ලෝකෙ මොනවද ගන්න තියෙන්නෙ? මොනව කරන්නද? මේ වගේ අපරාධ කරන අය ඉන්න එක ලෝකෙ හැටිනෙ. ලෝකෙ ඒ අයගෙන් අහක් කරන්න බෑ. අවිද්‍යා ප්‍රත්‍යයෙන් හට ගත්තු ලෝකෙ පහළ වෙලා ඉන්න මිනිස්සු විවිධාකාර තත්ත්වයන්ට පත් වෙනවා. ඒ වගේම අපාගත වෙන වැඩ කරනවා. ඒ නිසානෙ මෙච්චර විශාල ප්‍රමාණයක් මේ වගේ වැඩ කරල අපාගත වෙලා ඉන්නෙ. ඉතින් ඕව වළක්වන්නෙ කොහොමද ? අපිට ඕව වළක්වන්න පුළුවන් දේවල් නෙවෙයිනෙ. අපිට කරන්න තියෙන්නෙ ඉතින් මේ සසරෙ හැටි දැනගෙන, මේකෙන් ඉවත් වෙලා මේ මනුස්ස ලෝකෙන් ඈත් වෙලා යන එක තමයි.'' මේ වගේ අදහස් තමයි දහම් අවබෝධය ලැබිච්ච කෙනෙකුට එන්නෙ. ඒ කියන්නෙ මඟ ඵල ලාභීන්ට, ආර්යන්ට එහෙම අදහස් ආවම, අර වගේ සාප කරන්නෙ නෑ. ඒව කරපු අයට හෙණ ගහපන් කියල කියන්නෙ නෑ. ''මොනව කරන්නද? අනේ මේක අපරාධයක් කියල මුන්ට තේරෙන්නෙ නෑනෙ! එහෙම තේරෙනව නම් මේ අපාගත වෙන, විනාස වෙන වැඩ කවදාවත් කරන්නෙ නෑ. දැන් ඉතින් අපිට කරන්න දෙයක් නෑ. මේ අසත්පුරුෂයො ඉන්න ලෝකෙ අපි කොහොමද ඕව නවත්වන්නෙ. සත් පුරුෂයන්ට හිතෙන දේවල් කරන්න අසත් පුරුෂයො ඒ අයගෙ ක්‍රියාකලාපයන් නවත්වයිද? උන්ගෙ ලෝකෙ හැටිනෙ. අපිත් මේ ඒක ඇතුලෙනෙ රිංගගෙන ඉන්නෙ. නොදැනුවත්කමටනෙ මේ ඉන්නෙ.'' මෙන්න මෙහෙම හිතනව මිසක්, තමන්ට කරපු දුක් කරදරවලට අනුන්ට සාප කර කර ඒකෙ එල්ලිලා ඉන්නෙ නෑ.

ඉතින් මේ වගේ ලෝක ස්වභාවය දැනගත්තට පස්සෙ, අර වගේ අදහස් සිතිවිලි පිට වෙනව මිසක්, හෙණ ගහල පලයං ආදී වශයෙන් සාප අදහස් පිටවෙන්නෙ නෑ. ඒක විශේෂයක්. සෝවාන්, සකෘදගාමී කෙනෙක්ගෙන් වුණත් අපාගත වෙන මට්ටමේ පාපයක් කෙරෙන්නෙ නැති නිසා, අර වගේ සාප කිරීම් එන්නෙ නෑ. නමුත් අවිද්‍යාව සම්පූර්ණයෙන්ම ප්‍රහීන කරල නැති නිසා එක්තරා මට්ටමක ඉතාමත් කුඩා මාත්‍රයක් පිට වෙන්න පුළුවන්. ඒකත් අර වගේ බලවත් නෑ. මොකද ඒව හද පත්ලෙන් එන සාපයන් නෙවෙයි. සමහර අයගෙන් එහෙමවත් වෙන්නෙ නෑ. මොකද අනාගාමී කෙනෙකුට ද්වේශ හිත් නෑ. නමුත් එක්තරා මට්ටමක ලෝභ, අවිද්‍යා හිත් තියෙනවා. ඒවායෙන් ගන්න අදහස් ඒ තරම් බලවත් නෑ. ද්වේශ හිතකින් ගත්තොත් තමයි ගිනි ගත්ත වගේ බලවත් වෙන්නෙ. රහතන් වහන්සේලාට කොහොමටවත් මේ වගේ හිත් නෑ. උන් වහන්සේලාට තියෙන්නෙ චිත්ත ශාන්තිය. **හදවතින් නැගෙන ශාන්තිය තමයි හෝ ශාන්තිය කියන්නෙ. ඒක තමයි හසන්ත, හසන්ති කියල නම්වලින් අද හදාගෙන තියෙන්නෙ.** ඒ නම්වල තියෙන නිරුක්තිය තමයි මේ. ඒකට වෙන නිරුක්තියක් නෑ. හදවතින් නගන හෝ ගාන ශබ්දය තමයි හෝස් ගාල පිට වෙන්නෙ. එතකොට ඒක දාහයකින් පිට කළොත් වහ වෙනවා. ඒක තමයි හෝවහ. නමුත් ඒ හෝ ශබ්දය ශාන්ත හිතකින් කළාම, සුසුමක් ඇරල තනියෙන්ම මෙහෙම හිතනවා. ''අනේ මේ මිනිස්සුන්ට කවද ඉන්න හිටින්න තැනක් ලැබෙයිද? මේ අය කවදද මේ දුකෙන් ගොඩ එන්නෙ! මේ අයට කවද හරි යහපතක්ම වෙන්න ඕන.'' මේ විදියට කෙනෙක්ගෙ කරදරයක් දුකක් දැකල හදවත උණු වෙලා යනවා. ඒ අදහස සෙතට හිටියොත් තමයි අර වගේ හෝසාන්ත වෙන්නෙ. මේ නිසා හෝවහ සහ හෝසාන්ත කියන්නෙ ක්‍රම 2 ක්. **මේ විදියට ලෝකයේ ස්වභාවය අවබෝධ කරගෙන හැම වෙලේම ශාන්තියක් නගන්න පුරුදු වුණානම්, හෝවහ, ළපැලියා, අඬෝවැඩියා නිකම්ම දුරු වෙනවා. ඒකෙන් තමන්ටත්, ලෝකයටත් යහපතක් වෙනවා. ඒකට තියෙන එකම ක්‍රමය තමයි මේ දහම් අවබෝධය ලබා ගන්න උත්සාහ කිරීම.**

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්...

**12 වන කොටස**



අපට නොපෙනෙන ලෝකයන්ගෙන් තවත් වැදගත් කොටසක් වන බ්‍රහ්ම ලෝක ගැන තමයි මේ විග්‍රහ කරන්නෙ. මේ එක් සක්වලක පිහිටන ලෝක තල 31 අතරට වැටෙන සුගති ලෝකවලින් සාපේක්ෂව දුක අඩුම, ලෞකික සැප සම්පත් වැඩිම ලෝකය තමයි බ්‍රහ්ම ලෝකය කියන්නෙ. ඒ සැප දුක ගත්තමත් එකිනෙකට විවිධ වෙනස්කම් තියෙනවා. මොකද බ්‍රහ්ම ලෝකත් 20 ක් තියෙනවා. ඒ 20 ට රූප ලෝක 16 කුත්, අරූප ලෝක 4 කුත් අයිති වෙනවා. කොහොම හරි මේ බ්‍රහ්ම ලෝක 20 ගත්තමත් ඒවායේ වාසය කරන බ්‍රහ්මයින්ගේ ආයු කාලය, සැප සම්පත්, කායික ස්වභාවය, විඳින දුක් ආදී කාරණා සාපේක්ෂව විවිධත්වයක් ගන්නවා.

**සිත මිස කය නැති බඹ ලොව සතරෙකි**
**සිත නැතිවම කය ඇති බඹ තලයෙකි**
**මෙද සත පින් කොට උපදින පෙදෙසකි**
**එහි උපනත් කුසලක් නොම කළ හැකි**

වීදාගම මෛත්‍රී මහ නා හිමියන් ලෝ වැඩ සඟරාවේ මේ විදියට කවියකින් සටහන් කරල තියෙන්නෙත් මේ බ්‍රහ්ම ලෝකයේ ස්වභාවය ගැන. සිත මිසක් කය නැති බඹ ලොව කියන්නෙ අරූප ලෝකය. ඒ වගේ අරූප ලෝක 4 ක් තියෙනවා. අනිත් බ්‍රහ්ම ලෝක 16 රූප ලෝකවලට අයිතියි. එයින් සිත නැතිව කය ඇති බඹ තලය කියන්නෙ අසඤ්ඤ සත්ත බ්‍රහ්ම ලෝකය. මනුස්සයෙක් වෙලා ඉඳෙද්දි කරපු බණ භාවනා ආදී පින්කම්වලින් මේ ලෝකවල උපන්නත්, **ඒ සමහර ලෝකවල පිනක් දහමක් කරගන්න අවස්ථාවක් ලැබෙන්නෙත් නෑ.**

දැන් මේ බ්‍රහ්ම ලෝකවල බ්‍රහ්මයින්ගේ කායිකත්වය සකස් වෙලා තියෙන්නෙ, අති සියුම් කිරණමය ස්වරූපයකින්. ඒ කයේ සියුම් භාවය දෙව් ලොව දෙවියන්ටත් වඩා අති සියුම්. ඒ අති සියුම් කය තමන්ට අවශ්‍ය විදියට පුණ්‍ය ඍද්ධියෙන් සනීභවනය කරගන්නත් පුළුවන්. ඒ වගේම මේ බ්‍රහ්මයින්ගෙ ආහාරය තමයි ප්‍රීතිය. ඒක චිත්ත ශක්තියෙන් කර්මජව මැවෙනවා. දෙව්ලොව වගේ අමෘතය නෑ. ප්‍රීතිය මානසිකව ආහාර කරගෙන ඒකෙන් තමයි ජීවත් වෙන්නෙ. මෙතනදී රූප ලෝකවල, ප්‍රීතිය නිසා හට ගන්නා චිත්ත රූප තමයි ආහාරය වෙන්නෙ. ඒ කියන්නෙ රූප ජීවිතේන්ද්‍රිය. හැබැයි අරූප ලෝකවලදී

## බඹ ලොව බඹුන් විඳින දුක

පටිසන්ධියත් එක්ක නැගිල ආපු ශක්තියෙන් එන මනෝමය ප්‍රීතිය විතරයි ආහාර විදියට තියෙන්නෙ, චිත්ත රූප නෑ. ඒ කියන්නෙ නාම ජීවිතේන්ද්‍රිය විතරයි. දිව්‍ය ලෝකයේ වගේ බ්‍රහ්ම ලෝකයේ කාම දාහයක් ඇත්තෙම නෑ. ඒ නිසා කාම ආහාර එහේ නෑ. ප්‍රීතිය ආහාර කරගෙන ඒකෙන් ගත්තු මූලික ශක්තිය හෙවත් පටිසන්ධියේදී ලබාගත් ශක්තිය ගෙවෙන කල්ම ජීවත් වෙනවා. ඒ කියන්නෙ කර්මක්ෂය මරණයක් වෙනකල්ම ජීවත් වෙනවා. දිව්‍ය ලෝකයේ වගේ ආහාර ගන්න අමතකවීමෙන් හෝ ද්වේශය නැගීමෙන් හෝ මේ වගේ බාහිර හේතුවක් මත සිද්ධවෙන උභයක්ෂය මරණ බඹ ලොවේ නෑ. කර්මය ක්ෂය වෙන කල්ම ඉන්න වෙනවා. ඉතින් සෑහෙන කාලයක් ආයුෂ තියෙන්නෙ අර උප්පත්ති කර්ම ශක්තියෙන්.

දැන් මේ කියන බඹ ලෝකයේ, කාම ලෝකවලට සාපේක්ෂව දුක අඩුයි කියල කිව්ව මිසක් දුක නැති තැනක් නෑ. ඒ දුකත් අපි හිතන් ඉන්නවට වඩා වෙනස්. මොකද දැන් අපට බ්‍රහ්ම ලෝකවල දුකක් ගැන අහන්න ලැබෙන්නෙ නෑ. අර දෙව් ලොව වගේ සැප සම්පත්තිය ගැන විතරයි නිතරම අහන්න ලැබෙන්නෙ. ඒ තරම් මහ විසාල සම්පත්තියක් කියල තමයි හිතාගෙන ඉන්නෙ. මොකද දුක ගැන කියවෙන කොටස සැඟවිලා, වැහිල තියෙන්නෙ. මේ නිසා මේ ලිපියෙන් විශේෂයෙන් ඉස්මතු කරල පෙන්වන්න උත්සාහ කරන්නෙ, මේ බ්‍රහ්ම ලෝකවල පොදුවේ තියෙන දුක් කරදර ස්වභාවය ගැන.

දැන් මේ බ්‍රහ්මයින් අතර බුදු බණ අහල ලෝකයේ යථා ස්වභාවය අවබෝධ කරගත්තු බ්‍රහ්මයින් ඉන්නවා. ඒ වගේම එහේ තියෙන සම්පත්තියෙන් මත් වෙලා, මාන්නය නිසා බුදු බණ අහන්න අකමැති කොටසකුත් ඉන්නවා. ගෞතම බුදුන් වහන්සේ පහළ වුණාමත් බක කියන ☞

බ්‍රහ්මයා බුදු බණ අහන්න කැමැත්තක් තිබුණෙ නෑ. මොකද ලෝකය සාස්වතයි, සදාකාලිකයි.... ආදී වශයෙන් තමන් සර්ව බලධාරී වශයෙන් තමයි ඒ අය හිතාගෙන හිටියෙ. මේ නිසා බුදුන් වහන්සේ ඒ මතයට විරුද්ධව ඉදිරිපත් කරපු යථාර්ථය පිළිගන්න කැමති වුණේ නෑ. උන් වහන්සේ දේශනා කරපු ඒ යථා ස්වභාවයට තියෙන අකමැත්ත නිසා, ඒ කාරණා ටික තමන්ගෙ අනෙක් පිරිසට කියන්න එපා කියල සඟවපු හැටිත් ධර්මයේ සඳහන් වෙනවා. මොකද ඒ තියෙන සැඟවිච්ච දාහය, යථාර්ථය ඒ අයට දැන ගන්න ලැබුනොත් ඒක තමන්ගෙ තත්ත්වයට ලොකු මදි පුංචිකමක්, පාඩුවක්, ලැජ්ජාවක් වෙන නිසා. ඒ කාරණා මුල් කරගෙන තමයි තමන්ගෙ පිරිසට කියන්න එපා කියල කිව්වෙ.

එතකොට බුදුන් වහන්සේ ඇතුළු රහතන් වහන්සේලා මේ බ්‍රහ්මයින්ගෙ තියෙන ඒ මතය, දෘෂ්ටිය දුරු කරන්න බ්‍රහ්ම ලෝකයට වැඩල බණ දේශනා කරපු හැටිත් ධර්මයේ සඳහන් වෙනවා. මේ අවස්ථාවේදී ධර්මයට කැමති සේවක බ්‍රහ්මයෙක් බුදුන් වහන්සේගෙන් බණ අහල යද්දි අතර මගදී මුණ ගැහුණු අර බක බ්‍රහ්මයා කොහේද ගියේ කියල ඇහුවම, භවත් ගෞතමයන් වහන්සේ බලන්න ගියයි කියල කිව්වා. එතකොට මේ බක බ්‍රහ්මය අහනවා, ඇයි මෙච්චරකල් මට සේවය කළේ නැත්තෙ, මගේ බල පරාක්‍රමය දන්නෙ නැතුවද භවත් ගෞතම ළඟට ගියේ කියල දැන් මේ බ්‍රහ්ම ලෝකයේ තියෙන මානසිකත්වය මේකෙන් බලාගන්න පුළුවන්. ඒ කියන්නෙ බුදු බණ අහනවට කැමති නෑ. දැන් මේ විදියට කියල, මෙන්න එහෙනම් මගේ ශක්තිය බලාගන්න කියල මනෝමය ඍද්ධියෙන් මේ බක බ්‍රහ්මය තමන්ගෙ ශරීර දාහක් මවල පෙන්නුවා. දැන් අර සේවක බ්‍රහ්මයා බුදුන් වහන්සේගෙන් බණ අහල මඟඵල ලබල, විශේෂ අවස්ථාවකට පත් වෙලා තමයි හිටියෙ. ඒ බව කිව්වෙ නැතිවට මේ සේවක බ්‍රහ්මයගෙ අධ්‍යාත්මික ශක්තිය දැන් පෙරට වඩා වැඩියි. ඒ නිසා ඔහු, මගේ බලය මම පෙන්වන්නම් කියල 2000 ක් මවල පෙන්නුවා. එතකොට අර බක බ්‍රහ්මයට ලැජ්ජ හිතුණා. දැන් එතකොට **තමන්ගෙ තත්ත්වය බලාගන්න කියන මාන්නයෙන් මේ බ්‍රහ්මයොත් දුක් විඳිනවා. ඒකෙ දාහයක් තියෙනවා. මේ තමයි බඹ ලොව තියෙන ප්‍රධානම දුක.**

ඊළඟට මේ බ්‍රහ්ම ලෝකවල කාම කයක් නැති නිසා කාම දාහයක් නෑ. අනිත් ලෝකවල වගේ කායික දුකක් නැති වුණාට, තියෙන පොඩි සියුම් කය නිසා විඳින දුකක් තියෙනවා. ඒ නිසා තමයි ඒ අයත් ආසනවල ඉන්නෙ. සමහර වෙලාවට, අර බලන්න මගෙ මාලිගාව කොච්චර ලොකුද කියල අනෙක් බ්‍රහ්මයින්ට තමන්ගෙ සම්පත්තිය පෙන්වනවා. සමහර අය ඒ ලෝකෙ මැව්ච්ච රත්තරං, රිදී පළඳිනවා. ඒවා මාළිගාවලත් තියෙනවා. ඒ වගේම ඒ අයට ඔටුණු පවා තියෙනවා. ඉතින් එහෙම **ඉන්න හිටින්න තැන් තියෙන්නෙ කයට දාහයක් තියෙන නිසා.** මොකද ස්පර්ශ වෙන නිසා වේදනාවක් එනවා. ඒ වගේම පරිවාර බ්‍රහ්ම පිරිස තමයි බ්‍රහ්ම පාරිසජ්ජ ලෝකයේ ඉන්නෙ. ඒ අය තමයි ඉහළ බ්‍රහ්ම පිරිස්වලට ආවතේව කරන්නෙ. එතකොට එහෙම ආවතේව කරන්නෙ කයට දාහයක් තියෙන නිසා. මහ පිරිසට ආවතේව කරල දෙනව කියන්නෙ, ඒ අයට මොනව හරි තනියෙන් කරගන්න බැරි දෙයක් කරල දෙනවයි කියන එක. ඒ කියන්නෙ කායික දුක.

ඒ වගේම තවත් කෙනෙක්ගෙ සම්පත්තියක් දැකල දාහයක් ඇති වීමත් මේ බඹ ලොව තියෙන තවත් දුකක්. හරියට මේ මනුස්ස ලෝකය වගෙයි. උදාහරණ විදියට යම්කිසි විශාල වත්තක ප්‍රධානියාට තියෙන්නෙ විශාල බංගලාවක්. ඒක ඔක්කොටම වුණත් ඉන්න පුළුවන් හොඳ පහසුකම් තියෙන තැනක්. ඊට මෙහා පල්ලෙහා ඉන්න අයට තියෙන්නෙ සාමාන්‍ය බංගලාවල්. ඊට පහළින් ඉන්න සාමාන්‍ය අයට තියෙන්නෙ ඊළඟ මට්ටමේ ගෙවල්. මේ විදියට ගිහින් කම්කරුවන්ට ගෙවල් දෙන්නෙ නෑ. දුන්නත් ලයින් කාමරයක් තමයි. අර වගේ පහසුකම් නෑ. මෙන්න මේ වගේ තමයි බ්‍රහ්ම ලෝකත්. ඒ අය ලබපු පුණ්‍ය ඍද්ධිවල හැටියට තමයි සම්පත් පහළ වෙන්නෙ.

ඒ වගේම රූපාවචර බ්‍රහ්ම ලෝකවල රූප සම්පත්තියකුත් තියෙනවා. ඒකෙත් විවිධ වෙනස්කම් තියෙනවා. මම ලස්සනයි, හැඩයි, අනෙක් අය කැතයි.... ආදී වශයෙන් රූපය ගැනත් මාන්නයක් තියෙනවා. මොකද රූප රාගය තියෙනවා. ඒ වගේම හංස රූප, සිංහ රූප වගේ කලාත්මක ලියවැල් ඒ අයගෙ මාලිගාවල තියෙනවා. සමහර අයගෙ මාලිගාවල රන් රිදී අල්ලල තියෙනවා. ඒ කියන්නෙ පුණ්‍ය ඍද්ධියට පහළ වෙච්ච දේවල්. පහළ ඉන්න අයට ඒ වගේ සම්පත්තියක් නෑ. ඉහළින් ඉන්න අයගෙ තේජස් පවා වැඩියි. ඒ අයගෙ මාලිගාවල මේ මනුස්ස ලෝකෙ වගේ වටකරපු තාප්ප වගේ හැඩයෙන් යුත් පවුරු තියෙනවා. ඒ කියන්නෙ ඒ අයට ගැලපෙන විදියට මැව්ච්ච දේවල්. ඉතින් මේ ආදී **සම්පත්තියේ වෙනස්කම් නිසා අඩුවෙන් ලැබිච්ච අය ලතැවෙනවා.**

ඒ වගේම බ්‍රහ්මයින්ගෙ විමන්වල තමයි මේ මාලිග ආදියත් පහළ වෙන්නෙ. ඒ ඒ අයට වෙන වෙනම වෙන් වෙච්ච විමන් පිහිටල තියෙනවා. ඒවා වෙනම කලාප වශයෙන් පිහිටල තියෙන්නෙ. ඒ විමානයක ඉන්න එක් බ්‍රහ්මයෙක් චුත වුණාම, ඒ විමානයත් ඒත් සමගම අතුරුදන් වෙනවා. නැවතත් තවත් බ්‍රහ්මයෙකුට ඇවිල්ල ඉන්න ඒක ඉතිරි වෙන්නෙ නෑ. එහෙම අතුරුදන් වුණා කියල අනෙක් අයට ප්‍රශ්නයක් වෙන්නෙත් නෑ. ඒ කියන්නෙ බ්‍රහ්මයින්ගෙ කර්ම ශක්තියෙන්මයි ඒ විමානත් මැවෙන්නෙ.

ඒ වගේම එහේ තියෙන වස්තු සම්පත් මෙහේ වගේ තවත් එකකට හුවමාරු කරගන්න බෑ. මේක මගේ සම්පත්තිය කියල, තව කෙනෙක්ගෙ දෙයක් හොරකම් කරන්න බෑ. තමන්ට ලැබිච්ච හැටියට භුක්ති විඳින්න ඕන. ඒ වගේම එක් එක් බ්‍රහ්මයින්ට තියෙන ආලෝකයත් වෙනස්. උදාහරණ විදියට ආභස්සර ලෝකයේ ප්‍රභාෂ්වරව විහිදෙන ආලෝකය වැඩියි. පරිත්තාභයේ තියෙන්නෙ ඊට වඩා පොඩි එළියක්. හැබැයි ඒ ලෝකෙට ඒක පොඩි වුණාට මනුස්ස ලෝකෙත් එක්ක බලද්දි මහ විසාල එළියක්. ඒක පෙන්වල තියෙන්නෙ අන්තිම පහත් දේවතා එළියක් උපමාවට අරගෙන. ඒ එළිය බැලුවම මනුස්සයෙක්ගෙ ඇස් පුපුරනවයි කියල කියනවා. බලන්නත් බැරි තරමට එච්චර දීප්තියක්ලු. ඉතින් ඒක ඒ අයට පොඩි වුනාට අපිට පොඩි නෑ.

එක්තරා භික්ෂූන් වහන්සේ නමක් ඈත ප්‍රදේශයක සති පට්ඨානය සජ්ඣායනා කරමින් ඉන්න කොට, තවත් යෝගී භික්ෂූන් වහන්සේ නමක් ඒක අහන්න ගිහින් තියෙනවා. එහෙම ගිහින් අහගෙන ඉන්න කොට ඒ භික්ෂූන් වහන්සේට, එළියෙ ඉඳගෙන තවත් කවුරුහරි ඒක අහගෙන ඉන්නව කියල සද්දයක් ඇහුණලු. ඉතින් උන් වහන්සේ ඇහුවලු, කවුද එළියෙ ඉන්නෙ කියල. ස්වාමීනි, මම දේවතාවියක් කිව්වලු. මොකද මෙතන කරන්නෙ කියල ඇහුවම, තමන් හිටපු දුර ප්‍රදේශයක විස්තරයක් කියල, ගොඩක් තේජස් තියෙන දේවතාවො එහේ ඇවිත් ඒක අහන නිසා මට එහේ ඉන්නත් බැරි වුණා, ඉතින් මම මේ පුළුවන් තරම් එතනින් ඈත් වෙලා මේක අහනව කියල ඒ දේවතාවිය කිව්වලු. ඒ ශක්තිය පෙන්වන්න බැරිද කියල ඇහුවම, කොහොමද පෙන්වන්නෙ ඔබ වහන්සේට දරාගන්න බෑ කියල කිව්වලු. ඊට පස්සෙ භික්ෂූන් වහන්සේ ඇහුවලු, ඒක උපමාවකින් පෙන්වන්න බැරිද කියල. එහෙනම් මම මේ යතුරු හිලෙන් සුළැඟිලි තුඩක් දානවා, ඒ සුළැඟිලි තුඩින් එන එළිය ඔබ වහන්සේ බලාගන්න කිව්වලු. බලන කොට හිරු 1000 ක් වගේ විශාල එළියක් ඇතුළට වැටුනලු. හැබැයි මේ ☞

කියන්නෙ එළිය ගැන මිසක් උෂ්ණත්වයක් ගැන නෙවෙයි. ඉතින් ඇඟිලි තුඩින් ආපු ආලෝකයත් මෙහෙම නම්, ශරීරය කොහොම දකින්නද?

මේ නිසා මේ දේවතාවො මනුස්ස ලෝකයට ඇවිත් ඉන්න කොට ආලෝකයෙන් නෙවෙයි ඉන්නෙ. ඒක අතුරුදන් කරල වෙනත් වේසයකින් තමයි මෙහාට එන්නෙ. මොකද මෙහේ ආවම දරාගන්න බෑ. ඒ කියන්නෙ දෙවියන්ට ඒක ඔරොත්තු දෙන්නෙත් නෑ. ඒ වගේම මනුස්සයින්ට ඔරොත්තු දෙන්නෙත් නෑ. දැන් මේ කියන්නෙ දෙවි දේවතාවන්ට ස්වභාවිකව තියෙන ආලෝකය ගැන. හැබැයි අර පසුගිය කලාපයෙන් විස්තර කරපු දේවතා එළි කියල කිව්වෙ මේ ස්වභාවික ශරීර ආලෝකය නෙවෙයි. ඒ දේවතා එළි කියන්නෙ ඒ අය ගමන් කරන වාහනයෙන් නිකුත් වන එළිය. එතකොට ඒ වාහනයෙන් ගමන් කරන කොටත් අර කියපු ස්වභාවික ශරීර එළිය අතුරුදන් කරල තමයි මනුස්ස ලෝකෙ හරහා යන්නෙ.

දැන් තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන්, එතකොට දෙවියන්ට එච්චර ආලෝකයක් තියේ නම්, පසු ගිය කලාපයෙන් විස්තර කරපු ආකාරයට චන්ද්‍ර සූර්ය දේවතාවන්ට තමන්ගෙ කටයුතු කරගෙන යන්න බාහිර සූර්යාලෝකයක් අවශ්‍ය වෙන්නෙ ඇයි කියල. මෙතනදී උපතින්ම හිමි වෙන ශරීර ආලෝකය කියන්නෙ එකක්. ජීවත් වෙන කොට බාහිර පරිසරයත් එක්ක ප්‍රත්‍ය වෙන්න අවශ්‍ය වෙන ආලෝකය තව එකක්. එතකොට ඒ අයගෙ ශරීර ආලෝකය ක්‍රියාත්මක වෙන්නත් බාහිර ආලෝකයෙන් ප්‍රත්‍ය වෙන්න ඕන. ඉහළ දිව්‍ය බ්‍රහ්මයින්ට ඒක අවශ්‍ය නැති වුනාට චන්ද්‍ර සූර්ය දේවතාවන්ට අවශ්‍ය වෙනවා.

අනෙක් කාරණය තමයි ස්වයංප්‍රභා ආලෝකයෙන් ඉන්න පුළුවන් හැකියාව තියෙන්නෙ තාවතිංස දිව්‍ය ලෝකෙන් ඉහළ ඉන්න අයට විතරයි. පුණ්‍ය ඍද්ධියෙන් ලැබෙන ආලෝකය තමයි එයින් පහළ ඉන්න අයට තියෙන්නෙ. ඒක දුර්වලයි. මේ නිසා බාහිරින් ආලෝකය අවශ්‍යයි. දෙදෙව් ලොවට (චාතුර් මහා රාජිකය සහ තාවතිංසය) තමයි මේ චන්ද්‍ර සූර්ය ආලෝකය අවශ්‍ය වෙන්නෙ. එතකොට චන්ද්‍ර සූර්ය ආලෝකය උරාගෙන තමයි ඒ අයගෙ කටයුතු ක්‍රියාත්මක කරන්නෙ. හරියට කණාමැදිරියා හැම තිස්සෙම බාහිරින් ආලෝකය අවශෝෂණය කරල ජීවත් වෙනව වගේ. ඌ අවශ්‍ය තැනට විතරක් ආලෝකය විහිදල ඒක රැක ගන්නවා. ඒ නිසා ටික වෙලාවක් එළිය කරල හිටි ගමන් නිවෙනවා. එක දිගටම එළිය කරගෙන ඉන්නෙ නෑ. මොකද ඊළඟ දවසටත් ආලෝකය රැක ගන්න ඕන.

දැන් එතකොට අර කලින් සඳහන් කළා වගේ පහත් දෙවියක්ගෙ එළියත් එහෙම වුණා නම්, බ්‍රහ්ම ලෝකවල බ්‍රහ්මයින්ගෙ එළිය කොහොම ඇත්ද? ඇඟිලි පුරුකකින් දස දහසක් සක්වලම එළිය කරන්න පුළුවන් බ්‍රහ්මයින් ඉන්න බවත් ධර්මයේ සඳහන් වෙනවා. මේ බව ඔප්පු වෙන තැනකුත් ධර්මයේ සඳහන් වෙනවා. මහා බ්‍රහ්මයා සක්‍ර දෙවියන්ගෙ සුදම් සභාවට එන කොට ඒ සභාවෙ ඉන්න දෙවියන්ට පේන්නෙ සූර්යාලෝකයට පෙර එන අරුණෝදය වගෙයිලු. ඒ එන එළිය තුළින් තමයි දැනගන්නෙ තමන්ගෙ පියා ආව කියල. පියා කියල ඒ අය හඳුන්වන්නෙ මහා බ්‍රහ්මයා. හැබැයි එහෙම ආවට ඒ දෙවිවරුන්ට මහා බ්‍රහ්මයා හඳුනගන්න බෑ. මොකද ඒ මහා බ්‍රහ්මයගෙ කායික ස්වරූපයෙන්ම ආවොත් ඒක දෙවියන්ට දරාගන්න බෑ. පේන්නෙත් නෑ. ඒ නිසා බ්‍රහ්ම ශරීරය අතුරුදන් කරල ගැලපෙන දිව්‍ය ශරීරයකින් තමයි මහා බ්‍රහ්මයා දිව්‍ය ලෝකෙට එන්නෙත්. ඊළඟට මහා බ්‍රහ්මයා එන කොට ඒ සුදම් සභාවේ හිටපු 1000 ක් දෙවිවරු ''පියා එන්නෙ මගේ ආසනයට'' ආදී වශයෙන් කියල හැමෝම ඉල්ලීම් කරන්න ගත්තා. මොකද ඒ විදියට තමන්ගෙ ආසනයට ආවම පියාගෙ උකුලෙ ඉන්න දරුවෙකුට වගේ සුවයක් දෙවියන්ටත් දැනෙන බව ධර්මයේ සඳහන් වෙනවා. දැන් අර හැම දෙවි කෙනෙක්ගෙම හිත සන්තෝස කරන්න ඕන නිසා මහා බ්‍රහ්මයා 1000 ක් වෙස් මවාගෙන ඒ හැම කෙනාගෙම ආසනයෙ ඉඳ ගත්තලු. නියම මහා බ්‍රහ්මයා සක්‍ර දෙවියන්ගෙ ආසනයෙ ඉඳ ගත්තලු.

දැන් මෙතනින් පැහැදිලි වෙන කාරණයක් තමයි, මේ ඉහළ ලෝකවල තියෙන සම්පත්තියේ අඩු වැඩිකම් නිසා ඒ බ්‍රහ්මයොත් දාහයකින් ඉන්න බව. ඒක දරාගන්න බැරිව ඒ අයත් දුක් වෙනවා. **කොච්චර සම්පත්තියක් තිබුණත් ඒකෙන් සෑහීමකට පත් වෙන්නෙ නෑ. තවත් කෙනෙක්ගෙ දෙයක් දැකල දාහයක් හට ගන්නවා.**

ඊළඟට මේ බ්‍රහ්ම ලෝකවලින් අසඤ්ඤ තලය කියල ලෝකයක් තියෙනවා. අසඤ්ඤ සංඛාරය වඩපු අය තමයි එහේ ගිහින් උපදින්නෙ. ඒ කියන්නෙ ඒ අය හිතන්නෙ, කියන්නෙ, කරන්නෙ මේ මොකවත් නෑ. ඒ ඔක්කොම මට නෙවෙයි, මම නෙවෙයි, මගේ නෙවෙයි කිය කියා සංඥාවන් අයින් කරනවා. උදාහරණයක් විදියට මදුරුවෙක් දෂ්ට කළත් ඒකට මම නෙවෙයි, මට නෙවෙයි, මගේ නෙවෙයි කියල කියනවා. මේ විදියට එකක්වත් සංඥා වශයෙන් ගන්නෙ නැතිව භාවනා කරනවා. අන්තිමට කෑවද බිව්වද දන්නෙත් නෑ. දැන් මෙහෙම ඔක්කොම ඉවත් කර ගෙන ගියාම, ශරීරයට සංඥා නොදැනෙන අවස්ථාවක් එනවා. ඉතින් ඕක උපාදාන කරගෙන ඉඳල මැරිල ගිහින් අසඤ්ඤ තලයේ උපදිනවා. එහේ ගිහිල්ලත් මෙලෝ දෙයක් නිච්චි නෑ. කොහෙන් ආවද, කොහේද ඉන්නෙ, මොනවද කරන්නෙ... මේ ආදී වශයෙන් කිසිම දෙයක් දැනෙන්නෙ නෑ. ඔය විදියට ගිහින් ඉපදිලා මහා කල්ප 500 ක් ආයුස ගෙවෙනකල් ඉන්නවා. ඉතින් මෙහේ බුදුවරු ගණනාවක් පහළ වුණත් ඒ අයට වැඩක් නෑ. සංඥා නැති නිසා මේ කියන බණක් ඇහෙන්නෙ නෑ. මොනව වෙනවද කියලවත් දන්නෙ නෑ. ඒ අය එහේ ඉන්න අතරතුර බුදුවරු ගණනාවක් පහළ වෙලා පිරිනිවන් පානවා. ඒ මොකවත් දන්නෙ නැතුව ආයු කාලය ගෙවිල නැවතත් කැරකිලා මෙහාට එනවා.

**බුදුන් වහන්සේ ලෝක සත්වයින්ට යන්න එපා කියපු එක තැනක් තමයි මේ අසඤ්ඤ සත්ත තලය කියන්නෙ.** යන්න එපැයි කිව්වෙ ඒ වගේ භාවනාවක් කරන්න එපා කියන එක. මොකද හරිම භයානකයි. **ගියොත් මෙලෝ දෙයක් දන්නෙ නැතිව ඔහේ සිහි විසඥවෙච්ච කෙනෙක් වගේ ඉඳල නැවතත් මෙහේට කඩා වැටෙනවා. නිවන් දැකලත් නෑ. මොකුත් වඩා ගත්තු දෙයකුත් නෑ.** නමුත් සම්මා දිට්ඨිය තියෙන කෙනෙක් කොහොමත් ඒ වගේ භාවනාවක් වඩන්නෙ නෑ. ඒක ස්වභාවයෙන්ම වැළකෙනවා. මොකද මේ අසඤ්ඤ භාවනාව වැඩීමත් සීලබ්බත පරාමාසයට අයිතියි. එතකොට සීලබ්බත පරාමාස කියන සංයෝජන ධර්මය දුරුවෙලා තියෙන නිසා බෞද්ධයෙකුට ඒ වගේ භාවනාවක් වැඩෙන්නෙ නෑ. මොකද **අනිච්ච, දුක්ඛ, අනත්ත කියන ත්‍රිලක්ෂණය අවබෝධ කරගෙන සම්මා දිට්ඨියට පත් වෙන්නෙ නැතිව බෞද්ධයෙක් වෙන්න බෑ, නිවන් දකින්න බෑ. ඒ ටික කර ගන්නෙ නැතිව බෞද්ධයෙක් වෙන්න පුළුවන් කියල කවුරුහරි හිතුවොත් ඒක දෘෂ්ටියක්.** එතකොට අසඤ්ඤ භාවනාව කරන අය ඒක වඩන්නෙ මෙන්න මේ දෘෂ්ටියේ ඉඳගෙන. ඒ නිසා මේ බෞද්ධ වෙන්න යන අයට තමයි මේ වගේ භාවනාවක් වඩන්න එපා කියල කිව්වෙ. ඒ තමයි අසඤ්ඤ සත්ත කියන බඹ තලයේ ස්වභාවය.

මේ අසඤ්ඤ තලයේ තියෙන්නෙ නිවනයි කියන දෘෂ්ටියේ හිටපු එක්තරා දේවතාවෙක් බුදුන් වහන්සේට මෙහෙම කියනවා. යම් කෙනෙක් යම් පෙදෙසකින් හිතන්නෙ නැතිව හිටියොත් ඒ ☞

පෙදෙසින් ඒ පුද්ගලය නිවන් දකිනවා, සියල්ලෙන්ම සියල්ල හිතන්නෙ නැතිව හිටියොත් ඒ පුද්ගලය නිවනින් පූර්ණ වෙනවා. එතකොට බුදුන් වහන්සේ ඒක එහෙම නෙවෙයි කියල දේශනා කරනවා. යම් ප්‍රදේශයකින් පවු සිද්ධ වෙනව නම් ඒක නතර කළ යුතුයි. යහපතට හේතු වන කුසලයට බාධා නොකළ යුතුයි, ඒ කුසලය වැඩිය යුතුයි. එයම නිවන් මගයි. සබ්බ පාපස්ස අකරණං කියන ගාථාවෙන් පෙන්වා දුන්නෙත් මේක තමයි. (සං.නි. 1 - 26 පිටුව - <u>මනෝ නිවාරණ සූත්‍රය</u>) මේ තමයි බුද්ධ දේශනාව. දැන් මෙතනින් පැහැදිලි වෙනවා, මේ අසඤ්ඤ සත්ත මාර්ගය බුදුන් වහන්සේ කොහොමටවත් අනුමත කළේ නැති බව.

හැබැයි මේ අසඤ්ඤ තලයේ දුකක් දැනෙන්නෙ නෑ. මොකද වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන මේ හතරම නෑ. රූප ජීවිතේන්ද්‍රිය විතරයි තියෙන්නෙ. එහෙම වේදනා නැති නිසා තමයි ඒ අය එහේ යන්නෙත්. ඒ කියන්නෙ සංඥා තිබුණොත් තමයි දුක් විඳින්න වෙන්නෙ. කය තිබුණට නෙවෙයි. කය කොහේ තිබුණත් කමක් නෑ. නින්ද ගිය කෙනාට රිදෙන්නෙ නැති වගේ අදහසක් ඒ අයත් ගන්නවා. නමුත් භයානකත්වය තියෙන්නෙ එහෙන් චුත වෙලා නැවත එනකොට තමයි. මෙච්චර කලක් අතරමං වෙලා හිටියයි කියල තමන් දන්නෙත් නෑ. මෙහේ ආවම ඒ පුද්ගලය හිතන්නෙ තමන් අලුතින් උපන්න කියල. එතනින් ලෝක සත්වයෝ අලුතින් උපදිනව කියල දෘෂ්ටියකට වැටෙනවා. ''මමත් එහෙම කෙනෙක්. මං ඉස්සෙල්ල හිටියෙ නෑ.'' මේ විදියට අදහස් අරගත්තම මහා කල්ප 500 ක අතීතය තමන්ට මතක නෑ. ඒක දකින්න අභිඤ්ඤාලාභී ආර්ය කෙනෙක් වෙන්නම ඕන. (හැබැයි මේ අසඤ්ඤ තලය කියන එක දකින්නෙ බුදු කෙනෙක් විතරයි.)

පෘතජ්ජනයෙක් විදියට ඉන්නව නම් අන්තඃ කල්ප 40 කින් එහාට තියෙන අත්බැව් දකින්න බෑ. එතකොට තමන් අලුතින්ම ලෝකෙට පහළ වුණා කියලයි හිතන්නෙ. ආපෝ, තේජෝ, වායෝ, පඨවි, ආකාස, ආලෝක, විඤ්ඤාණ කියන ධාතු හතෙන් මේ ලෝක සත්වයෝ බිහි වෙනව කියල තමයි ඒ අය නිගමනය කරන්නෙ. මෙහාට ආවට පස්සෙ මේ හතෙන් බිහිවුණයි කියල නිගමනය කරන නිසා තමයි, ඒ අය සත්ව කියල කියන්නෙ. ඒක දන්නෙ කොහොමද කියල ඇහුවම, තමන්ගෙ අත්දැකීම මතයි කියනවා. තමන් පහළ වුනෙත් එහෙමයි කියනවා. ලොව්තුරා බුදු කෙනෙක් පහළ වෙලා බුද්ධ ශ්‍රාවකයෙක් වෙච්ච දවසට තමයි දකින්නෙ, තමන් ඉස්සරත් ඉඳල තියෙනවනෙ කියල. ඉතින් මේ අය මේකට නිවන කියල රැවටුණාට නිවන් දැකල නෑ. ඒක ගෙවිල ඉවර වෙච්ච දවසට මිනිසත් වෙලා නැවත සතර අපායටත් යන්න පුළුවන්. ඒ කියන්නෙ බඹ ලොවින් කාම සුගතියට ඇවිත් එතනින් අපායටත් යනවා.

මහා කල්ප 500 ක් දකිනව කියන එක්තරා භික්ෂූන් වහන්සේ නමක් ඒ කාලෙ හිටියා. නමුත් එහෙම දිවැසක් උන් වහන්සේට තියෙනව කියල කෙනෙකුට හොයා ගන්න බෑ. මොකද මහා කල්ප 500 ක් තරම් අති විශාල කාලයක් තුළ මනුස්ස, දේව, සතර අපා ආදී විවිධ අත්බැව් විශාල ප්‍රමාණයක් ලබල තියෙන්න ඕන. නමුත් උන් වහන්සේගෙන් ඇහුවම එහෙම දෙයක් දන්නෙ නෑ කියනවා, අර මහා කල්ප 500 විතරක් දකිනව කියනවා. මේ විදියට අහන වෙනත් ප්‍රශ්නවලට උත්තර දෙන්න බැරි වුණා. ඉතින් මේ කාරණය වෙන්න බැරි නිසා මේ භික්ෂූන් වහන්සේ බොරු කියනව කියල, අනෙක් භික්ෂූන් වහන්සේලා බුදුන් වහන්සේට ගිහින් කිව්වා. එතකොට උන් වහන්සේ මහණෙනි, ඒක බොරුවක් නෙවෙයි, ඒ මහා කල්ප 500 ම එක අත්බැවක් කියල පෙන්නුවා. එක අත්බැවක් කියල කිව්වෙ ඒ අත් බැවේ කෙළවර දකිනවා. ඒ තමයි අර අසඤ්ඤ සත්ත කියන බ්‍රහ්ම තලය. ඉතින් ඒ මහා කල්ප 500 ම අසඤ්ඤ තත්ත්වයේ හිටපු නිසා වෙන අත්බැවක් ඒ අතර කාලයේ තිබිල නෑ. උන් වහන්සේ මග ඵල ලබල දිවැසින් දැකල තමයි අර මහා කල්ප 500 ක් දකිනව කියල කිව්වෙ.



එතකොට මේ අසඤ්ඤය කියන බ්‍රහ්ම ලෝකය, අරූප තලයට වඩා වෙනස්. අසඤ්ඤයේ රූප තියෙනවා. නමුත් සංඥා නෑ. ඒ නිසා මනසට ධර්ම ඝට්ටනයක් වෙන්නෙ නෑ. මනසට ගැබ් කර ගත්තු ශක්තිය විතරයි තියෙන්නෙ. ඒක හරියට ආරෝපණය කරපු කෝෂයක්, ඒකෙ ආරෝපණ ශක්තිය බහිනකල් තියෙනව වගේ වැඩක්. ඒ විදියට ඒ කර්ම ශක්තිය ගෙවෙන කල්ම එහේ ඉන්නවා. වියළි කෝෂයක් අරගෙන ඒකෙන් රත්වෙන උපකරණයකට විදුලිය දුන්නොත් ඉක්මනට ඒ කෝෂය බහිනවා. හැබැයි එල්.ඊ.ඩී. විදුලි බුබුලක් වගේ පොඩි දෙයක් පත්තු කළොත් සෑහෙන කාලයක් තියා ගන්න පුළුවන්. මේ එකක්වත් පාවිච්චි කළේ නැත්නම් ඒ කෝෂය ස්වභාවයෙන්ම බහින්න ඕන. ඒ කියන්නෙ ඒ කෝෂය ආරෝපණය කරල තිව්ව විතරයි මොකකටවත් පාවිච්චියට ගත්තෙ නෑ වගෙයි. නමුත් ඒකත් කවද හරි බහිනවා. මෙන්න මේ වගේ තමයි අසඤ්ඤ තලයේ උපදින කෙනාටත් ඒ තරම් ආයු කාලයක් තියෙනවා.

රූප ලෝකවලින් වැඩිම ආයු කාලයක් තියෙන්නෙ මේ අසඤ්ඤ සත්ත කියන බඹ ලෝකයේ. අර වියළි කෝෂයට සාමාන්‍ය විදුලි බුබුලක් ගැහුවම ඒ කෝෂයට තියෙන ආයු කාලය වගේ තමයි අනෙක් රූපාවචර බඹ ලෝකවල ආයු කාලය. නමුත් අරූපාවචර බඹ ලෝකවල ඉපදෙන බ්‍රහ්මයින්ගෙ ආයු කාලය මේ සියල්ලටම වඩා වැඩියි. එයිනුත් නේවසඤ්ඤා, නාසඤ්ඤායතනවල ඒ ආයු කාලය මහා කල්ප 84000 ක් වෙනවා. අනිත් අරූප ලෝකවන ආකිඤ්චඤ්ඤා-යතනයේ ආයු කාලය මහා කල්ප 60000 කුත්, විඤ්ඤාණංචායතනයේ මහා කල්ප 40000 කුත්, ආකාසානංචායතනයේ මහා කල්ප 20000 කුත් වශයෙන් ආයු කාලය පිහිටනවා. මනුස්ස ලෝකය කියන්නෙ හරියට වියළි කෝෂයෙන් මෝටරයක් වැඩ කරනව වගෙයි. ඒ කියන්නෙ ඉක්මනට බහිනවා. කාම ලෝකයේ ක්‍රියාවලිය හරි වේගවත්. මේ නිසා ආයු කාලය අඩුයි. රත් වීමත් ක්‍රියාත්මක වීමත් දෙකම වේගයෙන් සිද්ධ වෙනවා. මේ වගේ තමයි මේ ලෝකවල ආයු කාලය. එතකොට ආලෝකය ගත්තමත් මේ වගේ එකිනෙකට වෙනස්. මනුස්ස ලෝකයේ කණාමැදිරි එළියක් නම්, දෙව් ලොව පහන් එළියක් වගෙයි. බඹ ලොව විදුලි බුබුලක් ☞

වගෙයි.

දැන් මේ බඹ ලොව බ්‍රහ්මයින්ටත්, **චුත වෙන්න කිට්ටුව දෙව් ලොව වගේම දාහය, මරණ බය ඇති වෙනවා. ඒ කියන්නෙ චුත වෙන්න එන බව දන්නවා. නමුත් කරන්න දෙයක් නෑ.** එදාට ඒ සම්පත්තිය පිරිහිලා යන බවත් දන්නවා. හයක් තැති ගැන්මක් ආවොත් ඒ අයත් දුවනවා. හැබැයි දෙව් ලොව වගේ, බඹ ලොව බ්‍රහ්මයින් අනෙක් බ්‍රහ්මයින්ගෙ අණට යටත් වෙන තත්වයක් නෑ. තමන්ගෙ තියෙන මාන්නය, උද්දාමය පෙන්වනව මිසක් අනෙක් අය යටත් කරන්න උත්සාහ කරන්නෙ නෑ. දෙව් ලොව නම් අපහාස උපහාසත් කරනවා. නමුත් බඹ ලොව එහෙම නෑ. මාන්නක්කාරකම තමයි ප්‍රධාන. ඒ කියන්නෙ මේ මනුස්ස ලෝකයේ වගේ අධි මාන්නයක් නෙවෙයි. මමත්ත්වය කියන සියුම් මාන්නයක් තමයි තියෙන්නෙ. නමුත් ඒක අපිට සියුම් වුණාට බඹ ලොවේදි ඒක කැපිල පේනවා. ඒකෙන් තමන්ගෙ තත්ත්වෙ මෙහෙමයි කියල අනිත් අයට පෙන්වනවා. ඒක දැකල තවත් අයෙක් දාහයට පත් වෙනවා. එහෙම නැතිව අණ කරල යටත් කරන ස්වභාවයක් එහේ නෑ.

උදාහරණයකින් පහදනව නම් පාසලක විදුහල්පති කෙනෙක් ඉන්නවා. ඊළඟට උප විදුහල්පතිවරයෙක් ඉන්නවා. ඊටත් පහලින් ගුරුවරු ඉන්නවා. මෙතනදි මහා බ්‍රහ්මයත් විදුහල්පති වගෙයි. උප විදුහල්පති බ්‍රහ්ම පුරෝහිත වගෙයි. ගුරුවරු බ්‍රහ්ම පරිසජ්ජයේ ඉන්න සේවක බ්‍රහ්මයො වගෙයි. දැන් මෙතනදි උප විදුහල්පතිත්, ගුරුවරුත් ඉන්නෙ විදුහල්පති යටතෙ. හැබැයි යටත් වීමේ දාහයක් නෑ. තම තමන් ස්වාධීනව වැඩ කරගෙන යනවා. එක්කෙනෙකුට එක්කෙනෙක් මහත්තය, නෝන (සර්, මිස්) කියල කතා කරනව මිසක් කාටවත් අණ කරල කතා කරන්නෙ නෑ. මොකද ඒ හැමෝම දන්නව තමන් නිලධාරීන් කියල. මොනව හරි අඩුපාඩුවක් තියේ නම් ඒක කියන්න තමයි තමන් ඉන්නෙ කියල දන්නවා. හැබැයි අර ඉහළ නිලධාරියෙක් සේවකයෙකුට අණ කරනව වගේ සිද්ධියක් පාසලක නෑ. ඒ වෘත්තියේ එකිනෙකාගෙ ගරුත්වය රැකගෙන ඉන්නවා. නිකං නම කියල අර කම්කරුවන්ට වගේ කතා කළොත් එහෙම, තමන්ට තැනක් නැති බවත් දන්නවා. මේ වගේ බඹ ලොවෙත් අණ පනත් නෑ. හැබැයි තමන්ගෙ තත්ත්වය නිසා මාන්නක්කාර බව තියෙනවා.

ඒ වගේම මනුස්ස ලෝකයේ තියෙන ලෝභ, ද්වේශ, මෝහ වෙනුවට මාන, උද්දච්ච, අවිද්‍යා තමයි බඹ ලෝකෙ තියෙන්නෙ. මානය තමයි ලෝභය වෙනුවට තියෙන්නෙ. ද්වේශය වෙනුවට තියෙන්නෙ උද්ධච්චය. මෝහය වෙනුවට තියෙන්නෙ අවිද්‍යාව. ඒ කියන්නෙ ලෝභ, ද්වේශ, මෝහවල ඉතා සියුම් පැත්තක් තමයි බඹ ලොව තියෙන්නෙ. ඒ නිසා තමයි බ්‍රහ්මයින්ට බාහිත පාපී (බැහැර කරන ලද පව්) කියල කියන්නෙ නැත්තෙ. බ්‍රහ්මයින්ටත් ලෝභ සිත් පහළ වෙනවා. රහත් වෙන කල් ඒක ඇරෙන්නෙ නෑ. ඒක මාන්නය නිසා හට ගන්න අති සියුම් දෙයක්. මාන්නයත් එක්තරා ලෝභයක්. මට මෙච්චර තියෙනවයි කියල තමන්ගෙ සම්පත්තිය පෙන්වනව මිසක් අනෙක් අයට දෙවෙනි වෙන්න කැමති නෑ. ඒකට පහර වැදුනොත් තමයි උද්දච්චය එන්නෙ. මේ දෙකටම අවිද්‍යාව මුල් වෙනවා.

ඒ වගේම මේ ලෝකයේ සියලු සත්වයින්ම තමන්ගෙ දරුවන් හා සමානව දකින ලක්‍ෂණය මේ හැම බ්‍රහ්මයෙකුටමත් තියෙනවා. ඒ කියන්නෙ සතර බ්‍රහ්ම විහරණ. ඒ ගුණය මහා බ්‍රහ්මයාට විශේෂයෙන් තියෙනවා. විශේෂයෙන් තියෙනවයි කියන්නෙ වෙන හේතුවක් නිසා නෙවෙයි, මහා බ්‍රහ්මයා තමන් මේ සියලු දෙනාම මවල ඉන්නෙ කියල තමන්ගෙ දරුවො කියන දෘෂ්ටියෙන් ගත්තු නිසා. බුදු බණ ඇහුවත් පිය - දරු කියන ඒ දෘෂ්ටිය අත් හරින්නෙ නෑ. ඒක ආස්වාදයෙන් ගන්නවා. උදාහරණයක් විදිහට පුංචි කාලෙ ඉඳලම අරන් හදාගත්තු ළමයෙක් ලොකු වුනාට පස්සෙ කවුරුහරි කිව්වොත්, උඹ අරන් හදාගත්තු එකෙක් කියල ඒක පිළිගන්න කැමති නෑ. ඇත්ත කියල දැනගත්තත් කියනවට කැමති නෑ. ඒ වගේම ඒ ළමයව අරන් හදාගත්තු තාත්තත්, පිට අය එහෙම කියනවට කැමති නෑ. කාරණය ඇත්ත බව දන්නවා. නමුත් අර පිය-දරු සෙනෙහසත් එක්ක එන සමාජ පිළිගැනීම නිසා ඒක කියනවට කැමති නෑ. තමන්ගෙම දරුවෙක් කියල තමයි කියන්න කැමති. මෙන්න මේ වගේ තමයි මහා බ්‍රහ්මයත්. ඒ නිසා විශේෂයෙන් සතර බ්‍රහ්ම විහරණ පිහිටනවා. ඒ නිසා තමයි මහා බ්‍රහ්මයට සතර බ්‍රහ්ම විහරණ විශේෂයෙන් සම්බන්ධ කරල පෙන්නුවෙ. නමුත් අනෙක් හැම බ්‍රහ්මයෙකුටමත් ඒ ගුණය තියෙනවා. එතකොට **ලෝකය කඩා ගෙන වැනසිලා යනකොට, මිනිස්සු ගහ මරා ගන්න කොට හරියට තමන්ගෙ දරුවො, උන් උන් කා කොටා ගන්නව වගේ තමයි දකින්නෙ. එතකොට හැම වෙලේම මහා කම්පාවක් ඇති වෙනවා.** ඒ කියන්නෙ මනුස්ස ලෝකය ආවර්ජනය කළොත් මහා කම්පනයක්. හැබැයි ආවර්ජනය නොකර ඉන්නත් හරි අමාරුයි. ''ඒ අය මොනව කරනවද දන්නෙ නෑ?'' මෙහෙම කැකෑරෙන සිතිවිලි එනකොට දාහය තවත් වැඩි වෙනවා. ඉතින් එතනත් මහ දුකක්.

හැබැයි රූපාවචර බ්‍රහ්ම ලෝකෙදි මේ විදියට ආවර්ජනය කරල බලන්න පුළුවන් වුණාට, අරූප බ්‍රහ්ම ලෝකෙදි බලන්න ඕන වුණත් බලන්න බෑ. හරියට රට ඉන්න දෙමවුපියො තමන්ගෙ දරුවන් ගැන හොයනව වගේ. ඒ කියන්නෙ ඒ අයට තමන්ගෙ දරුවන් ගැන දැක බලා ගන්න ඕන වුණාට, එහේ ඉඳන් ඒක පේන්නෙ නෑ. ''මොනව කරගන්නවද දන්නෙත් නෑ! උන් ඉස්කෝලෙ ගියාද දන්නෙත් නෑ! අනේ මේ වෙලාවෙ පොඩි එකා කොහෙ ඉන්නවද දන්නෙ නෑ...'' මේ ආදී වශයෙන් තැවෙනවා මිසක් දැක බලාගන්න විදියක් නෑ. ඉතින් එහේ ඉඳගෙන කල්පනා කරනවා, දැන් මෙලහකට මොනව කරගෙන ඇත්ද කියල. මේ වගේ බ්‍රහ්මයින්ටත්, මම දැන් ආපහු යන්න ඕන මගේ එවුන් බලල එන්න කියන සිතිවිල්ල එනකොටම විශාල දාහයක් එනවා. මොකද කොච්චර නම් මේ ලෝක සත්වයෝ ගහ මරා ගන්නවද කියන කාරණය ඒ අය දන්නවා. හැබැයි අරූප ලෝකෙදි ඒක දිවැසට යොමු වෙන්නෙ නෑ. මොකද රූප නැති නිසා. රූප බලන්න පුළුවන් ශක්තියක්, ඉන්ද්‍රියක් එහේ නෑ. බලන්න දැඩි අවශ්‍යතාවයක් තිබුණත් ඇසක්, දිවැසක් නැති නිසා ඒක පේන්නෙ නෑ. හැබැයි මනෝන්ද්‍රිය තියෙන නිසා කල්පනා ලෝකයක් තියෙනවා. ඒක අඳුරු නෑ.

අන්තිමට නේවසඤ්ඤා නාසඤ්ඤා කියන අරූප බ්‍රහ්ම ලෝකවලට ගිහින් බැලුවත් කල්පනා කරන්න පුළුවන්. ( නේවසඤ්ඤා - බාහිර ලෝකයේ සංඥාවක් නැති, න + අසඤ්ඤා - නාසඤ්ඤා - අසඤ්ඤ නැති - හිතේ පවතින ප්‍රභාෂ්වර චිත්තයේ ඇති චෛතසිකය දකින හෙවත් එම හිතෙන් එම හිත දකින) හැබැයි එතකොට ලෝක සත්වයා ගැන දයානුකම්පාව වැඩියි. අර දරුවො මතක් වෙන දෙමවුපියො වගේ නිතරම අනුකම්පාවක් ඇති වෙනවා. මොකද මේ සතර බ්‍රහ්ම විහරණ වඩල උපේක්‍ෂා කියන බ්‍රහ්ම විහරණයත් ඉක්මවල රූප ඉක්මවා යනකොට තමයි වැඩියෙන්ම අරූප ලෝකෙට යන්නෙ. ඉතින් ඒකෙ ඉඳගෙන, අනේ මගෙ මනුස්සයො වගේ ඉන්න දරුවො ටික මේ වෙලාවෙ මරා ගන්නවනෙ, මට බලන්නත් බෑනෙ කියල කල්පනා වෙන කොට මහා දාහයක් එනවා. ඒක දරාගන්න බෑ. මේ නිසා අරූප ලෝකත් දුකයි. ඒ අය පුද්ගලිකව සැප විඳින්න කියල ගියත් එතැනත් දුකක් තියෙනවා. මොකද අනුකම්පාව වැඩියි. හරියට තමන්ගෙ දරුවො කන්න බොන්න නැතිව දුක් විඳින කොට දෙමවුපියන්ට සැප විඳින්න

බෑ වගේ. මෙතනින් කරුණා බ්‍රහ්ම විහරණය වඩපු අය ආකාසානඤ්චා-යතනයේ උපදිනවා. (ආකාස + අනන්ත + ආයතනය - අනන්ත ආකාසය අරමුණු වෙන ආයතනය) මුදිතා බ්‍රහ්ම විහරණය වඩපු අය විඤ්ඤාණංචායතනයේ උපදිනවා. (විඤ්ඤ+ අනන්ත + ආයතනය - ප්‍රභාෂ්වර හිතට ගෝචර වන්නා වූ දැනීම හෙවත් පෙනීම අනන්තයි.) උපේක්ෂා බ්‍රහ්ම විහරණය වඩපු අය ආකිඤ්චංඤ්ඤායතන බඹ ලොව උපදිනවා. (අකිඤ්ච + අඤ්ඤ+ ආයතනය - හිතෙන් පිට අන්‍ය කිසිවක් නැති ආයතනය) මේ තුනම අරූප ලෝක.

ඊළඟට මෙත්තා බ්‍රහ්ම විහරණය වඩපු අය සුභකිණ්හක කියන රූපාවචර බඹ ලොව උපදිනවා. අනිත් බ්‍රහ්ම ලෝකවලට යන කොට කසින, දස කසින වගේ වෙනත් විවිධ දේවල් අරමුණු වෙනවා. දැන් මෙතනින් මේ අරූප බඹ ලොවට යන්නෙ නම් වෙන අදහසකින්. ''මම එහේ ගිහින් කිසිම කරදරයක් නැතිව නිදහසේ ඉන්නවා, මෙහේ තියෙන එකක්වත් මට ඕන නෑ, මේවායින් දුක් විඳ විඳ හිටිය දැන් ඇති, මං මේව ඔක්කොම අත් හැරල යනවා....'' මේ ආදී වශයෙන් තමයි අරූප බඹ ලොවට යන්න සංඛාර වඩන්නෙ. හැබැයි එහේ ගියාට පස්සෙ ඒ මානසිකත්වය නෑ. දැන් වෙනත් විදියකට තමයි හිතෙන්නෙ. ''මම මෙහේ කරදරයක් නැතිව නිදහසේ හිටියට, මේ වෙලාවෙ මම ඉස්සෙල්ල හිටපු ලෝකෙ මිනිස්සු කොච්චර නම් විනාස වෙනවද? කොච්චර නම් දුක් විඳිනවද?'' මෙහෙම හිත හිතා දුක් වෙනවා. නමුත් ඉතින් දැන් බැලුවට පේන්නෙත් නෑ. බලන්න දිවැසක් එතැන නෑ. නමුත් යන්න ඉස්සෙල්ල, මට නොබලපු තරමට හොඳයි කියලයි ගියේ. ඒත් දැන් නොබල ඉන්න බැරි තැනක් තමයි ලැබිල තියෙන්නෙ. දුකෙන් අහක් වෙන්න පුළුවන් කියන හැඟීමෙන් තමයි එහෙට ගියේ. මෙහේ නැති සුවය එහේ තිබුණට, දැන් හිතෙන් දුක් වෙනවා. ඉතින් කලින් හිටපු ලෝකය ගැන දැන් හිතුවට පේන්නෙ නෑ. ඒක මවා ගන්න බෑ. විශාල අසහනයක්.

අරූප රාගය දුරු වෙන්නෙ මෙන්න මෙතනදි තමයි. එතකල් ඒක දුරුවෙන්නෙ නෑ. මෙතනදි මේ අරූප රාගය නිසා විඳින දුක දකින්න ඕන. අරූපෙට නොගිහින් මනුස්ස ලෝකයේ ඉඳගෙන හරි ප්‍රඥාවට යොමු වෙන්න ඕන. එතකොට වැටහෙනවා, මෙතන මෙහෙම දුකක් තියෙනවනෙ කියල. අරූප ලෝකෙදි නම් ඒ අත් බැවේ ඉන්න කොට ඒ ලෝකයේ තත්ත්වය විතරක් වැටහෙනවා. ඒ කියන්නෙ තමන්ගෙ මනෝමය තත්ත්වය විතරයි වැටහෙන්නෙ, අරමුණු වෙන්නෙ. ඒ ලෝකෙ තව කෙනෙක් ඉන්නවද කියලවත් දන්නෙ නෑ. ඒක අහුවෙන්නෙත් නෑ. නමුත් තමන්ගෙ අතීත සිද්ධි අරමුණු වෙනවා. පෙර මනුස්ස ලෝකයේ හිටපු හැටි, ආශ්‍රය කරපු පිරිස් අරමුණු වෙනවා. **ඉතින් දැන් ඉන්න ලෝකෙට එනකොට සන්තෝසෙන් ආවට කාලයක් යන කොට පාළුවක් දැනෙනවා. අර අතීත සිද්ධි, පිරිස් අරමුණු වෙනවා. නමුත් ඒ අරූප අත්බැවේදී අනිත් ලෝකවල සත්වයෝ මොනව කරනව ඇත්ද කියල හිතුවට ඒ ලෝක පේන්නෙ නෑ. ඒක අසහනයක්.** නොපෙනිච්ච තරමට හොඳයි කියල සතුටින් මෙහෙන් ගියාට, අනේ මගෙ දරුවොනෙ කියල එහේදි සිහි වෙනවා. දැන්



ශෝකය, දුක එනවා. ඒ දුක නැත්තෙ සංඥා නැති අසඤ්ඤ තලයේ විතරයි. ඒ කියන්නෙ අසඤ්ඤ සත්ත තලයෙදි ස්පර්ශ වින්දනය අනුශය වශයෙන් තාවකාලිකව යටපත් වෙලා තියෙන්නෙ. කිසිම දෙයක් විඳින්නෙ නෑ. හිත නැතිවම කය තියෙනවා. හැබැයි කයට ස්පර්ශ වුණාට හිත නැති නිසා දැනෙන්නෙ නෑ. හරියට සිහි නැති කරපු කෙනෙකුට ශරීරය කපනව කොටනව දැනෙන්නෙ නෑ වගේ. හැබැයි මේ අසඤ්ඤ තත්ත්වෙදි බැහැගත් ලෞකික දෘෂ්ටිය නිසා ඒ ආයු කාලය ගෙවෙනකල් විතරයි ඒක තියෙන්නෙ.

නමුත් නිරෝධ සමාපත්තියේදී ප්‍රඥාවෙන් දැකලයි ඒ සමාපත්තියේ ඉන්නෙ. එතනත් සිතිවිලි, ක්‍රියා, වදන් මේ මුකුත් නෑ. හිතන්න එකක් නැත්නම් දුකක් නෑ. ඒක තමයි කිව්වෙ විඳින්නෙකුට දුක පනවනව මිසක් නොවිඳින්නෙකුට දුකක් පනවන්නෙ නෑ කියල. විඳිනව කියන්නෙ වේදනාව. මනෝ සංඛාර කියන ඒවා නේවසඤ්ඤා නාසඤ්ඤායතනයට යන කල්ම තියෙනවා. ඒ නිසා විඳිනවා. ඒ විඳින නිසා තමයි දුක පනවන්නෙ. මොකද විඳින කෙනාට මතක් වෙනවා. එතකොට දුකයි. නමුත් නිරෝධයට ගියාට පස්සෙ මතක නෑ. මතක් කරන්න හිතක් නෑ. මේ නිසා දුක් විඳින යමක් ගොඩ නැගෙන්නෙ නෑ. ඊට පස්සෙ හිතන්න කෙනෙක් නෑ. නාම ඉවරයි. නාම රූප දෙකම නිරෝධ නම් ඒ තමයි පූර්ණ නිවන. ඒක තමයි අනුපාදිසේස නිවන කියන්නෙ. ඒ කියන්නෙ ශේෂයක්වත් දුක නැතිවම නිවන් දැක්ක කියන එක. එතකොට තමයි දුක සම්පූර්ණයෙන්ම නැත්තෙ. සෝපාදිසේස නිවනෙදි කෙළෙස් පරිනිර්වාණය වුනාට කයට එන දුක තියෙනවා. ශේෂ සහිතයි. පිරිනිවන් පාන කොට තමයි මේ දුක් දෙකම නැති වෙන්නෙ. දුක නැති එකම තැන නිවන. දැන් මේ විදියට බලාගෙන යනකොට **මේ ලෝක තල 31 න්ම දුක අහක් කරන්න පුළුවන් කිසිම තැනක් නෑ. අඩු වැඩි වශයෙන් දුක හැම තැනම තියෙනවා.**

දැන් මේ කාරණයට අදාලව තවත් හොඳ දහම් කතාවක් තියෙනවා. එක්තරා භික්ෂූන් වහන්සේ නමක් අනාගාමී ඵලයට එනකල් දැහැන් වඩල, කටයුතු කරල ඉතිරි වැඩ කටයුතු ටික පූර්ණ කරගන්නෙ නැතිව නිකං කම්මැලිකමට හිටියා. මේක දැනගත් බුදුන් වහන්සේ, ඇයි මහණ ඉතිරි ටික කරගන්නෙ නැද්ද කියල ඇහුවා. අනේ ස්වාමීනි, මම කොහොමත් ඊළඟ අත්බවයෙ බඹ ලොවනෙ උපදින්නෙ, ඒ නිසා ඉතිරි ටික කරගන්න මට එච්චර උනන්දුවක් නෑ කියල මේ භික්ෂූන් වහන්සේ කිව්වා. මෙතනදී බුදුන් වහන්සේ උපමාවක් පෙන්වනවා. අතේ අසූචි ගෑවිලා ඉන්න කෙනෙක් අත පිහදා ගත්තම පිටින් බැලුවට අසූචි පේන්නෙ නෑ. හැබැයි ඉඹල බැලුවොත් ගඳයි. එහෙනම් අසූචි ගඳත් යන්න සම්පූර්ණයෙන්ම අත හෝදගන්න ඕන. මෙන්න මේ වගේ ඔය යන ස්ථානයත් නොපෙනෙන්න හිටියට ඒක හොඳ තැනක් කියල මම කියන්නෙ නෑ. හිතන්න එපා ඔය ස්ථානයත් සුව තැනක් කියල. ඔතනට යනව කියන එක හරියට අර අසූචි ගෑවිලා තියෙන අත් දෙක පිහිදගෙන අසූචි නෑ කිව්ව වගේ වැඩක්. දැන් මේ විදියට උපමාවක් පෙන්වල ඉතිරි වැඩ කටයුතු ටික කරගන්න ඒ භික්ෂූන් වහන්සේට අවවාද කළා.

මොකද මේ අනාගාමී ඵලයට පත් වෙච්ච කෙනෙක් ඊළඟ අත්භවයෙ පංච සුද්ධාවාස කියන බඹ ලෝක ☞

පහේ ගිහින් ඉපදිලා, එතැන දහම් රසය විඳ විඳ දහම් සුවයෙන් ඉන්නවා. නමුත් එතැනත් දුක තියෙනවා. මොකද රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිද්‍යා කියන සංයෝජන ධර්ම 5 ක්‍ෂය වෙලා නෑ. අනෙක් පෘතජ්ජනයින් යන බ්‍රහ්ම ලෝකවල බ්‍රහ්මයින්ට සත්කායදිට්ඨි, විචිකිච්චා, සීලබ්බත පරාමාස, කාමරාග, ව්‍යාපාද ඇතුළු සංයෝජන ධර්ම 10 ම තිබුණට පංච සුද්ධාවාසයේ බ්‍රහ්මයින්ට ඒ මුල් 5 නෑ. නමුත් අර ඉතිරි 5 න් දුක හට ගන්නවා. අනෙක් අයගෙ සම්පත්තිය දැකල ඇතිවන දාහයත් එක්තරා මට්ටමකට තියෙනවා. ඒ වගේම සතර බ්‍රහ්ම විහරණත් වැඩෙන නිසා අර අනෙක් බ්‍රහ්ම ලෝකවල තියෙන දුකත් එක්තරා මට්ටමකට තියෙනවා. මේ නිසා, අනේ මනුස්සයො දුක් විඳිනවා කියල කම්පනයක් ඇති වෙනවා. අනෙක් සත්තු ගැන දරුවො වගේ හැඟීමක් ඒ අයටත් එනවා. ඉතින් මේ කියන ජාතියේ දුක් කරදර මනසට එනවා.

නමුත් මේ සතර බ්‍රහ්ම විහරණ වැඩුවත් අනාගාමී කෙනෙක් අරූප බ්‍රහ්ම ලෝකෙට යන්නෙ නෑ. මොකද ඒ අයට ධර්ම උපාදානය තියෙනවා. ඒ කියන්නෙ බුදුන් දකින්න, බණ අහන්න, සාකච්ඡා කරන්න, තමන් වගේ තවත් අය දකින්න ඒ අයත් කැමතියි. නමුත් අරූප ලෝකවල ඒවා කරන්න බැරි නිසාත්, රූප රාගයෙන් මිදිල නැති නිසාත් අරූප ලෝකවල උපදින්නෙ නෑ. නමුත් මේ කියන ආසාවත් සසර ගමනට ඇති බාධකයක්, ක්ලේශයක් විදියට බුදුන් වහන්සේ පෙන්නුවා.

දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, සතර බ්‍රහ්ම විහරණ වඩපු අය අරූප බඹ ලොව උපදිනව නම්, ඇයි අනාගාමී කෙනෙක් සතර බ්‍රහ්ම විහරණ වඩන්නෙ නැද්ද කියල. මෙතනදි මග ඵල නොලබපු පෘතජ්ජන කෙනෙක් මේ සතර බ්‍රහ්ම විහරණ වඩන ආකාරයක් තියෙනවා. කරුණා බ්‍රහ්ම විහරණය වඩන කොට දුක්ඛිත සත්වයින් එල්ල කරල තමයි ඒක වඩන්නෙ. එතකොට දුක්ඛිත සත්වයින්ට කරුණා සමාධිය වැඩුව නම් මෙහෙම අදහසක් එනවා. ''අනේ මේ ලෝක සත්වයෝ දුක් විඳිනව මට බලන් ඉන්න සිද්ධ වුනානෙ! ඒක මට මොන තරම් වදයක්ද?'' එතකොට දුක්ඛිත සත්වයින් නොබලන කැමැත්ත නිසා තමයි මෙතනදී අදාල අරූප ලෝකෙට යන්නෙ.

ඊළඟට මුදිතා බ්‍රහ්ම විහරණය කියන්නෙ සැඩ පරුෂ පුද්ගලයො මුදු මොළොක් බවට පත් කරන්න තියෙන කැමැත්ත. එතකොට මෙහෙම දකිනවා. ''කොච්චර මුදු මොළොක් බවට පත් කරන්න උත්සාහ කළත් මේ සැඩ පරුෂ පුද්ගලයො උන්ගෙ සැඩ පරුෂකම් අත්හරින්නෙ නෑ. පුදුම අසත් පුරුෂයො! මුන් ඉන්න සීමාවෙ ඇහැටවත් පේන්න ඉන්න නැත්නම් කොච්චර හොඳද?'' මේ අදහසින් වඩන කොට තමයි මුදිතාවෙන් අදාල අරූප ලෝකෙට යන්නෙ.

ඊළඟට උපේක්ෂා බ්‍රහ්ම විහරණය වඩන කොට මේ විදියට තමයි අදහස එන්නෙ. ''කරන්න දෙයක් නෑ. මුන්ට කියල වැඩක් නෑ. උන් එකෙක්වත් කිව්වට අහන්නෙ නෑ. උන්ගෙ මතවල උන් ඉන්නවා. මම මගේ පාඩුවෙ වැඩක් බලාගෙන ඉන්නවා. මට ඔය එකෙක්වත් ඕන නෑ. මීට පස්සෙ මං ඔය එකෙක් ගැනවත් බලන්නෙ නෑ.'' මෙහෙම අදහස් එනකොට දැන් මනුස්සයො හදන්න යන්නෙ නෑ. හිතෙන්ම අත් හරිනවා. එහෙම වඩන කොට උපේක්ෂාවෙන් අදාල අරූප ලෝකෙට යනවා.

නමුත් අනාගාමී කෙනෙක් මේ සතර බ්‍රහ්ම විහරණ වැඩුවත් දහම් උපාදානය අත් හරින්නෙ නෑ. ඒක දැඩිව අල්ල ගන්නවා. ඒ නිසා බණ අහන්න, බණ කියන්න, දහම් පිරිස් ඇසුරු කරන්න බොහොම කැමතියි. ඒ අය ඇසුරු කිරීමෙන් දාහයක් එන්නෙ නෑ. ඒ අය ඇසුරේ ඉන්න කොට හිත ප්‍රසාදයට පත්වෙනවා. ඒ දහම් රසයට ඇති කැමැත්ත අර බ්‍රහ්ම විහරණත් අභිබවා යනවා. ඒක කඩන්න බැරි ප්‍රසාදයක් වෙනවා. එතකොට අර අසත් පුරුෂ පැත්තම අත හැරල දාල දහම් පිරිස එක්ක ප්‍රිය මනාපෙන් බැඳෙනවා. ඉතින් තමන්ට ගැලපෙන ඒ දහම් පිරිස ඉන්නෙ සුද්ධාවාස බඹ ලොවේ නිසා, අරූප බඹ ලොවට නොගිහින් එතැනට යනවා. නමුත් අර කලින් කියපු වගේ පෘතජ්ජනයෙක් ඒ බ්‍රහ්ම විහරණ වැඩුවත් ඒ පුද්ගලයට දහම් රසයක් නෑ. එතැන දහම් රසයට සම්බන්ධ මනසක් නැති නිසා එහෙම උපාදානයක් ඒ පුද්ගලයාට ඉතිරි වෙලා නෑ. ඒ නිසා ඒ බ්‍රහ්ම විහරණයට අදාල අරූප බඹ ලොව ගිහින් උප්පත්තිය ලබනවා. මේ තමයි පෘතජ්ජන උදවියයි, අනාගාමී උදවියයි වඩන බ්‍රහ්ම විහරණවලින් ඇති වන වෙනස.

හැබැයි ලෝකයේ මිනිස්සු පංච සුද්ධාවාසය කියල හිතාගෙන ඉන්නෙ උපරිම සුද්ධ වන්ත සත්වයො ඉන්න තැනකට. නමුත් බුදුන් වහන්සේ ඒකත් පෙන්නුවෙ, අර අසූචි තැවරිච්ච අත් දෙක හෝදගන්නෙ නැතිව පිහදාගෙන විතරක් ඉන්නව වගේ. මග ඵල ලැබුවත් වැඩේ ඉවර නැති නිසා ඒ දුක එතන තියෙනවා. **මේ නිසා උන් වහන්සේ පංච සුද්ධාවාසයත් හොඳයි කිව්වෙ නෑ.** එතකොට ලෝකයේ දුක අහක් කරපු කිසිම තැනක් නෑ. දුක්ඛෝ ලෝකෝ පතිට්ඨිතා කියන බුද්ධ දේශනාව අනුව කාම, රූප, අරූප කියන මේ තුන් ලෝකයේම දුක තියෙනවයි කියන කාරණය මේ අනුව ඔප්පු වෙනවා. ලෝකය දුකේ ගිලිල පිහිටියයි කියන එකයි මේ කියන්නෙ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 23 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** ¤ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ¤ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ¤ සමන් සිල්වා මහතා - කළුතර ¤ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ¤ රාජ් නිල්මිණි විජේවික්‍රම මහතා - ගොඩගම ¤ චිත්‍ර ශිල්පී එස්. එම්. ජයසේකර මහතා - මාලබේ ¤ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ¤ ඩබ්. ඒ. තිළිණවතී මහත්මිය - කඩවත ¤ ප්‍රසාද් ද සිල්වා මහතා - දෙල්ගොඩ ¤ ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලයේ චන්දිම පෙරේරා මහතා ඇතුළු කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ¤ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ¤ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ¤ නන් අයුරින් දායක වූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය** ¤ සමන් සිල්වා මහතා - කළුතර - රු. 18,000/- ¤ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු. 10,000/- ¤ තුසිත නාකන්දල මහතා-මහනුවර- රු. 6,000/- ¤ තමර ධනුෂ්ක හෙට්ටි ආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - කොළොන්නාව - රු. 6,000/- ¤ අමිත් හඳුගොඩ මහතා - අත්තිඩිය - රු.5,000/- ¤ චරිත් ☞

ඉන්දික මහතා - ඉතාලිය - රු. 5,000/- ¤ පහන්යා ලංකේශ්වර දියණිය ඇතුළු පවුලේ සැම - නෙළුව- රු. 5,000/- ¤ නියාගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කේ.එච්. සඳුන් රණසිංහ මහතා ඇතුළු පවුලේ සැම - රු. 5,000/- ¤ අජිත් අල්විස් මහතා ඇතුළු පවුලේ සැම - පැපිලියාන - රු. 5,000/- ¤ සොනාලි සමරදිවාකර මෙනෙවිය - මහරගම - රු. 5,000/- ¤ ජානක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 5,000/- ¤ නිරෝෂ් සපරමාදු මහතා - කොච්චිකඩේ - රු. 3,000/- ¤ අමිල සල්ගාදු මහතා - බෝමිරිය රු. 2,500/- ¤ තුෂාරා පද්මකාන්ති මහත්මිය ඇතුළු පවුලේ සැම - පානදුර - රු. 2,500/- ¤ සංජය රණවීර මහතා - මහරගම රු. 2,500/- ¤ නලින් සේකර මහතා සහ ඩබ්. ප්‍රේමවතී මහත්මිය - වළල්ලාවිට - රු. 2,500/- ¤ ජී.ඩී. තිස්ස අල්විස් මහතා ඇතළු පවුලේ සැම - රු. 2,000/- ¤ විජිතා ජයසුන්දර මෙනෙවිය - කුරුණෑගල - රු. 2,000/- ¤ චමින්ද කුලරත්න මහතා - කොට්ටාව - රු.2,000/- ¤ ජයනාත් සුබසිංහ මහතා - පන්නිපිටිය - රු.2,000/- ¤ අස්විනි දසනායක දියණිය ඇතුළු පවුලේ සැම - පිලියන්දල - රු. 2,000/- ¤ පී.ඩී. සිරිසේන මහතා ඇතුළු පවුලේ සැම - මීගොඩ - රු. 1,800/- ¤ නදුල අබේසිංහ මහතා - තිහගොඩ - රු. 1,550/- ¤ අයිරාංගනි තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ¤ දමයන්ති ලියනගේ මහත්මිය - කිඹුලාපිටිය - රු. 1,175/- ¤ එච්.ලීලාවතී මහත්මිය - දෙහිඅත්තකණ්ඩිය - රු. 1,000/- ¤ ඩබ්. විලියම් මහතා - දෙහිඅත්තකණ්ඩිය - රු. 1,000/- ¤ කේ.ඒ.උපාලි ජිනදාස මහතා - ගැටහැත්ත - රු. 1,000/- ¤ ටී. කරුණාවතී පෙරේරා මහත්මිය- හොරණ - රු.1,000/- ¤ මාලනී සිරිමාන්න මහත්මිය - රදාවාන රු. 1,000/- ¤ කාංචනා සුභාෂිනී අතුකෝරාල මහත්මිය - එංගලන්තය රු. 1,000/- ¤ ඩබ්. සිසිර සේනාරත්න මහතා - මහපල්ලෙගම - රු.1,000/- ¤ ඉන්ද්‍රානි හෙට්ටිආරච්චි මහත්මිය - අත්තනගල්ල රු.1,000/- ¤ අනුරා ජයකොඩි මහත්මිය - නිට්ටඹුව - රු.1,000/- ¤ ශ්‍යාමල් බණ්ඩාර මහතා-කුරුණෑගල - රු. 1,000/- ¤ ඊ.ඇලිස් ද සිල්වා මහත්මිය - ජාඇල -රු.1,000/- ¤ එච්.පී. විජේරත්න මහතා-කිරුලපන - රු.1,000/- ¤ ඉන්ද්‍රානි විශාකා ජයසිංහ මහත්මිය- බොරලැස්ගමුව - රු. 1,000/- ¤ දයානි බමුණුසිංහ මහත්මිය - යාගොඩ - රු.1,000/- ¤ පද්මා වික්‍රමසිංහ මහත්මිය - මාදිවෙල - රු. 1,000/- ¤ සුමනා ලියනගේ මහත්මිය - හෝකන්දර දකුණ - රු. 1,000/- ¤ මංජුල ප්‍රසාද් ජයවර්ධන මහතා - කන්තලේ - රු. 1,000/- ¤ කේ. අමරතිලක මහත්මිය - මහරගම - රු.1,000/- ¤ ශෙවන්ති සමරරත්න මහත්මිය - රත්මලාන - රු.1,000/- ¤ චමිලා නයෝමි රාජපක්ෂ මෙනවිය - කඩවත - රු.1,000/- ¤ එස්.ජී.ඒ. සිසිලිනා හාමිනේ - කන්තලේ - රු.1,000/- ¤ මධුභානි කළුවැව මහත්මිය - මාලබේ - රු.1,000/- ¤ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය - රු.1,000/- ¤ එච්. එම්. ඩිංගිරි බණ්ඩා මහතා - උඩුබැද්දාව - රු.1,000/- ¤ නදීෂා හර්ෂණී ලියනගේ මෙනෙවිය - කලුබෝවිල - රු.1,000/- ¤ එරංග ලියනගේ මහතා සහ බිසන්තිකා ගුණසේකර මහත්මිය - කලුබෝවිල - රු.1,000/- ¤ අශ්වින් චාමර මහතා, නදීරා මහේෂි ලියනගේ මහත්මිය සහ දිසුලි අයන්සා දියණිය - කලුබෝවිල - රු.1,000/- ¤ රංජිත් වික්‍රමසිංහ මහතා, පද්මාවතී වික්‍රමසිංහ මහත්මිය - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා - මහරගම, ඉසුරු සම්පත් මහතා, ලාල් කෝට්ටේගොඩ මහතා, සිරිල් කෝට්ටේගොඩ මහතා - කළුතර, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, චන්දිම ගුණදාස මහතා - මොරටුව, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, සුභාෂිණී අබේරත්න මහත්මිය - වත්තල, ශ්‍රී රංජිත් සිංහ මහතා - කැළණිය, යමුනා උඩුමලගල මහත්මිය - පිලියන්දල, නිමල් අත්තනායක මහතා - වැල්ලම්පිටිය, ඩබ්.ඒ.එල්.කේ. සමරසිංහ මහත්මිය, තිළිණ දේවින්ද මුණසිංහ මහතා - ගම්පහ, පුබුදු ශ්‍යාමික මහතා - නිට්ටඹුව, ප්‍රියංකා ඕපාත මහත්මිය - පන්නිපිටිය, රේණුකා ගුණරත්න මහත්මිය, චතුරිකා ගුණරත්න මහත්මිය, කේ.ආර්. චාන්දනී මහත්මිය - ගොතටුව - රු.10,700/- ¤ එකතු වූ සියලු මුදල් පරිත්‍යාග- රු. 141,725/- ¤ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ¤ අනෙකුත් වියදම් - 16,240/- ¤ සම්පූර්ණ වියදම - රු. 248,740/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්‍ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

**සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,**

**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ,**
**අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව,**
**දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ**
**අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද**
**නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත**
**බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනයඃ webmaster@helabodhupiyuma.net දු.අං:- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සෑම පුන් පොහෝ දිනකම සහ සෑම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගයඃ නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.

# අද අපි...

කලිසම ඉනට තද කර කර පටිය බැඳ
බලි කර කයම නෙක නෙක සළු පිළිද හැඳ
මැලිකම නිසා යහනට ගෙන සිරුරු කඳ
ගිලිනට බලයි රස මසවුළු කයට සොඳ

බිම් කඩ වටකරන් උස් වැට කඩොළු තනා
කම් ඵල නොමැති ලෙස සිතමින් සුවය මැනා
පෙම් කර ලොබින් මතුවට පින් නොකර මනා
නිම් නැති අහස් මාලිග මැද නැහෙති දනා

විස උල්පත් පිටින් කුඹුරට ඇද දාලා
පසටත් හොරෙන් සරු පොළවද වනසාලා
ගසටත් නොකිය මල් ගෙඩි කොළ උදුරාලා
රසවත් පොළොව අද අපටම විස වීලා

පුරන් වෙන්න ඉඩ හැර වැව් කුඹුරු ටික
අරන් පිට රටින් මාලිග පිඹුරු නෙක
කරන්නට ගිහින් උන් හා එකට එක
තුරන්ව ගොස් ඇත හෙළ වැඩ මෙසිරි ලක

බෙලි මල් පොල් පලා ඉරමුසු අහක දමා
කෙළිලොල් කමට පිට ඔපයට කරති පෙමා
රැලි වැටෙනකල් හංකඩ දහඩියද තෙමා
ගුලි ගිල ගිලා ඇවිදිති වැඩ නොකර නිමා

කැලේ තියෙන විස නැති ගොටු කොළ දල්ලේ
බලේ නොදැක නොරටෙහි පිටි ගුලි ගිල්ලේ
අලේ බගින විට ගෙයි මිදුලක මුල්ලේ
මොළේ නැති එවුන් බේකන්වල එල්ලේ


අතේ තුට්ටුවක් නැති බව ලොවට කියා
ගතේ රුසිරු රැකුමට සල් පිලට ගියා
හිතේ සිහින මාලිග ටික පොතක ලියා
බතේ ලුණු නැතිව වැළපෙයි කෙතට නොයා


පෙර දිග මුතු ඇටය එ දවස සසිරි රට
හර නැති කුණු කඳුන් ඇත අද හතර වට
අරගත නොහැකි නම් පෙර තිබු දහමෙ පොට
ජරමර පමණි දිගටම කුණු ගොඩක සිට

පබැඳුම - හිහිඟදු චන්දන සිරිවර්ධන



# උපාය දන්නෝ අපායෙ නොවැටෙති





උපාය නම් හේතුව වෙයි ගොඩ නැඟෙන
අපාය නම් එහි ඵලයයි යන රැඟෙන
පපා හිටියොතින් සුවයක් ලෙස හැඟෙන
එපා වෙන විටදී දැන් බැහැ එල නොගෙන

අය වෙන අරුත ගෙන දෙයි එකතුවක් ගැන
වැය වෙන විටදී විසිරෙයි දිය බිඳක් මෙන
කියවෙන උපායෙන් දිවියට යමක් ගෙන
බිය වෙන අපායෙන් පැන ගනු දුකක් දෙන

ලොව ඇති උපා කෙටි කලකට වුවත් හොඳ
අවරට යන විටදී ඉන් කිසි ඵලක් වෙද
භව දුක නසන නැණ උපමා වෙතොත් ලද
සුව සෙත සදයි මතුවට එන දුකත් බිඳ

අති දුලබ වූ දම් කඳ ඇති විට යහතින්
බැති උපදවා ගෙන ගත යුතුමය මොහොතින්
සිතිවිලිවලට වහලෙක් වන විට මහතින්
ඇති වෙයි අපා උපතක් පිහිටිය පහතින්

මිහිපිට ඇති අපායෙන් පැන ගොඩ යන්න
පිහිටකි උපායන් පෙර මුනිවරු දුන්න
බහිනට පෙරදී වැඩකට නොම වරදින්න
සිහියට ගෙන උපායන් දොස දුරලන්න

දිවමන් පැරණි කියමන් මේ ලෙසට එන
ඔවදන් දෙවයි සසරෙහි බිය හැඳින ගෙන
නුවණින් මෙහෙයවා මෙහි ඇති අරුත දැන
නිවනින් නිවෙන්වා දුක් කඳ දුරුම වන

පබැඳුම - නිහිඟු චන්දන සිරිවර්ධන

නිහිඟු චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල විහාර පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී